# සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්

## සියලු දෙනා ඉන්ධන ශක්තියෙන් බලගන්වමින්



වාර්ෂික වාර්තාව 2019

# අන්තර්ගතය


## ආයතනික දළ විශ්ලේෂණය

01 දැක්ම හා මෙහෙවර
02 අප ගැන
05 කාර්ය සාධන විශේෂ අවස්ථා - 2019
06 සම්මාන හා ප්‍රදානයන්

## අපේ නායකත්වය

08 සභාපතිතුමාගේ සහ කළමණාකාර අධ්‍යක්ෂවරයාගේ පණිවිඩය
10 අධ්‍යක්ෂ මණ්ඩලය
14 කළමණාකාරණ කණ්ඩායම

## කළමණාකරණ සාකච්ඡා හා විග්‍රහය

19 මූල්‍ය ප්‍රාග්ධනය
23 නිශ්පාදිත ප්‍රාග්ධනය
26 මානව ප්‍රාග්ධනය
31 ස්වභාවික ප්‍රාග්ධනය

## පාලනය හා අනුකූලතාවය

34 ආයතනික පාලනය
43 අවදානම් කළමණාකරණය
50 අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
52 විගණන හා කළමණාකරණ වාර්තාව

## මූල්‍ය තොරතුරු

55 විගණාධිපති වාර්තාව
61 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
62 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
63 ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය
64 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
65 මූල්‍ය ප්‍රකාශන වලට සටහන්
93 විස්තරාත්මක ආදායම් ප්‍රකාශය
94 වසර පහක මූල්‍ය සාරාංශය

වසර පහක මූල්‍ය සාරාංශය

# දැක්ම

දකුණු ආසියාවේ වඩාත්ම කාර්යක්ෂම තෙල්
ක්‍රියාකරවුම් පර්යන්තය බවට පත්වීම.

# මෙහෙවර

පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් ඉටු කරමින් දිවයිනේ වඩාත්ම
කාර්යක්ෂම සහ ක්‍රියාකාරී සේවාවන් පවත්වා ගැනීමටත්, පාරිභෝගික
අවශ්‍යතා සපුරාලමින් සපයන්නා වූ ඛණිජ තෙල් නිෂ්පාදන ධාරිතාවේ
ගුණාත්මකභාවය සහතික කරමින්, අඛණ්ඩව වර්ධනයකින් යුතු
පාරිභෝගිකයා තෘප්තිමත් කරන්නා වූ සේවයක් සැලසීමටත්, කැපවීමටත්,
මහජන හා පාරිභෝගිකයින්ගේ ප්‍රතිචාර හා මාර්ගෝපදේශකත්වය මත
පදනම් වූ පරිසරයට ගෞරවය දක්වමින් හා එහි ප්‍රමිතීන් සුරකිමින්,
නීතිගරුක තෘප්තිමත් මනා පුහුණුවක් හා කැපවීමකින් යුත්,
ශ්‍රම බලකායේ සහභාගිත්වය ලබාදීමත්, අපගේ මෙහෙවරය.



# අප ගැන

## සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල් ලිමිටඩ්

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල් ලිමිටඩ් 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාරික ආයතන පොදු සමාගම්වලට හැරවීමේ පනතේ 2 (1) වගන්තිය ප්‍රකාරව විධිමත් ලෙස සංස්ථාපනය කරන ලද සමාගමක් වන අතර, එයට 2003 ඔක්තෝබර් 13 දිනැති අංක 1310/8 දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ වඩාත් පූර්ණ ලෙස විස්තර කර ඇති තෙල් පර්යන්ත, ගබඩා පහසුකම්, නළ මාර්ග සහ ඉන්ධන ප්‍රවාහන වාහන යනාදියෙන් සමන්විත පොදු භාවිත පහසුකම්වල අයිතිය ඇත.

අපි ශ්‍රී ලංකාවේ ඛණිජ තෙල් නිෂ්පාදන හැසිරවීම සඳහා වූ උසස් තත්ත්වයේ යටිතල පහසුකම්වලින් සමන්විත ඛණිජ තෙල් තොග ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ නියුක්ත සමාගමක් වන්නෙමු. තරඟකාරී සහ යහපත් ලෙස ඉන්ධන ගබඩා කිරීම හා බෙදාහැරීම ගොඩ නැගීම තුළින් ශ්‍රී ලංකා සංවර්ධන ගමන්මඟට සහයවීම සඳහා අපගේ බැඳීම පෙන්වා දෙමින් අපගේ පාර්ශ්වකාර වටිනාකම් කොටස අඛණ්ඩව ශක්තිමත් කරමින් සිටින්නෙමු.

මෙම සමාගම එහි ප්‍රාග්ධන කොටසින් 2/3 ක් අයත් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන අතර, ඉතිරිය ලංකා ඉන්දියන් තෙල් සමාගමට අයත් වේ. බලශක්ති ක්ෂේත්‍රය තුළ නව්‍යකරණය වෙමින් සහ පාරිසරික තිරසාරත්වය සහතික කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට කොටස්කරුවෙක් වීමට මව් සමාගමේ ආසන්න වශයෙන් දශක හයක අත්දැකීම සහ පළපුරුද්ද තුළින් සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල් ලිමිටඩ් ප්‍රතිලාභ ලබයි.

රටේ සිල්ලර පාරිභෝගිකයින්ගේ සහ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ සම්බන්ධ විවිධ කාර්මික අංශයන් හී තොග පාරිභෝගිකයින් විශාල සංඛ්‍යාවකගේ බලශක්ති ඉල්ලුම සපුරාලීම ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට සහ ලංකා ඉන්දියන් තෙල් සමාගමට අයත් දිවයින පුරා පිහිටි ඉන්ධන පිරවුම්හල් දහසකට පමණ අපි සේවය කරන්නෙමු. මේ සඳහා සමාගමේ විවිධ කටයුතුවල ක්‍රියාකාරී ලෙස සහභාගිවන 3000ක පමණවන සේවකයින් සමගින් ගබඩා කිරීමේ, බෙදාහැරීම් ජාලයේ නියුක්ත තොග ගබඩා 11ක් ප්‍රධාන පර්යන්ත දෙකට සහය වේ.



## ප්‍රධාන පර්යන්තයන්

- කොලොන්නාව නිමාව හා මුතුරාජවෙල පර්යන්තය

## තොග ගබඩා

- අනුරාධපුර
- කොටගල
- මඩකලපුව
- මාතර
- හපුතලේ
- සරසවි උයන
- බදුල්ල
- කුරුණෑගල
- ගාල්ල
- පේරාදෙණිය
- කන්කසන්තුරෙයි

කොලොන්නාව නිමාව පෙට්‍රෝලියම් නිෂ්පාදන 12ක් මෙහෙයවන අතර, මුතුරාජවෙල පර්යන්තය පෙට්‍රෝලියම් නිෂ්පාදන 5ක් මෙහෙයවයි.

කොලොන්නාව හා මුතුරාජවෙල ප්‍රධාන පර්යන්තයන් දෙක මෙහෙයවීම මගින් ලංකා ඛණිජ තෙල් සංස්ථාව සහ ඉන්දියන් තෙල් සමාගම යන අලෙවිකරණ සමාගම් වෙනුවෙන් පෙට්‍රෝලියම් නිෂ්පාදන බෙදාහැරීම සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල් ලිමිටඩ් හි බෙදාහැරීමේ කාර්යාංශය මගින් සිදු කරන අතර, දිවයින පුරා පෙට්‍රෝලියම් නිෂ්පාදන බෙදාහැරීම ශක්තිමත් කරයි. CPSTL විසින් බාහිර තොග ගබඩා 11ක් සහ එක් අභ්‍යන්තර දුම්රිය ගබඩාවක් මෙහෙයවමින් සිටී. මෙවැනි ස්ථානවලට සහ අභ්‍යන්තර දුම්රිය ගබඩාව වෙත නිෂ්පාදන නැවත පිරවීම CPSTL සහ ප්‍රධාන පර්යන්තයන්හී කුලියට ගත් මාර්ග බවුසර් භාවිතයෙන් සහ කොලොන්නාව නිමාව තුළ පිහිටි දුම්රිය බොගී තුළින් සිදුවේ. ගුවන්යානා ඉන්ධන කොලොන්නාවේ නිමාවේ පමණක් ගබඩා කරන අතර, රත්මලාන සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව මගින් ක්‍රියාත්මක කරන අනෙකුත් ගුවන් පහසුකම් සඳහා මහා මාර්ග මගින් ඉන්ධන අවශ්‍යතා ලබා ගනු ලැබේ. දෛනික පදනමක් මත කටුනායක බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපලට මාරු කරනු ලැබේ. සල්ප අඩු දැවි තෙල් මුතුරාජවෙල පර්යන්තයෙහි පමණක් ගබඩා කරන අතර, විශේෂ නළ මාර්ගයක් තුළින් කෙරවලපිටිය බලශක්ති පිරියතට මාරු කරනු ලැබේ.



කොලොන්නාවේ නිමාවට පිරිපහදුවෙන් සහ කොළඹ වරායේ ඩොල්ෆින් ජැටියේදී මුදාහරින ආනයනික තෙල් නැව් තුළින් නිෂ්පාදන ලැබේ. මුතුරාජවෙල පර්යන්තය වෙත කෙරවලපිටිය තීරය සිට ආසන්න වශයෙන් කිමී 6ක් දුර පිහිටි SPBM තුළින් ආනයනික කාර්ගෝ පමණක් ලැබේ.



ඔටෝමෝටිව් ඉන්ධන ගබඩාව

මෙට්රික් ටොන් 450,000ක් පමණ වන ආනයන සහ පිරිපහදු විවිධ වර්ගයේ පෙට්‍රෝලියම් නිෂ්පාදන කොලොන්නාව සහ මුතුරාජවෙල සහ දිවයින පුරා ගබඩාවල අපි තැන්පත් කරමු.

ප්‍රධාන බෙදාහැරීම් මාර්ගය මාර්ග ටැන්කර් වන අතර, එය දිවයින පුරා පෙට්‍රෝලියම් නිෂ්පාදන ප්‍රවාහනයෙන් 66%කට ආසන්නව දායක වේ.



මාර්ග ටැන්කර්

**ඔටෝමෝටිව් ඉන්ධන බෙදාහැරීම**

වර්තමානයේ දිවයින පුරා මෙරට ඔටෝමෝටිඩ් පෙට්‍රෝලියම් නිෂ්පාදනවලින් 85%ක් අපි බෙදා හරින්නෙමු.



දුම්රිය වැගන්

දෙවන ප්‍රධාන බෙදාහැරීම් මාර්ගය වන්නේ දුම්රිය වැගන් ප්‍රවාහනය වන අතර, එය දිවයින පුරා පෙට්‍රෝලියම් නිෂ්පාදන ප්‍රවාහනයෙන් 30%කට ආසන්නව දායක වේ.

අනෙක් බෙදාහැරීමේ මාර්ගය නළ මාර්ග මාරුකිරීම් වන අතර, එය ප්‍රධාන වශයෙන් කැලණි තිස්ස සහ කෙරවලපිටිය සහ සපුග ස්කන්ද පිරිපහදුව සඳහාය.



නළ මාර්ග


කන්කසන්තුරේ තොග ගබඩාව
පර්යන්තය
තොග ගබඩාව
අනුරාධපුර තොග ගබඩාව
මඩකලපුව තොග ගබඩාව
කුරුණෑගල තොග ගබඩාව
මුතුරාජවෙල පර්යන්තය
පේරාදෙනිය තොග ගබඩාව
සරසවි උයන තොග ගබඩාව
කොලොන්නාව පර්යන්තය
බදුල්ල තොග ගබඩාව
කොටගල තොග ගබඩාව
හපුතලේ තොග ගබඩාව
ගාල්ල තොග ගබඩාව
මාතර තොග ගබඩාව

# කාර්යසාධන වැදගත් අවස්ථා

| | | | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|---|---|
| මූල්‍ය ප්‍රාග්ධනය | **ක්‍රමෝපායික ප්‍රමුඛතාවය : මූල්‍ය වර්ධනය** | | | | | | |
| | ආදායම | ශ්‍රීලංරු (මි) | 15,340 | 13,130 | 14,176 | 12,663 | 11,687 |
| | මෙහෙයුම් ලාභය | ශ්‍රීලංරු (මි) | 2,605 | 1,405 | 3,208 | 2,406 | 1,917 |
| | බදු පෙර ලාභය/අලාභය | ශ්‍රීලංරු (මි) | 2,928 | 1,522 | 3,273 | 2,330 | 1,716 |
| | බදු පසු ලාභය/අලාභය | ශ්‍රීලංරු (මි) | 1,668 | 254 | 2,717 | 1,949 | 1,407 |
| | ස්කන්ධය මත ඉපයීම | % | 6% | 1% | 11% | 9% | 7% |
| | **මූල්‍ය ස්ථාවරත්වය** | | | | | | |
| | මුළු වත්කම් | ශ්‍රීලංරු (මි) | 32,205 | 30,322 | 29,991 | 28,059 | 27,270 |
| | මුළු වගකීම් | ශ්‍රීලංරු (මි) | 5,997 | 5,556 | 4,828 | 5,208 | 5,881 |
| | කොටස්හිමි අරමුදල | ශ්‍රීලංරු (මි) | 26,209 | 24,766 | 25,163 | 22,851 | 21,389 |
| | මුදල් හා මුදලට සමාන දෑ | ශ්‍රීලංරු (මි) | 3,999 | 3,149 | 1,474 | 2,455 | 748 |
| | **කොටස්හිමියන්ගේ තොරතුරු** | | | | | | |
| | කොටසක ඉපයීම | ශ්‍රීලංරු | 2.35 | 0.26 | 3.73 | 2.32 | 1.83 |
| | කොටසක ලාභාංශය (ගෙවූ) | ශ්‍රීලංරු | 0.30 | 0.868 | 0.54 | 0.65 | - |
| | කොටසක ශුද්ධ වත්කම් අගය | ශ්‍රීලංරු | 35 | 33 | 33 | 30 | 29 |
| නිෂ්පාදිත ප්‍රාග්ධනය | ආර්ථික අගය එකතු කිරීම | ශ්‍රීලංරු (මි) | 2,778 | 1,613 | 3,616 | 1479 | 1084 |
| | **ක්‍රමෝපායික ප්‍රමුඛතාව මෙහෙයුම් අනර්ඝත්වය** | | | | | | |
| | **දේපල, පිරියත හා උපකරණ** | | | | | | |
| | පර්යන්ත සහ ගබඩා | ගණන | 13 | 13 | 14 | 14 | 14 |
| | ප්‍රාග්ධන වියදම | ශ්‍රීලංරු | 981 | 375 | 833 | 913 | 224 |
| මානව ප්‍රාග්ධනය | **ක්‍රමෝපායික ප්‍රමුඛතාවය සේවකයින් තුළ ආයෝජනය** | | | | | | |
| | මුළු සේවකයින් | ගණන | 2,856 | 2,932 | 3,045 | 3,118 | 2,964 |
| | කාන්තා නියෝජනය | ගණන | 326 | 334 | 343 | 351 | 338 |
| | සේවකයින්ට ගෙවීම් | ශ්‍රීලංරු (මි) | 6,636 | 6,853 | 5,570 | 5,782 | 5,307 |
| | සේවක බෙදීම් අනුපාතය | % | 5% | 6% | 1% | 1% | 1% |
| | පුහුණු සඳහා ආයෝජනය | ශ්‍රීලංරු (මි) | 17 | 22 | 32 | 30 | 27 |
| | මුළු පුහුණු පැයගණන | පැය | 9706 | 12609 | 21,832 | 26,088 | 17,928 |
| | සාමාන්‍ය පුහුණු පැය/සේවකයා | පැය | 5 | 7 | 9 | 11 | 9 |
| | සේවකයෙකුට ආදායම | ශ්‍රීලංරු (මි) | 5.37 | 4.48 | 4.67 | 4.06 | 3.93 |
| සමාජ සම්බන්ධතා ප්‍රාග්ධනය | සේවකයෙකුට ශුද්ධ ලාභය (අලාභය) | ශ්‍රීලංරු (මි) | 0.58 | 0.09 | 0.9 | 0.63 | 0.47 |
| | අනියම් සේවකයින් (ආසන්න වශයෙන්) | ගණන | 71 | 63 | 105 | 114 | 121 |
| | පාරිභෝගික ස්පර්ශක ස්ථාන | ගණන | 40 | 40 | 40 | 40 | 40 |
| | ආයතනික සමාජීය වගකීම් තුළ ආයෝජනය | ශ්‍රීලංරු (මි) | 3.8 | 2.1 | 6.1 | 5.7 | 16.8 |
| | ප්‍රතිලාභීන් ගණන (ආසන්න වශයෙන්) | ගණන | 8800 | 8700 | 8,500 | 7,000 | 12,000 |
| ස්වාභාවික ප්‍රාග්ධනය | රජයට දායකත්වය | ශ්‍රීලංරු (මි) | 2,441 | 2,579 | 2,175 | 1,895 | 1,303 |
| | **ක්‍රමෝපායික ප්‍රමුඛතාව තිරසාරත්වය** | | | | | | |
| | බලශක්ති පරිභෝජනය | කි.වොට් | 3,268,177 | 3,286,631 | 2,904,300 | 2,914,112 | 2,942,078 |
| | ජල පරිභෝජනය | කි.ලී | 299 | 333 | 276 | 270 | 249 |

# වසර දෙස බැල්මක්




## විකුණුම් පරිමාව 5,466,569 කි.ලී.




## බදු පසු ලාභය












## මේ දක්වා ඉහළම ආදායම 15 ශ්‍රීලංරුබි

## වත්කම් පදනම

## 30.97 ශ්‍රීලංරුබි

## 1.77 ශ්‍රීලංරුබි












# සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂගේ පණිවිඩය

හිතවත් පාර්ශ්වකරුවනි, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හී වාර්ෂික වාර්තාවේ වැදගත් සිදුවීම් සහ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම මට සතුටකි. 2020 පෙබරවාරි මාගේ වගකීම් මා භාර ගනු ලැබූවත්, නව සභාපති ලෙස 2019 වසරේ ප්‍රධාන වැදගත් සිදුවීම් සඳහන් කිරීමට ලැබීම පිළිබඳ මම සතුටු වෙමි. මෙම වසර පාස්කු ඉරිදා ත්‍රස්තවාදී ප්‍රහාරවලින් පසු ඇති වූ "අර්බුදකාරී වසරක" වුවද, ජාතික ආර්ථිකය සඳහා දිගුකාලීන අනාගත කටයුතු මතු බලාපොරොත්තු සහිතව පවතිනු ඇතැයි අපි විශ්වාස කරමු.



### මෙහෙයුම් පරිසරය

ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනය විශේෂයෙන් පාස්කු ඉරිදා ප්‍රහාරය ප්‍රධාන ආර්ථික කටයුතුවල වර්ධනයට බාධාකාරී වූ අතර එය දේශීය ආර්ථිකයට තර්ජනයක් ලෙස 2018 දී 3.3 ප්‍රතිශතයක් වූ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය 2019 වසරේදී 2.3 ප්‍රතිශතයක මධ්‍යස්ථයක් දක්වා පහත හෙළීමට හේතු විය. රටතුළ දශකයට වැඩි සාමකාමී පරිසරය ප්‍රහාරය තුළින් කම්පනයට පත් කරන ලද අතර, එය සේවා අංශයට විශේෂයෙන්ම සම්බන්ධ අනෙකුත් ප්‍රධාන ආර්ථික කටයුතුවලට ඉදිරි සහ පසුගාමී සම්බන්ධතා බොහොමයක් සහිත සංචාරක ක්ෂේත්‍රය මූලිකවම සහමුලින්ම යටපත් කරන ලදී.

වසරේ දෙවැනි අර්ධය තුළ පැවති අහිතකර කාලගුණික තත්ත්වයන් සමඟ වසරේ අවසන් භාගය තුළ ජනාධිපතිවරණ වටපිටාව තුළ දේශපාලනික පරිසරයේ අවිනිශ්චිතතාවය පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසු ආර්ථිකය පහත වැටීමට එකසමානව බලපාන ලදී.

### අපගේ කාර්යසාධනය

සමාලෝචිත වසර තුළ ආර්ථිකයේ ප්‍රධාන පසුබැසීම් තුළ, CPSTL 17%ක වර්ධනයක් වාර්තා කරමින් 2018 වසරේ පැවති රු.බි. 13ට සාපේක්ෂව 2019 වසරේදී රු.බි. 15ක ආදායමක් අප සමාගමට අත්කරගන්නා ලදී. වර්තමානයේ ඛණිජ තෙල් නිෂ්පාදන වර්ගීකරණ 17 ක භාරකරු ලෙස අපි කටයුතු කරමින් සිටිමු. එක් එක් නිෂ්පාදන වර්ගය වර්ධනයට දායක වන අතර, ලංකා ඔටෝ ඩීසල් කි. ලීටර් 2,199,065කින් ප්‍රධාන දායකයා බවට පත්ව ඇති අතර, එය මුළු ප්‍රමාණයෙන් 39%ක් නියෝජනය කරයි. ලංකා පෙට්‍රල් 92 ඔක්ටේන් කි. ලීටර් 1,543,464 කින් දෙවැනි විශාලතම දායකයා වූ අතර, එය 2019 වසර තුළ 26%කින් දායක වී ඇත.

වසර මුළුල්ලේ රට තුළ පැවති අයහපත් කාලගුණය හේතු කොට ගෙන, ලංකා ඉන්ධන තෙල් සුපිරි කි.ලී. 151,283ක් සහ ලංකා ඉන්ධන තෙල් 1500 කි.ලී. 245,498ක සැලකියයුතු ප්‍රමාණයන් අපි මෙහෙයවා ඇත. ආර්ථිකය වෙත පාස්කු ඉරිදා ප්‍රහාරවල බලපෑම JET A1 නිෂ්පාදනය තුළ කි.ලී. 588,707 සිට 555,437 දක්වා විකුණුම් පහත වැටීම මගින් පෙන්නුම් කෙරේ.




2019 වසර තුළ නිමකළ ප්‍රධාන ව්‍යාපෘති නිෂ්පාදන ප්‍රවාහ කාර්යක්ෂමතාව සහ ටැංකි ධාරිතා වැඩි කිරීම අනුව සමාගමේ සමස්ථ කාර්යසාධනය කරා උපකාරී වී ඇති බව සඳහන් කිරීම වැදගත්ය. කොලොන්නාව ස්ථාපනය තුළ ඝණ මීටර් 15,000 තෙල් ගබඩාවක් ඉදිකිරීම නිෂ්පාදන මෙහෙයුම් වැඩි කිරීමට හේතු විය.



අපගේ පක්ෂපාතී, තරඟකාරී සහ මනාව පුහුණුවලත් ශ්‍රමබලකාය සමඟ කොළඹ වරායේ සිට කොලොන්නාව ස්ථාපනය දක්වා නිම් නිෂ්පාදන බාධා රහිතව ප්‍රවාහනය කිරීමට ඉඩදෙමින් 12" නළමාර්ග නවීකරණ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට අපට හැකි විය.

එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රමාද කුලී පිරිවැය අඩුකිරීමට ප්‍රධාන දායකයා බවට පත් වෙමින්, කොළඹ වරායේ සිට කොලොන්නාව ස්ථාපනය දක්වා මාරු කරන ලද නිෂ්පාදන ප්‍රමාණය 2018 වසරට සාපේක්ෂව ලීටර් මිලියන 141ක වැඩි වීමක් පෙන්වන ලදී.

ප්‍රධාන පර්යන්තය හා ඩිපෝ අතර ප්‍රවාහන රටාවේ මුසුව තුළ කාර්යසාධනය අනුව, ප්‍රවාහනය කරන ලද ප්‍රමාණයෙන් 60%ක් පුද්ගලික බව්සර් නියෝජනය කරන අතර, දුම්රිය වැගන් මුළු තොග ප්‍රවාහන ලැබීම් ප්‍රමාණයෙන් 30%ක් පමණ ප්‍රවාහනය කර ඇත. CPSTL අයත් බවුසර් මගින් මුළු තොග ප්‍රවාහන ලැබීම් ප්‍රමාණයෙන් 6%කට ආසන්න වශයෙන් ප්‍රවාහනය කර ඇත. ඉදිරි වසරේදී, දුම්රිය වැගන් මගින් අපගේ ලැබීම් ක්‍රියාවලිය තවදුරටත් වැඩි කිරීමට සහ ප්‍රවාහන අලාභය 50%කින් අඩුකිරීමට අපේක්ෂා කරන අතර, එය අපගේ ලාභය සැලකියයුතු ලෙස වර්ධනය කරනු ඇත.



**අනාගත දැක්ම**

පුරෝකථනය කළ ද්‍රවශීලතා තත්ත්වය යහපත් වන අතරම, ඉදිරියේදී ගනු ලබන සක්‍රීය පියවර ශක්තිමත් ශේෂ පත්‍රයක් පවත්වා ගැනීමට සහ පහසු සහ කඩිනම් අයකරගැනීමේ මාවතක් ඇති කිරීමට හැකියාව ලබා දෙන බව සමාගමේ මතය වේ. වේගයෙන් වෙනස්වන පරිනාමීය වාතාවරණය තුළ, අපගේ මෙහෙයුම්වල බලපෑම් අඛණ්ඩව නියාමනය කිරීමට සහ හැකි තරම් පහසු ලෙස ව්‍යාපාරය ඉදිරියට ගමන් කරන බව සහතික කිරීමට අපි ක්‍රියාමාර්ග අරගනිමු.

මේ සම්බන්ධයෙන් අපගේ ප්‍රධාන ප්‍රමුඛතාවය වන්නේ තොග ගබඩා සහ පර්යන්ත දෙකෙහි අපගේ ශ්‍රමබලකායේ ආරක්ෂාව සහතික කිරීමයි. රජය විසින් නිකුත් කරන ලද සියලුම මාර්ගෝපදේශ මෙන්ම ජාත්‍යන්තර මනා පරිචයන් සමාගම ඇගයීමට ලක්කර ඇති අතර, මේ මත පදනම් වී, සේවකයින්, අමුත්තන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සඳහා සේවය කිරීමේ සුදුසු වැඩපිළිවෙල සහ ආරක්ෂිත තත්ත්වයන් සහතික කිරීමට පුද්ගල සෞඛ්‍ය සහ ආරක්ෂක මාර්ගෝපදේශ සංවර්ධනය කර ඇත. කෙටි කාලයේ සිට මැදි කාලය දක්වා අප මුහුණ දෙන මෙම පෙරනොවුටුවීරූ කාලය හමුවේ, මෙම අභියෝග ජයගැනීම සඳහා අපගේ හැකියාව පිළිබඳ අප විශ්වාසයෙන් සිටින අතර, සියලුම පාර්ශ්වකරුවන් සමඟ සමීපව කටයුතු කිරීමට සහ ශ්‍රී ලංකාව තුළ බාධාරහිත පෙට්‍රෝලියම් බෙදාහැරීම සහතික කිරීමට අපි කැපවී සිටිමු.

මෙම වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා පැවති සුළු ප්‍රමාදය නිසා, 2021 වසර සඳහාද දැනටමත් පෙළ ගස්වා ඇති කටයුතු පිළිබඳ සටහනක් තබමි.

ජයග්‍රාහී සැලසුමක් සමඟ ත්‍රිකුණාමලයේ ටැංකි අංගනය මෙහෙයුම් බවට පත් කිරීම සඳහා අපි මහත් පරිශ්‍රමයක් දරමින් සිටින අතර, ත්‍රිකුණාමලයේ අංගනය නොමැතිව මාස දෙකක් හෝ තුනක් දක්වා අවශ්‍ය තොග පවත්වාගෙන යා හැකි පරිදි දැනට පවත්නා ටැංකි අංගනය වැඩි කිරීම සඳහා සැලසුම් ක්‍රියාත්මකව පවතී.

කොලොන්නාව තුළ වසර තුනක කාලයක් තුළ 50%කින් (මෙට්‍රික් ටොන්100,000) ධාරිතාව වැඩි කිරීමට කටයුතු ආරම්භ කර ඇත. පෙට්‍රෝලියම් පර්යන්ත ජනතාකරණය කරන ලද අවස්ථාවේ සිට එතරම් විශාලත්වයක ධාරිතා වර්ධනයක් සලකා බලන ලද පළමු අවස්ථාව එයයි.

නළමාර්ග නවීකරණය සහ අළුතින් එලීම සම්බන්ධයෙන් අපි සැලසුම් කරමින් සිටින අතර, එය විගණන වාර්තාවෙන් ඉස්මතු කරන ලද ඉහළ අවදානම් සාධක ලෙස ඉලක්ක කරන ලදී.

එමෙන්ම, තවදුරටත් දුම්රිය බොගී යොදා ගැනීම සහ පසු විපරම් (දෙවරක් ප්‍රවාහනය කිරීම) අවම කිරීම මගින් ප්‍රවාහන පිරිවැය අවම කිරීම සඳහා පියවර කිහිපයක් අපි ගෙන ඇත.

**පිළිගැනීම**

අවසාන වශයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලයේ මගේ සගයින් වෙත ඔවුන්ගේ වටිනා මඟ පෙන්වීම සහ අඛණ්ඩ සහයෝගය වෙනුවෙන් ස්තූතිය පුද කිරීමට මම මෙය අවස්ථාව කරගනිමි. එමෙන්ම, අපගේ කළමනාකරණ කණ්ඩායම සහ කාර්ය මණ්ඩලය වෙත ඔවුන්ගේ වෙහෙස නොබලා සිදුකරන ලද උත්සාහය, කැපවීම සහ ඉදිරියට යාම වෙනුවෙන් මාගේ දැඩි අගය කිරීම ප්‍රකාශ කිරීමට මම කැමැත්තෙමි. ගරු ප්‍රවාහන, විදුලි හා බලශක්ති අමාත්‍ය, මහින්ද අමරවීර මැතිතුමා සහ ගරු බලශක්ති පිළිබඳ රාජ්‍ය ඇමති, රෝහිත අබේගුණවර්ධන මැතිතුමා විසින් සිදුකරන ලද අමිල දායකත්වය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සහ මා විසින් අපගේ අගය කිරීම ප්‍රකාශ කරන අතර, ඔවුන්ගේ අනාගත කටයුතු සාර්ථක වේවායි ප්‍රාර්ථනය කරන්නෙමු. අවසාන වශයෙන් අපගේ ප්‍රධාන ගනුදෙනුකරුවන්, ප්‍රවාහන ක්‍රියාකරුවන්, ව්‍යාපෘති කොන්ත්‍රාත්කරුවන් සහ කොටස්හිමියන් ඇතුළු සියලුම පාර්ශ්වකරුවන්ට ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය වෙනුවෙන් මාගේ අවංක අගය කිරීම ප්‍රකාශ කර සිටිමි.



**එම්.යූ. මොහමඩ්**
**සභාපති හා කළමනාකරණ අධ්‍යක්ෂ**

# අධ්‍යක්ෂ මණ්ඩලය



01



02



03



05



06



07



04

## 01 එම්.උවයිස් මොහමඩ් මහතා

**සභාපති හා කළමනාකරණ අධ්‍යක්‍ෂ**

සේවකයින් හොඳින් පුහුණු කරන්න. එවිට ඔවුන්ට ප්‍රමාණවත් පරිදි ඉඩහැරීමට හා සැලකීමට හැකිය. - රිචර්ඩ් බ්‍රැන්සන්.

මොහමඩ් උවයිස් මොහමඩ් මහතා ඔහුගේ ශ්‍රමබලකායේ හැකියාවන් කෙරෙහි ශක්තිමත්ව විශ්වාස කරන්නෙක් වන අතර, ඵලදායී ආකාරයෙන් ඉදිරියට යාම සඳහා ඇති එක මාර්ගය එක්වීම සහ එකමුතුව බව ලෙස ඔහු විශ්වාස කරයි.

මෑත කාලය තුළ CPSTL හි තරුණ සභාපතිවරයා ලෙස, දැනට පවත්නා වසංගතය තුළ උවයිස් මහතා විසින් සාර්ථකව ක්‍රියාත්මක කරන ලද නව්‍යකරණ ව්‍යාපාර අදහස් සහ විසඳුම් සමඟ ඉදිරියට යමින් උපායශීලී සේවක දක්ෂතා ඔහු ඔප්පු කර ඇත.

වර්තමානයේ ඔහු බලශක්ති අමාත්‍යංශයේ ව්‍යවසාය සම්පත් සැලසුම්කරණය සඳහා සභාපතිවරයා ලෙස ද සේවය කරයි. එමෙන්ම, ඔහු ජාතික ආධුනික හා කාර්මික පුහුණු අධිකාරියේ (NAITA) අධ්‍යක්‍ෂවරයෙක් ලෙස ද සේවය කර ඇත.

ඔහුට දශක දෙකක පමණ කාලයක් තුල ප්‍රවාහන, ERP, බලශක්ති යනාදීය ඇතුළුව විවිධ ක්ෂේත්‍රයන් තුළ නියැලෙමින් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ පළපුරුද්දක් ඇත. ඔහුගේ සේවා පළපුරුද්ද සහ දැනුම යුරෝපය සහ දකුණු ආසියාවේ අනෙකුත් කොටස් ඇතුළුව ලොව විවිධ කලාපයන් හී විහිදේ.

ඔහු ලංඩන් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී (ගෞරව) උපාධිය සමත් අතර, වේල්සයේ විශ්ව විද්‍යාලයේ MBA උපාධිය සමත්ව ඇත.

වසර ගණනාවක් පුරා, තොරතුරු තාක්ෂණය හා ගිණුම්කරණය ඇතුළු ඔහු ලැදියාවක් දක්වන ක්ෂේත්‍රවල විවිධ කාර්මික වෘත්තීය සුදුසුකම් සහ සහතිකපත් ඔහු ලබාගෙන ඇත. ඔහුගේ විශේෂ ලැදියාව වන්නේ ව්‍යවසාය වට්ටමින් ආයතනික ERP ක්‍රමය ක්‍රියාත්මක කිරීමයි.

බලශක්ති ක්ෂේත්‍රය සඳහා ඔහුගේ දැක්ම වනුයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම තුළ දක්වා ඇති ප්‍රතිපත්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට උත්සාහ කිරීමයි.

.

## 02 බුද්ධික මඩිහහේවා මහතා

**අධ්‍යක්‍ෂ**

බුද්ධික මඩිහහේවා මහතා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්‍ෂ වේ. වසර 25කට අධික සේවා පළපුරුද්ද, කළමනාකරණ සහ වරලත් කළමනාකරණ ආදි වෘත්තිය නිපුණතාවයන් සහ රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්හි ඉහළ කළමනාකාරීත්වයේ පළපුරුද්ද ඔහු සතුය.

ඔහු එක්සත් රාජධානියේ අලෙවිකරණය පිළිබඳ වරලත් ආයතනයේ (MCIM), සාමාජිකයෙක් මෙන්ම, එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ආයතනයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකුද වේ.

# අධ්‍යක්ෂ මණ්ඩලය

තවද, ඔහු එක්සත් රාජධානියේ  ව්‍යාපාරික විධායක නිලධාරීන්ගේ සංගමයේ (FABE) ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු ද, ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනයේ (IMSL) සාමාජිකයෙක් මෙන්ම අලෙවිකරණය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ (MSLIM) සහතිකලත් සාමාජිකයෙක් ද වේ.

ඔහු 2020 ජනවාරි සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කරන ලදී. ඔහු 2008 වසරේ සිට 2015 වසර දක්වා කාලසීමාව තුළ ලංකා පොහොර සමාගමේ සභාපති ලෙස සේවය කර ඇත. ඔහු තෘතීක හා වෘත්තීය කොමිෂන් සභාවේ (TVEC) හිටපු සාමාජිකවරයෙක් වන මොහු ලංකා ගල්අඟුරු සමාගමේ ද, ලංකා නැව්මාර්ග සමාගමේ ද සහ වරාය සේවා සමාගමේ ද අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කර ඇත. තවද ස්වර්ණකැලුම් සමූහ සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ලෙස සහ ඒපීඑම්එස් හොල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හී කළමනාකාර අධ්‍යක්ෂ ලෙස ද සේවය කර ඇත.

## 03 ඊ.ඒ. රත්නසීල මහතා

**අධ්‍යක්ෂ**

වෘත්තියෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 පන්තියේ නිලධාරියෙක් වන, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ඊ.ඒ. රත්නශීල මහතා එක්සත් ජනපදයේ මැසාසුචෙස්ට් හී විලියම් පාසලේ ප්‍රතිපත්ති ආර්ථිකයන් පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2007/2008 දි ලබාගෙන ඇත. ඔහු ඔහුගේ විද්‍යාවේදී උපාධිය රුහුණු විශ්ව විද්‍යාලයේදී 1992/1995 වසර තුළ ලබාගෙන ඇත. එමෙන්ම ඔහු 2002 දී කොළඹ විශ්ව විද්‍යාලය තුළ ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ ජපානයේ චීබා හී ආර්ථිකයන් පිළිබඳ IDE උසස් පාසලේ දී 2003/2004 සංවර්ධන ආර්ථිකයන් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සම්පූර්ණ කර ඇත.

ඊ.ඒ. රත්නශීල මහතා 2001 වසරේදී මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයෙක් ලෙස ඔහුගේ වෘත්තීය ආරම්භ කළ 2006 දක්වා සේවය කළ අතර, 2007 වසරේදී වෙළෙඳ හා තීරු බදු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක් ලෙස උසස් කරන ලද අතර 2010 දක්වා එහි සේවය කරන ලදී.

එමෙන්ම, 2011 වසරේ සිට 2013 වසර දක්වා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙසද, 2013 සිට 2016 වසර දක්වා ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙසද සේවය  කර ඇත. 2016 වසරේ සිට, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙක්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කරමින් සිටී.

ඊ.ඒ. රත්නශීල මහතා රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව, කාර්මික තාක්ෂණ ආයතනය, ජාතික පර්යේෂණ සභාව, ජාතික සංවර්ධන බැංකුව වැනි රාජ්‍ය ආයතන කිහිපයක් තුළ අධ්‍යක්ෂ මණ්ඩලවල අධ්‍යක්ෂවරයෙක් ලෙස මහා භාණ්ඩාගාරය නියෝජනය කර ඇති අතර, වර්තමානයේ ව්‍යාපාර කළමනාකරණ ජාතික පාසල සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව තුළ අධ්‍යක්ෂ මණ්ඩලවල අධ්‍යක්ෂවරයෙක් ලෙස සේවය කරයි.

## 04 මනෝජ් ගුප්තා මහතා

**අධ්‍යක්ෂ**

මනෝජ් ගුප්තා මහතා ජායිපූර් හී කීර්තිමත් NIT හි සිවිල් ඉංජිනේරු උපාධිධාරියෙක් වන අතර, ජායිපූර් හී පෝඩාර් කළමනාකරණ ආයතනයේ ශාස්ත්‍රපති උපාධිධරයෙකි. ගුප්තා මහතා 1993 දී ඉන්දියන් තෙල් සමාගම හා සම්බන්ධ වූ අතර, එතැන් සිට ගුවන් සහ සිල්ලර වෙළෙඳාම ඇතුළුව විවිධ පැවරුම් හී සේවය කර ඇත. හර්යානා රාජ්‍යයේ රාජ්‍ය මට්ටමේ සම්බන්ධීකාරකයෙක් ලෙස, සමස්ත රාජ්‍ය තුළ ඛණිජ තෙල් නිෂ්පාදන බාධා රහිතව සැපයීම පවත්වාගෙන යාමට අනෙකුත් තෙල් අලෙවිකරණ සමාගම් සහ රාජ්‍ය සමඟ සමීප සම්බන්ධීකරණය පවත්වා ගැනීම ඔහුගේ වගකීම විය.

පනිපාට් සහ කෝලකටා යන ඉතාම උපාය මාර්ගික හා ඉහළ ධාරිතාවේ ප්‍රාදේශිය කාර්යාල දෙකක් ඔහු මෙහෙයවා ඇත. ප්‍රදේශයේ ප්‍රධානියා වශයෙන්, තාක්ෂණය සහ යටිතල පහසුකම්වල වර්ධනය හා මාර්ග හවුල්කරුවන්ගේ හැකියාව ගොඩනැගීම තුළින් වඩාත් ශක්තිමත් සහ අභිප්‍රේරිත ශ්‍රමබලකායක් නිර්මාණය කිරීම කෙරෙහි ඔහු අවධානය යොමු කරන ලදී. සිල්ලර වෙළෙඳාම පිළිබඳ ගැඹුරු දැනුම සහ විචක්ෂණභාවය සමඟ, ඔහු කෝල්කටා වරාය භාරය සහ WBHIDCO (බටහිර බෙන්ගාල් නිවාස යටිතල සංවර්ධන සංස්ථාව) සමඟ සමීපව සහය වී ඇත. ඔහුගේ නායකත්වය යටතේ, රජයේ බොහෝ වැඩභූමි ප්‍රසම්පාදනය කරන ලද අතර, නවීන සිල්ලර වෙළෙඳසැල් සංවර්ධනය කරන ලදී.

ගුප්තා මහතා ජාත්‍යන්තර උපදේශකයින් සහිත ඉන්දියන් තෙල් සමාගම විසින් ක්‍රියාත්මක කීර්තිමත් සිල්ලර පරිනාම වැඩසටහනේ (Dhruva) ප්‍රධාන සාමාජිකයෙකි. ඔහු Dhruva ව්‍යාපෘතිය විසින් සිදුකරන FIT, SEVA, AWESUM, DARPAN' (වෙළෙඳුන්ගේ ලකුණු කාඩ්පත) වැඩසටහන නිර්මාණය සඳහා ප්‍රධාන නිර්මාණ ශිල්පියා විය. සමස්ථ ක්ෂේත්‍ර බලකාය/ප්‍රාදේශීය කාර්යාල නියාමනය ප්‍රධාන කාර්යාලයේ සිට මාර්ගගත නායක මණ්ඩලයක් මගින් සිදුකරන ලදී.

පිළිගත් වෘත්තීය ආයතන තුළින් වෙළෙඳුන්ගේ, කළමනාකරුවන්ගේ සහ ගනුදෙනුකාර සහයකයින්ගේ හැකියා ගොඩ නැගීම සහ සහභාගිත්වය ඔහු හඳුන්වා දෙන ලදී. ක්ෂේත්‍ර බලකායේ රැකියා දැනුම සහ සහභාගිත්වය වැඩි කිරීම සඳහා, ඔහු සතිපතා  මාර්ගගත ප්‍රශ්න හඳුන්වා දෙන ලද අතර එය සියලූම දෙනා විසින් හදවතින්ම පිළිගනු ලැබීය.

ගුප්තා මහතාගේ ඉහත උපායමාර්ගික වැඩසටහන සහ ජාලය/ ගනුදෙනුකාර කේන්ද්‍රීය ප්‍රවේශය Dhruva ව්‍යාපෘතිය යටතේ සංස්ථාවේ දැක්ම හා හැඟීම සහ සන්නාම ප්‍රතිරූපය වර්ධනය කෙරෙහි බොහෝ දුරට දායක වී ඇත. සහයෝගිතාව සාර්ථකත්වයේ මන්ත්‍රය බව ඔහු විශ්වාස කරයි.

# අධ්‍යක්ෂ මණ්ඩලය

## 05 ප්‍රමෝද් ජේන් මහතා

**අධ්‍යක්ෂ**

ඉන්ධන හා ගෑස් අංශයේ මූල්‍ය ක්ෂේත්‍රය, බදුකරණය හා වාණිජ අංශය පිළිබඳ ඉන්දියන් තෙල් සමාගමේ දශක දෙකකට අධික කාලයක් පුරා විවිධ සේවා පළපුරුද්ද ප්‍රමෝද් ජේන් සතු වේ. එමෙන්ම ඔහු අභ්‍යන්තර විගණනය, INDAS ක්‍රියාත්මක කිරීම, වංචා වැලැක්වීම සහ අභ්‍යන්තර පාලනය යනාදී විශේෂ පැවරුම් මෙහෙයවා ඇත. ආයතනයේ අපේක්ෂිත ක්‍රමෝපායන් අත්කර ගැනීම පිණිස මූල්‍ය පරමාර්ථ ව්‍යාපාර පරමාර්ථ සමඟ සහසම්බන්ධ කිරීමට මෙම පුළුල් පළපුරුද්ද ඔහුව ශක්තිමත් කර ඇත. ජ්‍යේෂ්ඨ උප සභාපති (මූල්‍ය) ලෙස, සමාගමේ සමස්ථ මූල්‍යමය කරුණු ඔහු පාලනය කරයි.

ඔහු ඉන්දියානු වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICAI), මෙන්ම ඉන්දියාවේ පිරිවැය සහ කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (ICMAI) සාමාජිකයෙක් වන අතර, දිල්හි විශ්ව විද්‍යාලයේ වාණිජවේදී (ගෞරව) උපාධිය ලබාගෙන ඇත. එමෙන්ම ඔහු තොරතුරු පද්ධති විගණනය (DISA) පිළිබඳ ඩිප්ලෝමාව සාර්ථකව අවසන් කර ඇති අතර, එය ICAI (ඉන්දියානු වරලත් ගණකාධිකාරී ආයතනය) විසින් අනුග්‍රහය දක්වන තොරතුරු තාක්ෂණ විගණන වෘත්තිකයින් සඳහා වෘත්තීමය සහතික කිරීමකි.

ඉන්දීය තෙල් සමාගම තුළ ඔහුගේ උත්සාහය තුළ, විවිධ මට්ටම්වල අලෙවිකරණ මූල්‍ය, ඍජු සහ වක්‍ර බදුකරණය, අභ්‍යන්තර විගණනය, SAP ERP පද්ධති යනාදිය වැනි විවිධ මූල්‍ය ක්ෂේත්‍රයන් හී පළපුරුද්ද ඔහු ලබාගෙන ඇත. එමෙන්ම ජේන් මහතා ලංකා පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හී අධ්‍යක්ෂවරයෙක් මෙන්ම එම සමාගමේ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙකු ද වේ.

## 06 සුරාජ් පට්නෙයික් මහතා

**අධ්‍යක්ෂ**

සුරාජ් කුමාර් පට්නෙයික් මහතාට ඛණිජ තෙල් ක්ෂේත්‍රය තුල වසර 25කට වැඩි පළපුරුද්ද ඇති අතර, දැනට ඔහු ලංකා ඉන්දියන් තෙල් සමාගමේ ජ්‍යේෂ්ඨ උප සභාපති (මෙහෙයුම්, ආනයන හා බන්කර් අලෙවි) ද වේ. ඔහු 1994 දී කළමනාකරණ අභ්‍යාසලාභියෙක් ලෙස ඉන්දියන් තෙල් සමාගමට බැඳී ඇති අතර, එතැන් සිට නාවික කටයුතු මෙහෙයුම්, සැපයුම් දාම කළමනාකරණය මෙන්ම ඉන්දියන් තෙල් සමාගමේ විවිධ ඉන්ධන පර්යන්තයන්හී සේවය කර ඇත. කොල්කටා හි ඔහුගේ කාලසීමාව තුළ, පට්නෙයික් මහතා නේපාලය සහ භූතානය මෙන්ම ගිනිකොණ ඉන්දියාවේ බොහෝ ඈත ස්ථානකරා ඛණිජ තෙල් නිෂ්පාදන සැපයීම සහ බෙදාහැරීම පාලනය කර ඇත. වර්තමානයේ ඔහු ලංකා ඉන්දියන් තෙල් සමාගම පීඑල්සී හි ඉන්ධන සැපයීම් ව්‍යාපාරය පුළුල් කරමින් සිටී.

පට්නෙයික් මහතා මුම්බායි හී නාවික කටයුතු පිළිබඳ කීර්තිමත් නරෝටම් මොරාර්ජී හි ජ්‍යේෂ්ඨ සාමාජිකයෙක් ද වේ. CPSTL හී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් ලෙස, පට්නෙයික් මහතා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ගැනීම තවදුරටත් වඩා සඵල කිරීම සඳහා ඉන්ධන පර්යන්ත මෙහෙයුම් සහ නාවික කටයුතු මෙහෙයුම් පිළිබඳ ඔහුගේ අප්‍රමාණ පළපුරුද්ද ලබා දේ.

## 07 තරිඳු එච් වික්‍රමසිංහ මහතා

**අධ්‍යක්ෂ**

වෘත්තියෙන් නීතිඥයෙක් වන, වික්‍රමසිංහ මහතා කොළඹ රාජකීය විදුහලේදී අධ්‍යාපනය ලබා ඇත. ඔහු සිවිල් සහ වාණිජමය නීතිකරණයට විශේෂ වන අතර, ඔහුගේ ව්‍යාවහාරය තුළ ඉහළ මට්ටමේ බුද්ධිමය දේපල කරුණු කිහිපයක් මෙහෙයවා ඇත. ඔහුට දෙවන පෙළ ගෞරව සමාර්ථයක් සහිතව බටහිර ලංඩන් විශ්ව විද්‍යාලයෙන් නීතිය (බුද්ධිමය දේපල) පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. වෝල්වර්හැම්ප්ටන් විශ්ව විද්‍යාලයෙන් ඔහුගේ නීති උපාධිය ඔහු ලබාගෙන ඇති අතර, ජාත්‍යන්තර අධ්‍යයන සඳහා බණ්ඩාරනායක මධ්‍යස්ථානයෙන් ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ ඉහළ ඩිප්ලෝමාව ඔහු ලබාගෙන ඇත. වික්‍රමසිංහ මහතා ජාත්‍යන්තර සමුළු කිහිපයක දී ශ්‍රී ලංකාව නියෝජනය කර ඇත. එමෙන්ම ඔහු පුද්ගලික සමාගම් කිහිපයක අධ්‍යක්ෂවරයෙකු ද වේ.

# කළමනාකරණ කණ්ඩායම



1



2



3



5



6



7



9



10



11


4


8


12

| | |
|---|---|
| 01 | **පී.ඩී.පී. ධර්මවංශ මහතා** |
| | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත් හා පරිපාලනය |
| 02 | **ඕ.පී. කග්ගොඩආරච්චි මහතා** |
| | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී |
| 03 | **ජේ.ඒ.යු.ආර්.කේ. ජයලත් මහතා** |
| | වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය |
| 04 | **පී.එම්.ඒ. බණ්ඩාර මහතා** |
| | වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ඉංජිනේරු සහ සහය සේවා |
| 05 | **එම්.එස්.එම්. නියාස් මහතා** |
| | වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් |
| 06 | **ඩී.ආර්.එෆ්. ඩයස් මහතා** |
| | වැඩබලන ප්‍රධාන තොරතුරු නිලධාරී |
| 07 | **සන්ධ්‍යා වික්‍රමාරච්චි මහත්මිය** |
| | ගබඩා කළමනාකරු |
| 08 | **එල්.ඩබ්ලිව්.ගුණසේකර මහතා** |
| | ප්‍රධාන නීති නිලධාරී |
| 09 | **ඩී.ඒ.ජේ.එස්. ධර්මප්‍රිය මහතා** |
| | කළමනාකරු<br>මෝටර් රථ කළමනාකරු |
| 10 | **අජිත් විජේසූරිය මහතා** |
| | පාරිශ්‍ර හා ඉංජිනේරු සේවා |
| 11 | **ටී.වී. සරත්චන්ද්‍ර මහතා** |
| | මෙහෙයුම් කළමනාකරු - තොග ගමනාගමන හා තොග පිරිසැකසුම් |
| 12 | **එන්. ජයවර්ධන මහතා** |
| | ආරක්ෂක කළමනාකරු |

# කළමනාකරණ කණ්ඩායම



13



14



15



17



18



19



21



22



23


16


20


24

| | |
|---|---|
| 13 | එස්.එන්. ගමගේ මහත්මිය |
| | කළමනාකරු<br>ආයතනික කටයුතු |
| 14 | කේ.එම්.එන්.ඒ.සී. පෙරේරා මහතා |
| | කළමනාකරු<br>මානව සම්පත් |
| 15 | ආර්.එස්.එස්. ප්‍රේමකුමාර මහතා |
| | කළමනාකරු<br>ප්‍රසම්පාදනය |
| 16 | ඩබ්ලිව්.එම්.ටී.ඩබ්ලිව්.ඒ. බණ්ඩාර මහතා |
| | කළමනාකරු<br>බෙදාහැරීම් |
| 17 | ආර්.ඒ.පී.ඒ. රණසිංහ මහතා |
| | මෙහෙයුම් කළමනාකරු<br>අක්වෙරළ මෙහෙයුම් |
| 18 | ටී.ඒ.ආර්.ඩී. බණ්ඩාර මහතා |
| | කළමනාකරු - පුහුණු හා මානව සම්පත් සංවර්ධන |
| 19 | ආර්. සුසිරිවර්ධන මහත්මිය |
| | වෛද්‍ය නිලධාරී |
| 20 | බී. ජයකොඩි මහත්මිය |
| | කළමනාකරු - තොරතුරු පද්ධති |
| 21 | ආර්.එම්.එන්. ජයතිලක මහතා |
| | වැඩබලන කළමනාකරු<br>විමර්ශන |
| 22 | පී.එම්.සී. ඩයස් මහතා |
| | වැඩබලන කළමනාකරු<br>ගිනි හා ආරක්ෂාව |
| 23 | කේ.එච්.එම්. ජයසේකර මහතා |
| | වැඩබලන කළමනාකරු<br>අභ්‍යන්තර විගණනය |
| 24 | ජී.එච්.එන්.එම්. චන්ද්‍රසිරි මහතා |
| | නියෝජ්‍ය කළමනාකරු<br>රසායනාගාරය |

# කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

# මූල්‍ය ප්‍රාග්ධනය




### මූල්‍යමය වැදගත් සිදුවීම්

ඛණිජ තෙල් නිෂ්පාදන කර්මාන්තය තුළ අඛණ්ඩව පවත්නා වෙළෙඳපොල කොන්දේසිවල විවිධ අභියෝග හමුවේ පසුගිය වසර කිහිපය සඳහා ඉහළම ආදායම වන රුපියල් බිලියන 15ක් සහ බිලියන 1.7ක බදු පසු ලාභයක් වාර්තා කරමින් වසර තුළ හිතකර කාර්යසාධනයක් වාර්තා කිරීමට ලැබීම පිළිබඳ අපි සතුටු වෙමු.

### ආදායම සහ ලාභදායිතාව

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල් ලිමිටඩ් හි ආදායම ප්‍රධාන ආදායම සහ ප්‍රවාහන ආදායම තුළින් උපයනු ලබන අතර, ප්‍රධාන ආදායම 2019 වසර තුළ මුළු ආදායමෙන් 81%ක් වාර්තා කළ ප්‍රධාන ආදායම් මූලාශ්‍රය වේ.

සමාගමේ මුළු ආදායම රු.බි. 15ක් වූ අතර එය 2018 වසරට සාපේක්ෂව 17%ක වැඩිවීමකි. 2019 අප්‍රේල් සිට ප්‍රධාන ආදායම් අනුපාතය තුළ වැඩිවීම සහ 2018ට සාපේක්ෂව 29%ක වැඩිවීමක් වන රු.බි. 6.7ක දළ ලාභය මෙයට ප්‍රධාන වශයෙන් දායක විය.

ආදායම හා දළ ලාභ ආන්තික ප්‍රවනතාව (රු.මි.)







2019 වසර තුළ දළ ලාභ ආන්තිකය 44%ක් ලෙස වැඩි වූ අතර එය 2018 දී 40%ක් විය. එම හේතුව නිසාම, ශුද්ධ ලාභ ආන්තිකය 2019 සහ 2018 වසර තුළ පිළිවෙලින් 12%ක් සහ 2%ක් විය.

### බදු පෙර ලාභය

ආදායම තුළ වැඩිවීම මගින් සමාගම රු.බි. 2.9ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇති අතර, එය පසුගිය මූල්‍ය වසර පහ සඳහා ඉහළම වාර්තා කිරීම වේ.

# මූල්‍ය ප්‍රාග්ධනය

### බදු පසු ලාභය හා වෙනත් විස්තීර්ණ ආදායම

2019 වසර සඳහා ඉහළ ආදායම සහ ලාභදායිතාව තුළ වුවත්, වසර සඳහා බදුමුදල රුපියල් මිලියන 1,162ක් වූ අතර එය පසුගිය වසරට සාපේක්ෂව 12%කින් අඩුවිය. 2018 වසරට සාපේක්ෂව 2019 වසර සඳහා විලම්භිත බදු අයකිරීම තුළ අඩුවීම එයට හේතුව විය.

සමාගමේ වෙනත් විස්තීර්ණ ආදායම (OCI) ප්‍රධාන වශයෙන් නිර්ණය කළ ප්‍රතිලාභ බැඳීම මත ආයුගණක අලාභයෙන් සමන්විත වේ.

බදුපෙර හා බදු පසු ලාභ (රු.මි.)




### මෙහෙයුම් කාර්යසාධනය

වසර තුළ වෙනත් ආදායම් රුපියල් මිලියන 148 දක්වා 21%කින් වැඩි වී ඇති අතර, ඒ සඳහා සේවක ණය මත පොළීය තුළ වැඩිවීම සහ දිගුකාලීන හිඟ ණයහිමි ශේෂ කපාහැරීම හේතු විය. පරිපාලන වියදම් රුපියල් මිලියන 4,937 දක්වා පෙර වසරට සාපේක්ෂව 9%කින් වැඩි වී ඇත. මෙහෙයුම් මට්ටමේදී, සමාගමේ මෙහෙයුම් ලාභය පෙර වසරේ පැවති රු.මි. 1,404 ට සාපේක්ෂව මෙම වසර තුළ රු.මි. 2,605 දක්වා 85%කින් වැඩි වී ඇත.

මෙහෙයුම් කාර්යසාධනය




### මූල්‍ය තත්ත්වය

### මුළු වත්කම්




මුළු වත්කම් වර්ධනය (රු.මි.)




ශේෂ පත්‍රය වඩාත් ජංගම නොවන වත්කම් කරා වන අතර, එය මුළු වත්කම්වලින් 50%ක් විය. ජංගම වත්කම්වලින් බහුතරය වෙළෙඳ සහ අනෙකුත් ලැබීම් විය.

මුළු වත්කම් පදනම 2018 වසරේ පැවති රු.බි. 30.3 ට සාපේක්ෂව වසර අවසානයේදී රු.බි.32.2 දක්වා 2019 දී 6%කින් වැඩි විය. 2018 වසර තුළ ආදායම තුළ වැඩිවීමට අනුව මුදල් හා මුදලට සමාන දෑ සහ වෙළෙඳ සහ අනෙකුත් ලැබීම්වල වැඩිවීම මේ සඳහා හේතු විය. මුදල් තත්ත්වය ශක්තිමත් වූ අතර, පෙර වසරේ පැවති රු.බි.3.1කට සාපේක්ෂව රු.බි. 3.9 දක්වා 27%ක වර්ධනයක් පෙන්නුම් කරමින් වසර අවසානයේදී කෙටි කාලීන ආයෝජනවල වැඩිවීම එයට ප්‍රධාන වශයෙන් හේතු විය.

# මූල්‍ය ප්‍රාග්ධනය

ජංගම වත්කම් අනුපාතය සහ ක්ෂණික වත්කම් අනුපාතය යන අනුපාත දෙකම වසර අවසානයේදී 6.55 ක් හා 6.25ක් විය.

**වර්තන/ක්ෂණික වත්කම් අනුපාතය (වාර)**




### වත්කම් පිරිවැටුම් අනුපාතය

වත්කම් පිරිවැටුම් අනුපාතය මගින් විකුණුම් උත්පාදනය කිරීමට සමාගමේ වත්කම් භාවිතයේ කාර්යක්ෂමතාව මනිනු ලබයි. මුළු වත්කම් පෙර වසරට සාපේක්ෂව 2019 දී 6%කින් වැඩි වූ අතර ආදායම 17%කින් වැඩි විය. එබැවින් වත්කම් පිරිවැටුම් අනුපාතය 2019 දී 49%ක් වූ අතර 2018 දී එය 44%ක් විය.

.

**වත්කම් පිරිවැටුම් අනුපාතය**




### ස්කන්ධය හා වගකීම්

CPSTL සමාගමේ වත්කම්වලින් 81%ක් සඳහා අරමුදල් ලබාදෙමින් රු.බි.26.2ක කොටස්හිමිකාර අරමුදල්වලින් මානව ප්‍රාග්ධනය කෙරේ. සමාගම 2016 දී සියලුම ණය ගෙවා දමන අතර, මෙම වසරේ දී නව ණය ලබා ගෙන නොමැත. CPSTL හි මුළු වගකීම 2018 දී පැවති රු.බි. 5.5 සිට රු.බි.5.9 දක්වා වැඩි විය. ඒ සඳහා පසුගිය වසරට සාපේක්ෂව ලාභදායිතාව තුළ වැඩිවීම මගින් සහය වූ ආදායම් බදු වගකීම තුළ වැඩිවීම හේතු විය.

### ස්කන්ධය මත ඉපයීම

ස්කන්ධය මත ඉපයීම පෙර වසරේ 1%ට සාපේක්ෂව 7% දක්වා වැඩි වී ඇත. ඉදිරියට විහැන්වීම ප්‍රධාන වශයෙන් 2018 දී ලාභදායිතාව තුළ වැඩිවීම හේතු විය.

**ස්කන්ධය මත ඉපයීම %**




### මුදල් ප්‍රවාහ උත්පාදනය

ලාභදායිතාව තුළ වැඩිවීම හමුවේවුවත්, මෙහෙයුම් කාර්යයන්ගෙන් උත්පාදිත ශුද්ධ මුදල් පෙර වසරේ රු.බි. 2.50 සාපේක්ෂව 2019 වසරේදී රු.බි. 1.6 දක්වා අඩුවිය. 2019 දී වැඩි වූ ආදායමට අනුව අනෙකුත් මූල්‍ය වත්කම්වල වැඩිවීම, වෙළෙඳ හා අනෙකුත් ගෙවීම් නිරවුල් කිරීම තුළ වැඩිවීම සහ වෙළෙඳ හා අනෙකුත් ගෙවීම්වල වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු විය. ආයෝජන කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් පිටවයාම

සැලකියයුතු ලෙස වැඩි වූ අතර, ඒ සඳහා දේපල, පිරියත හා උපකරණවල ආයෝජනය 2019 දී රු.බි. 6.5 හේතු විය. ඉහත සාධකවල ප්‍රතිවිපාකයක් ලෙස. 2019 වසර තුළ උත්පාදිත ශුද්ධ මුදල් රු.මි. 851 දක්වා වැඩි වූ අතර 2018 දී එය රු.මි. 1.66ක් විය.

| | 2019 | 2018 |
|---|---|---|
| කොටසකට ඉපයීම් (රු) | 2.35 | 0.26 |
| කොටසකට ශුද්ධ වත්කම් අගය (රු.) | 35 | 33 |

කොටසකට ඉපයීම් 2019 දී 2.35ක් වූ අතර එය 2019 දී 0.36ක් විය. කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම සමාලෝචිත වසර තුළ වාර 33 සිට වාර 35 දක්වා වැඩි විය.



# මූල්‍ය ප්‍රාග්ධනය







### තෝලන හා ප්‍රාග්ධන ව්‍යුහය

සමාගමේ වත්කමෙන් 81%ක් ස්කන්ධ ප්‍රාග්ධනය තුළින් යොදවා ඇති අතර ඉතිරි 19% දිගුකාලීන සහ කෙටි කාලීන ණයවලින් අරමුදල් සපයන ලදී. පහත වගුවල පෙන්වා දී ඇති පරිදි, ස්කන්ධ ප්‍රාග්ධනයෙන් දායකත්වය 2018 වසරට සාපේක්ෂව 2019 තුළ සැලකියයුතු ලෙස වැඩි වී ඇත. 2018 වසරට සාපේක්ෂව ලාභවල වැඩිවීම සහ කොටසක ලාභාංශය වැඩිවීම හේතු විය.






# නිෂ්පාදිත ප්‍රාග්ධනය




2019 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ නමුත් සම්පූර්ණ නොකළ ව්‍යාපෘති

**මුතුරාජවෙල යටිතල පහසුකම් සංවර්ධනය**

අමතර ධාරිතාව හඳුන්වාදීමේ ව්‍යාපෘතියට සමගාමීව, CPSTL මුතුරාජවෙල පර්යන්තයේ යටිතල පහසුකම් වර්ධනය කිරීමට තීරණය කරන ලදී.

මුතුරාජවෙල පර්යන්තය යනු අර්ධ-ස්වයංක්‍රිය පර්යන්තයක් වන අතර, CPSTL හි කොලොන්නාව නිමාව සහ අනෙකුත් තොග ගබඩාවලට සාපේක්ෂව කාර්යක්ෂමතාව සහ ඵලදායිතාවය අනුව වාසි කීහිපයක් ඇත. පිරවුම් ගැන්ට්‍රිවල සියලුම වරායන් මැදිරි 10 මාර්ග ටැන්කර්ස් පිරවීමට හැකියාව ඇති අතර මාර්ග ටෑංකරයක් පිරවීමේ කාලය අනෙකුත් පර්යන්තවලට සාපේක්ෂව ඉතා අඩුය. ඊට අමතරව, SPBM -02 හි ගොඩබාන නිෂ්පාදන වරාය ගාස්තුවලට යටත් නොවී මුතුරාජවෙල පර්යන්තයට සෘජුවම මාරු කෙරේ. තවත් සැලකියයුතු වාසියක් වන්නේ පර්යන්තය පිහිටා ඇත්තේ පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ වන අතර, එය 2019 වසර වන විට ක්‍රියාත්මක නොවීය. පිටත වටරවුම් අධිවේගී මාර්ගය කොළඹින් ආරම්භවන සියලුම අධිවේගී මාර්ග සම්බන්ධ කරන අතර අවම මෙහෙයුම් පිරිවැයකින් මුතුරාජවෙල පර්යන්තයට දිවයිනේ ඕනෑම කොටසකට ලඟාවීමට ඉඩ ලබා දේ. භූගෝලීය ස්ථානගතවීමේ මෙම ක්‍රමෝපායික වාසිය මුතුරාජවෙල පර්යන්තයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මගින් ප්‍රශස්ථ කිරීමට අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතිය "දකුණු ආසියාවේ වඩාත්ම කාර්යක්ෂම තෙල් ක්‍රියාකරවුම් පර්යන්තය බවට පත්වීම" යන CPSTL හි දැක්ම සමඟ මනාව ස්ථානගත කෙරේ. ව්‍යාපෘතිය තුළ අවධානිත ප්‍රධාන සංවර්ධනය වන්නේ ගබඩා ගොඩනැගිල්ල පුළුල් කිරීම, නව වැඩමුළු සංකීර්ණය ඉදිකිරීම සහ පර්යන්තයේ ප්‍රධාන පිවිසීම නවීකරණය කිරීමයි. එකී ව්‍යාපෘතිය සඳහා CPSTL හි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර, වාස්තු විද්‍යාත්මක සැලැස්ම 2019 දී අවසන් කෙරේ. වාස්තු විද්‍යාත්මක සැලැස්ම යටතේ ප්‍රතිශෝධිත යෝජනාව ක්‍රියාත්මක කිරීමට පෙර කළමනාකරණය විසින් සමාලෝචනය යටතේ පවතී.



මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ, කඩිනම් බෙදාහැරීම් කාලයක් සමඟ දිවයිනේ ඕනෑම කොටසකට ලඟාවීමේ තරඟකාරී වාසිය CPSTL ලබා ගනී.

# නිෂ්පාදිත ප්‍රාග්ධනය

## මුතුරාජවෙල පර්යන්තයේ ටැංකි අංක 6, 7 සහ 8 සඳහා අභ්‍යන්තර පාවෙන වහල සැලසුම් කිරීම, සැපයීම සහ ස්ථාපනය

ආයතනික දැක්ම සහ මෙහෙවරට අනුකූලව යමින්, පර්යන්ත මෙහෙයුම්වල කාර්යක්ෂමතාව වර්ධනය කිරීම කෙරෙහි CPSTL අඛණ්ඩව උත්සාහ දරයි. වාෂ්පීකරණය හේතුකොට ගෙන ඇතිවන අලාභ ඛණිජතෙල් නිෂ්පාදන මෙහෙයවීම තුළ CPSTL විසින් මුහුණපාන බරපතල ගැටළුවකි. වාෂ්පීකරණය යනු ආර්ථික අලාභයක් පමණක්ම නොව පාරිසරික දූෂණයක් ද වේ. CPSTL, ආයතනික වගකීම් සහගත පුරවැසියෙක් ලෙස, කළමනාකාරිත්වයේ අවධානය වාෂ්පීකරණ අලාභ අවම කිරීම සම්බන්ධයෙන් වර්ධනය කර ඇත.

අභ්‍යන්තර පාවෙන වහල ස්ථාපනය ස්ථිර බුම්බුලාකාර වහල ටැංකි මත වාෂ්පීකරණය අඩුකිරීම සඳහා ඇමෙරිකානු ඛණිජතෙල් ආයතනය (API) විසින් නිර්දේශිත ක්‍රමයකි. අභ්‍යන්තර පාවෙන වහල ගෑස් වාෂ්පවීම නියාමනය කිරීමට සැලසුම් කරන අතර ආරක්ෂිත ආකාරයකින් පරිසරය තුළට වායුව වාෂ්පවීම සඳහා ඉඩ ලබා දේ. ස්ථිර වහල ගබඩාකිරීමේ ටැංකි ඇතුළත ස්ථාපිත කරන මෙම වහල ආර්ථිකමය වශයෙන් ලාභදායී විකල්පයක් ද වේ. අභ්‍යන්තර පාවෙන වහල මගින් ද්‍රව මතුපිට විශාල කොටසක් ආවරණය කරන අතර ඵලදායි මුද්‍රාවක් තුළින් විමෝචනය 98% දක්වා අඩුකළ හැක.

මුතුරාජවෙල පර්යන්තයේ වැල්ඩින් කල වානේ, සිරස් පෙට්‍රල් ගබඩා ටැංකිවල ස්ථිර බුම්බුලාකාර වහල තුන (03) වාෂ්පීකරණ අලාභ අඩු කිරීමට අභ්‍යන්තර පාවෙන වහල ස්ථාපනය සඳහා තෝරාගෙන ඇත. අභ්‍යන්තර පාවෙන වහල ස්ථාපනය සඳහා මුළු ආයෝජනය රුපියල් මිලියන 70කි. යෝජිත සංවර්ධනය යටතේ ටැංකි අංක 06 සහ 07 නවීකරණයක් සහ අභ්‍යන්තර පාවෙන වහල ස්ථාපනය සම්පූර්ණ කෙරේ. මෙම ටැංකි දෙක ආරම්භකර දැන් සාර්ථකව ක්‍රියාත්මක වේ. ටැංකි අංක 08 හි අභ්‍යන්තර පාවෙන වහල ස්ථාපනය ක්‍රියාත්මක වන අතර, මෙම ව්‍යාපෘතිය 2019 මූල්‍ය වර්ෂය අවසානය වන විට 80%ක සමස්ත ප්‍රගතියක් වාර්තා කර ඇත. මෙම ව්‍යාපාතිය ක්‍රියාත්මක කිරීම මගින්, ඛණිජ තෙල් නිෂ්පාදන නාස්තිය අවම කිරීම පමණක් නොව මෙම අලංකාර දිවයිනේ අපගේ අගනා පරිසරය සුරක්ෂිත කිරීමට දායකවෙමින් සහ අපගේ කීර්තිනාමය ප්‍රදර්ශනය කරන බව CPSTL විශ්වාස කරයි.



## කොලොන්නාව අංක 04 ටැංකිය අළුත්වැඩියා කිරීම

ගබඩා ටැංකිවල සම්පූර්ණත්වය පවත්වා ගැනීම CPSTL හි මූලික පරමාර්ථයකි. ටැංකිවල තත්ත්වය සහ මෙහෙයුම් යෝග්‍යතාව ඛණිජතෙල් කර්මාන්තයේ ප්‍රමිති අනුව විධිමත් පරීක්ෂණ පවත්වමින් CPSTL විසින් නියාමනය කර ඇගයීමට ලක් කෙරේ. ගබඩා කිරීමේ ටැංකි නඩත්තුව ඒ අනුව උපලේඛනගත කෙරේ. අංක 04 ටැංකිය අළුත්වැඩියා කිරීම මෙම හඳුනාගැනීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස සැලසුම් කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය අංක 04 ටැංකියේ වහලය අළුත්වැඩියා කිරීම සඳහා ක්‍රියාත්මක කරයි. වහලය දිරායාම සහ වහලයෙන් ජලය කාන්දුවීම හේතු කොට ගෙන නිෂ්පාදන දූෂණය වීම වැලැක්වීමට අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදුකරයි. නිෂ්පාදන තත්ත්ව සහතිකය සහ ටැංකියේ සම්පූර්ණත්වය ව්‍යාපෘතිය සාර්ථකව සම්පූර්ණ කිරීම මගින් අත්කර ගනු ලබන ප්‍රධාන අරමුණු වේ. මුළු ආයෝජනය රු. බි. 36 කී. මලබැඳීම සංවර්ධනය වීම වැලැක්වීම පිණිස අති විශාල මෙට්‍රික් ටොන් 12,500 ගබඩා ටැංකියේ සම්පූර්ණ වහල ව්‍යුහය වැලි බදාම කිරීම සහ පින්තාරු කිරීම 2019 මූල්‍ය වර්ෂය අවසානයේදී සම්පූර්ණ කරන ලදී. වහලේ තහඩු පිරිවිතර අනුව සහ ඉහත භූමියේ පෙට්‍රෝලියම් ගබඩා ටැංකි පරිදි විශේෂයෙන් නිෂ්පාදනය කරන ලදී. එම තහඩු නිෂ්පාදනය හා නැව්ගත කිරීම භාර ගනු ලැබුවේ එක්සත් ජනපදයේ එම් ඒ ස්ටීල් විසිනි. තහඩු නිෂ්පාදනය බෙල්පියමේ කර්මාන්ත ශාලාව තුළ API 653 පිරිවිතරවලට අනුකූලව සිදු කරනු ලබයි. එම තහඩු බෙල්පියමේ කර්මාන්ත ශාලාවේ සිට සාර්ථකව පිටත් කොට යවන ලද අතර මුළු වැඩවලින් 40% මූල්‍ය වසර අවසානය වන විට සම්පූර්ණ කෙරේ.





# නිෂ්පාදිත ප්‍රාග්ධනය

**කොලොන්නාව නිමාවේ කලාප 6 හි නළ පද්ධතිය උසස් කිරීම**

රටතුළ ඉන්ධන සඳහා ඉල්ලුමේ වාර්ෂික වර්ධනය සපුරාලීම සඳහා දොඹකරවල පිරවුම් ධාරිතාව වැඩිකිරීමට CPSTL තීරණය කර ඇත. මෙම පරමාර්ථය යටතේ පෙට්‍රල් පිරවුම් ධාරිතාව වැඩි කිරීමට සැලසුම් කෙරේ. මෙම වැඩ සටහන යටතේ, 07 කලාපයේ ප්‍රධාන පෙට්‍රල් පිරවීමේ දොඹකරවල ධාරිතාව නව ඉහළ ධාරිතාවයේ පොම්ප ස්ථාපනය කිරීම මගින් ඉහළ දමනු ලැබේ. දැනට පවත්නා පොම්පාගාරය තුළ නව පොම්ප ස්ථාපනය කිරීමට තරම් ප්‍රමාණවත් ඉඩකඩ නොමැත. එමනිසා, කොලොන්නාව නිමාවේ කලාප 06 හි නව නිෂ්පාදන පොම්පාගාරයක් ඉදිකිරීමට CPSTL තීරණය කර ඇත. නව පොම්පාගාරය ඉදිකිරීමේ වැඩ සීමාසහිත ලාග් ඉංජිනියරින් පුද්ගලික සමාගම වෙත ප්‍රදානය කෙරේ. ව්‍යාපෘතියේ මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.බි. 37.5ක් වන අතර ඉදිකිරීම් වැඩවලින් 80%ක් 2019 මූල්‍ය වර්ෂය අවසානයේදී සම්පූර්ණ කරන ලදී. පොම්පාගාරය ඉදිකිරීමේ වැඩවලට සමගාමීව, නළ මාර්ග කාණුවක් ඉදිකිරීම සිදුකරන ලදී. කාණුව ඉදිකිරීම සාර්ථකව අවසන් කරන ලද අතර නළ මාර්ග කාණුවේ මුළු ආයෝජනය රු.බි. 50 කි.

අවශ්‍ය පයිප්ප, වෑල් සහ පීඩනමාන වැනි අනෙකුත් උපාංග ප්‍රසම්පාදනය 2019 මූල්‍ය වර්ෂය සඳහා උපලේඛණගත කෙරේ. ප්‍රසම්පාදනයේ මුළු වටිනාකම රු.මි. 55.7කි.

පයිප්ප නිෂ්පාදනය රොමේනියාවේ වානේ කර්මාන්ත ශාලාවේ API 54L – Grade B පිරිවිතරවලට අනුකූලව සිදු කරනු ලබයි. මූල්‍ය වසර අවසානය වන විට තෙවැනි පාර්ශ්ව පරීක්ෂණයක් මගින් පයිප්ප සාර්ථකව පරීක්ෂා කරන ලදී. වැඩබිමිය වෙත අමුද්‍රව්‍ය බෙදාහැරීම ආරම්භකරන ලද අතර 2020 වසරේ පළමු කාර්තුව තුළ අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. පයිප්ප ස්ථාපනය 2020 වසර අවසානය වන විට සම්පූර්ණ කිරීමට නියමිතය.

**කොලොන්නාව නිමාවේ කලාප 03 හි වැගන් පිරවුම් දොඹකරය ඉදිකිරීම**

CPSTL විසින් කටුනායක බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවේ ගුවන් ඒකකයට දුම්රිය ටැංකි තුළින් JETA-1 ගුවන් ඉන්ධන ලීටර් මිලියන 38ක් පමණ ලබා දේ. කොලොන්නාව නිමාවේ කලාප 03 හි දැනට පවත්නා ගුවන් ඉන්ධන දුම්රිය ටැංකි පිරවුම් ධාරිතාව ආවරණයක් රහිත විවෘත පිරවුම් පහසුකමක් ලෙස ක්‍රියාත්මකය. සමහර අවස්ථාවලදී අහිතකර කාලගුණ තත්ත්වයන්හි දී මෙහෙයුම් කටයුතුවලට බාධා ඇතිවේ. සමහර අවස්ථාවලදී, මාසයක දී දුම්රිය ටැංකි කට්ටල පහක් (05) පමණ පිටත් කිරීමට නොහැකි වන අතර එය ආසන්න වශයෙන් රුපියල් මිලියන 3.6ක ආවස්ථික පිරිවැයකට හේතු වේ. එබැවින් මෙම අවස්ථාව නිවැරදි කරගැනීම සඳහා ආවරණයක් සහිත දුම්රිය ටැංකි පිරවුම් දොඹකරයක් ඉදිකිරීමට යෝජනා කෙරේ.

ඊට අමතරව, මෙහෙයුම් කටයුතු සිදුකරන අවස්ථාවලදී දොඹකර පිරවුම්වල ආරක්ෂාව ද පිරවුම් දොඹකරය ඉදිකිරීම මගින් වැඩි කළ හැකිය.

මෙම සන්දර්භය තුළ, කලාප 03 හි ගුවන් ඉන්ධන පිරවුම් පහසුකම තුළ අළුත් පිරවුම් දොඹකරයක් ඉදිකිරීම සඳහා CPSTL විසින් රුපියල් මිලියන 28ක් ආයෝජනය කරන ලදී. වහල සහ වහලයේ ව්‍යුහය සහ මෙහෙයුම් කොටස 2019 මූල්‍ය වර්ෂය සඳහා 85%ක සමස්ත ව්‍යාපෘති ප්‍රගතිය අත්කර ගනිමින් නිමකරන ලදී.

ජාත්‍යන්තර ගුවන් මෙහෙයුම සඳහා ගුවන්යානා ඉන්ධන සැපයීම කිසිදු අයුරකින් බාධා නොකළ යුතු බැවින් මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය පරීක්ෂාකාරීව ඉදිරියට ගෙන යන ලදී. එමනිසා, විශේෂ ක්‍රියාමාර්ග බාහිර වැඩමුළුවලදී ව්‍යුහයේ කොටස් සකස් කර පින්තාරු කිරීමට සහ වැඩබිමිය එකතු කිරීමට භාරගනු ලැබීය. ඉදිකිරීම් වැඩවලින් 85%ක් 2019 මූල්‍ය වර්ෂය අවසානය වන විට නිමකරන ලදී.









# මානව ප්‍රාග්ධනය




අපගේ සේවකයින් අපගේ ව්‍යාපාරයේ සාර්ථකත්වයට කණ්ඩායම් ලෙස සහ තනි තනිව විශාල වශයෙන් දායක වන අපගේ ව්‍යාපාරයේ තීරණාත්මක වත්කම වේ. කණ්ඩායමක් වශයෙන්, ඔවුන් ව්‍යාපාරයක් ලෙස කොටස් කරන ජාලයේ අසමසම දක්ෂතා සංයෝජන සහ සම්බන්ධතා සංවර්ධනය කරගෙන ඇත. තරඟකාරී පාරිශ්‍රමිකය, විවිධ ප්‍රතිලාභ, ඉගෙනීම සහ සංවර්ධනය සඳහා අවස්ථා සහ උපකාරී සේවා පරිසරයක් ලබාදෙමින් අපත් සමඟ වර්ධනයවීමට අපගේ සේවකයින් අපි ශක්තිමත් කරමු.

CPSTL ඉහළ අභිප්‍රේරණ කණ්ඩායම්වල කොටසක් ලෙස සේවය කිරීම සඳහා යෝග්‍ය ස්ථානයක් ලබාදෙමින් මූලිකවම එහි සේවකයින් සඳහා වටිනාකම් නිර්මාණය කරන අතර සේවක ඵලදායිතා අරමුණුවලට සහ සමාගම සේවකයින් සඳහා අගය නිර්මාණය කරන ආකාරයට සහයවීම සඳහා පාලන ව්‍යුහ, ප්‍රතිපත්ති රාමු, පද්ධති සහ ක්‍රියාපටිපාටි ක්‍රියාවේ යොදවා ඇත.

### අපගේ කණ්ඩායම ගොඩ නැගීම

මානව සම්පත් කළමනාකරණය CPSTL සඳහා ප්‍රධාන ක්‍රමෝපායික සලකා බැලීමකි. වසර තුළ, අපගේ කණ්ඩායම ශක්තිමත් කිරීම සඳහා පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි මානව සම්පත් කාර්යය අවධානය යොමු කළෙමු.

- මිනිස් බලය සැලසුම් කිරීම
- බඳවාගැනීම සහ තෝරා ගැනීම
- කාර්යසාධනය හා ප්‍රධාන කළමනාකරණය
- මානව සම්පත් සංවර්ධනය
- සේවක සම්බන්ධතා හා ශුභසාධනය
- මානව සම්පත් තොරතුරු පද්ධතිය

සේවකයින් 2.856 ක් වන CPSTL හි කණ්ඩායම අපගේ ආයතනික සාරධර්ම සමඟ ජීවත්වන අපගේ ක්‍රමෝපායික සැලැස්ම පසුපස ධාවකයා වේ. සේවකයින් සියලුම ජාති සහ කලාප ආවරණය කරමින් රටේ සියලුම දිස්ත්‍රික්කවලින් බඳවා ගනු ලබන අතර ඉන් 24%ක් කාන්තා සේවිකාවන් නියෝජනය කරයි. අප යෙදී සිටින කර්මාන්තයේ ස්වභාවය අනුව කාන්තා සේවිකාවන්ගේ නියෝජනය විධායක නොවන ශ්‍රේණිවල සාපේක්ෂව අඩු වන අතර, විධායක ශ්‍රේණිවල එය 27%කි.




### විවිධත්වය සහ සමාන අවස්ථාව

විවිධත්වය අගය කරනු ලබන පරිසරයක් පෝෂණය කිරීමේ ලා CPSTL බැඳී සිටී. විවිධත්වය ප්‍රවර්ධනය කිරීමට සහ සියලුම දෙනා ඇතුළත් කිරීම තුළ ස්ත්‍රීපුරුෂභාවය, ජාතිය, කලාපය, වයස, ජනවර්ගය, සිවිල් තත්ත්වය හෝ දේශපාලන මතය නොසලකා බඳවාගැනීම, පාරිශ්‍රමිකය සහ උසස් කිරීම් ඇතුළුව අපගේ සියලුම මෙහෙයුම්වල සමාන අවස්ථා ලබා දේ.

# මානව ප්‍රාග්ධනය

මෙම බැඳීමේ අධිෂ්ඨානය ලෙස, වර්තමානයේ සමාගමේ විවිධ කාර්යයන් හී ආබාධිත පුද්ගලයින් 4 දෙනෙක් සඳහා රැකියා අවස්ථා ලබා දී ඇත.

### මානව සම්පත් පාලනය

ළමා ශ්‍රමය තහනම් කිරීම සහ සමාන අවස්ථා ලබාදීම ඇතුළුව අදාළ සියලුම නීති අවශ්‍යතාවන්ට අනුකූලවීම සහතික කිරීම සඳහා මානව සම්පත් ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සකස් කරනු ලැබ ඇත. අපි වයස අවුරුදු 18ට වඩා අඩු පුද්ගලයින් සේවයේ යෙදවීමක් සිදු නොකරන අතර බලාත්කාර හෝ අනිවාර්ය ශ්‍රම ව්‍යවහාර නොඉවසමු.

### සේවක සහභාගිත්වයන් සහ ප්‍රතිලාභ

CPSTL හි ප්‍රධාන ව්‍යුහය විභිවිදහාවය සමඟ සැලසුම්කර ඇත. පිරිමින් සහ කාන්තාවන් අතර වෙනස් කිරීමක් නොමැතිව ව්‍යාපාරය තුළ සමාන ප්‍රමිති පවත්වා ගනිමින් ශ්‍රේණි අනුව එය සාධාරණය සහ සමානව සලකුණු කෙරේ. නිශ්චිත හැකියා රාමුවක් මත පදනම් වී වාර්ෂික කාර්යසාධන ඇගයීම්වලට සියලුම සේවකයින් යටත් කරනු ලබයි.

| ස්ථිර කාර්ය මණ්ඩලයට සේවක ප්‍රතිලාභ | විස්තරය | පරිවාස අයට ප්‍රතිලාභ |
|---|---|---|
| නිවාඩු | | |
| - වාර්ෂික නිවාඩු | - දින 14 | |
| - අනියම් නිවාඩු | - වැඩකරන දින 7 | ඔව් |
| - අසනීප නිවාඩු | - වැඩකරන දින 21 | |
| - ප්‍රසූත නිවාඩු | - වැඩකරන දින 84 | |
| | -දින 84ක් සඳහා අඩවැටුප් | |
| | -දින 84ක් සඳහා වැටුප් රහිත නිවාඩු | |
| - අනතුරු නිවාඩු | රැකියාව කරන අතරතුර සේවක අනතුර | |
| - හිලව් නිවාඩු | මාසයේ සෙනසුරාදා 4 හි සේවය කරන සේවකයාට හිලව් නිවාඩු දෙකක් හා අතිකාල ගත හැක | |
| - විශේෂ නිවාඩු | විශේෂ සිදුවීම් තුල (මැතිවරණ, ඇඳිරි නීතිය යනාදී) | |
| - රාජකාරි නිවාඩු | නිල රාජකාරි අරමුණ සඳහා විශේෂ සිදුවීම් | |
| - වැටුප් රහිත නිවාඩු | විදේශ අධ්‍යයන, පුහුණු සහ වැඩමුළු යනාදිය සඳහා | |
| වැටුප් වර්ධකය | සේවකයාගේ රාජකාරි, පැමිණීම සහ හැසිරීම ඇගයීම | ඔව් |
| දීමනා | ආහාර දීමනා, සංචාර දීමනා. පර්යන්ත දීමනා, පැමිණීමේ දිරිදීමනා, සේවා මුර දීමනා, වාර්ෂික නිවාඩු දිරි දීමනා, ජීවන වියදම් දීමනා, වෘත්තීය දීමනා සහ අන්ත දීමනා, කාර්යාල දුරකථන ප්‍රතිලාභ යනාදිය | ඔව් |
| ප්‍රසාද දීමනා | වෛද්‍ය නිවාඩු දිරිදීමනා, වාර්ෂික ප්‍රසාද දීමනා | ඔව් |
| ණය | | |
| - ආපදා ණය | මාස 10 වැටුප, සරල සහනශීලී පොලී අනුපාත, මාස 60 ක වාරිකවලින් අයකරගැනීම | නැත |
| - නිවාස ණය | ඉඩමක් හෝ නිවසක් මිලදී ගැනීම හෝ නිවාස ඉදිකිරීම සරල සහනශීලී පොලී අනුපාත, මාස 300 කින් හෝ සේවකයා ඉතිරි රාජකාරි කාලය යන දෙකෙන් අඩු කාලය තුළ අයකරගැනීම | නැත |
| - නිවාස අලුත්වැඩියා ණය | නිවාස අලුත්වැඩියා සඳහා. සරල සහනශීලී පොලී අනුපාත, මාස 120ක වාරිකවලින් අයකරගැනීම | |
| - නිවාස පහසුකම් ණය | ගෘහභාණ්ඩ මිලදී ගැනීම සඳහා. සරල සහනශීලී පොලී අනුපාත, මාස 60ක වාරිකවලින් අයකරගැනීම | |
| - සකසුරුවම් සමිති ණය | මාස 03 ක වැටුප. සරල සහනශීලී පොලී අනුපාත, මාස 60 ක වාරිකවලින් අයකරගැනීම | |
| - කාර් ණය | විධායක නිලධාරීන්ට පමණි. සහනශීලී පොලී අනුපාත, මාස 60 ක වාරිකවලින් අයකරගැනීම | |
| - මෝටර් සයිකල් ණය | සරල සහනශීලී පොලී අනුපාත, මාස 60 ක වාරිකවලින් අයකරගැනීම | |
| - ත්‍රී රෝද ණය | සරල සහනශීලී පොලී අනුපාත, මාස 60 ක වාරිකවලින් අයකරගැනීම. | |

# මානව ප්‍රාග්ධනය

| ස්ථිර කාර්ය මණ්ඩලයට සේවක ප්‍රතිලාභ | විස්තරය | පරිවාස අයට ප්‍රතිලාභ |
|---|---|---|
| **අත්තිකාරම්** | | |
| - උත්සව අත්තිකාරම් | පොලී නොමැත. මාස 10 කින් අයකරගැනීම | |
| - අලුත් අවුරුදු අත්තිකාරම් | පොලී නොමැත. මාස 10 කින් අයකරගැනීම | |
| - පාසල් පොත් අත්තිකාරම් | පොලී නොමැත. මාස 10 කින් අයකරගැනීම | |
| ත්‍යාග පිරිනැමීම | සේවකයාගේ සේවා කාලය මත රඳා පවතී | |
| ශුභසාධනය ආශ්‍රිත ප්‍රතිලාභ | - CPC හෝ CPSTL හි සෑම සේවකයෙකුටම තම පවුල සමඟ දින 3ක්/රාත්‍රී 2ක් නැවතී සිටීමේ අවස්ථාව හිමිය.<br>- CPSTL ක්‍රීඩා සමාජ උත්සව තුළ සහභාගිත්වය<br>- වාර්ෂික සංචාරය<br>- ලේ දන්දීමේ කඳවුර<br>- CPSTL පරිශ්‍රයන්හී සමූපාකාර වෙළෙඳ සැළ<br>- CPSTL පරිශ්‍රයන්හී පවත්වාගෙන යන ආපනශාලාව | |
| වෛද්‍ය ප්‍රතිලාභ | - CPSTL I පර්යන්තයන් හී කාර්යස්ථ වෛද්‍යවරයෙක් සහ නොමිලේ ඖෂධ සහ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය<br>- රෝහල්ගත කිරීම සඳහා වෛද්‍ය රක්ෂණය<br>- රසායනාගාර පරීක්ෂණ සඳහා ප්‍රතිපූරණය<br>- විශේෂ පරීක්ෂණ සඳහා අසීමිත ප්‍රතිපූරණය (CT ස්කෑන්, US ස්කෑන්, MRI, එන්ඩෝස්කොපි) | |
| මරණ ප්‍රතිලාභ | මරණ වන්දි ගෙවීම | |
| සකසුරුවම් සමිති ප්‍රතිලාභ | - මරණ පාරිතෝෂිතයට සේවකයින් සහ ආසන්න පවුල් සාමාජිකයින්ගේ මරණය ඇතුළත්ය<br>- පාරිතෝෂිකය ව්‍යවස්ථාපිත පාරිතෝෂිකය මෙන් ලබා දේ. | |
| විශ්‍රාම වෙන්කිරීම | ව්‍යවස්ථාපිත පාරිතෝෂිකය | |
| වෙනත් පහසුකම් | විශේෂ රාජකාරි සඳහා නිල ඇඳුම්, රාත්‍රී සේවකයින් සඳහා ආහාර ලබාදීම | |

### වැටුප් ගෙවීම, ප්‍රධාන හා හඳුනා ගැනීම

සමාගම එහි සේවකයින්ට සතුටුදායක සමාජ ප්‍රතිලාභ ලබාදෙන බව සහතික කරයි. ව්‍යවස්ථාපිත ප්‍රතිලාභවලට අඛණ්ඩව වසර 05ක සේවය සඳහා පාරිතෝෂික ගෙවීමකට හිමිකම ඇතුළත්ය. සමාජීය ප්‍රතිලාභවලින් සෞඛ්‍ය රක්ෂණය, සේවක ණය, ප්‍රසාද දීමනා, දිරිදීමනා යනාදිය ඇතුළුව හිමිකම් රාශියක් ආවරණය කරයි.

සමාගම සෑමවිටම සේවකයින්ගේ වෘත්තීය සංවර්ධනය කෙරෙහි උනන්දුවක් දක්වන අතර, පිළිගත් වෘත්තීය ආයතන හා එකතුවීමට අපේක්ෂා කරන කාර්ය මණ්ඩලය සඳහා ණය ලබදෙමින්, වෘත්තීය සංවර්ධනය සඳහා ඔවුන් අභිප්‍රේරණය කරමින් MBA සහ අනෙකුත් පශ්චාත් උපාධි අධ්‍යයනය කිරීමට මූල්‍ය සහයෝගය ලබාදෙමින් වාර්ෂික වෘත්තීය ආයතන දායක මුදල් ප්‍රතිපූරණය කරමින් සහ වෘත්තීය ආයතන විසින් පවත්වනු ලබන සම්මන්ත්‍රණ ගාස්තු ප්‍රතිපූරණය කරමින් අඛණ්ඩව වෘත්තීය සංවර්ධනය වැඩි කරයි.

සේවකයින් පමණක් නොව සේවකයින්ගේ ළමුන්ට උපාධිය සඳහා ශිෂ්‍යත්ව ලබාදෙමින් ඉහළ අධ්‍යාපනය සඳහා දිරි ගන්වනු ලබයි.වසර තුළ, විවිධ ක්ෂේත්‍රයන් හී උපාධි අපේක්ෂකයින් සඳහා ශිෂ්‍යත්ව 146ක් ලබාදී ඇත.

### සේවකයින්ගේ ළමුන් සඳහා ශිෂ්‍යත්ව




විශේෂිත සේවා වසර ගණන ආවරණය කර ඇති සේවකයින් සමාගම මගින් වාර්ෂිකව ඇගයීමට ලක් කෙරේ.

| සේවා කාලය | සේවකයින් ගණන |
|---|---|
| වසර 20 | 80 |
| වසර 30 | 29 |
| වසර 35 | 9 |
| වසර 40 | 2 |

# මානව ප්‍රාග්ධනය

### වෘත්තීමය සෞඛ්‍ය සහ ආරක්ෂාව

CPSTL ශ්‍රී ලංකාව තුළ විශාලතම ඛණිජ තෙල් පර්යන්ත ක්‍රියාකරු වේ. CPSTL විසින් මෙහෙයවන නිෂ්පාදන වහා ගිනි ඇවිලෙන සුළු වන අතර මෙහෙයුම් කටයුතු ඉහළ අවදානම් වර්ගය යටතට වැටේ. ආර්ථිකයේ ප්‍රධාන කේන්ද්‍රය වන CPSTL හී විශාල ප්‍රමාණයේ ගින්නක් රටේ ආර්ථිකය දුර්වල කළ හැකිය. එමනිසා, කාර්මික හා වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව CPSTL මෙහෙයුම්වල උපරිම වැදගත් සාධකයකි. CPSTL පහත විශේෂ අංශ ඇත.

- ගෘහස්ථව යෙදවිය හැකි දින 7 පැය 24 සහිත ගිනි සහ ආරක්ෂක කාර්යය, මෙහෙයුම්වල ආරක්ෂාව නියාමනය කිරීමට ගිනි බලකාය.
- සෞඛ්‍ය නියාමනය කිරීමට වෛද්‍ය මධ්‍යස්ථානය සහ අභ්‍යන්තර ගිලන් රථය දින 7 පැය 24 තුළ සේවකයින්ගේ වෛද්‍ය හදිසි අවශ්‍යතාවලට ලබාදීම.

සමාගම සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ කරුණු සහ පහත අවදානම් තුරන් කිරීමට විශේෂ අවධානය යොමු කරයි.

- යන්ත්‍ර, උපකරණ සහ වැඩ පද්ධති වෙන් කිරීම සහ නඩත්තුව
- ඉන්ධන මෙහෙයවීම, ගබඩාකිරීම සහ ප්‍රවාහනය
- අදාළ තොරතුරු, පුහුණුව සහ අධීක්ෂණය ලබාදීම
- වැඩ කොන්දේසි නඩත්තුව
- වැඩපලේදී සෞඛ්‍ය හා ආරක්ෂක උවදුරු වැලැක්වීම
- සියලුම සේවකයින් විසින් සෞඛ්‍ය සහ ආරක්ෂක උපදෙස් දැඩිව පිළිපැදීම

### පුහුණුව සහ සංවර්ධනය

සමාගමේ දැක්ම සහ තිරසාර අගය නිර්මාණය කිරීමේ පරමාර්ථ එහි සේවකයින් මත ඉතිරිව ඇති බව සමාගම හඳුනා ගනී. එමනිසා, සමාගමේ ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීමට සහ එහි වර්ධන ඉලක්ක සපුරා ගැනීමට තරඟකාරී සේවකයින් සංවර්ධනය සහ රඳවාගැනීම අවශ්‍ය වේ. CPSTL හී පුහුණුව සහ මානව සම්පත් සංවර්ධන කාර්යය සේවකයින්ගේ අඛණ්ඩ පුද්ගල සංවර්ධනයට සම්පූර්ණයෙන්ම කැප වී සිටින අතර, සියලුම සේවකයින්ගේ පුහුණු අවශ්‍යතා විධිමත්ව නියාමනය කරයි. සමාගම කාර්යසාධන ප්‍රතිචාර, දක්ෂතා සාකච්ඡා තුළින් එහි සේවකයින්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගනී. අභ්‍යන්තරව පවත්වන ලද පුහුණු වැඩසටහන්වලට අමතරව, අවශ්‍ය අවස්ථාවලදී වෘත්තීය ආයතන, පුහුණු ආයතන ඇතුළුව බාහිර පාර්ශ්ව මගින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා සහභාගිවීමට සේවකයින් දිරිගන්වනු ලබයි. 2019 වසර තුළ, පුහුණු පැය 13,492ක් බවට පත්කරමින් තාක්ෂණික දැනුම, මෘදු කුසලතා සහ සේවකයින්ගේ නායකත්ව දක්ෂතා සංවර්ධනය කිරීමට පුහුණු වැඩසටහන් කිහිපයක් CPSTL විසින් පවත්වා ඇත.

| වැඩසටහන/වැඩමුළුව | සහභාගිවූවන් | පැය ගණන |
|---|---|---|
| සංගීත චිකිත්සාව | 103 | 412 |
| ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනවලට අදාළ පොදු වගවීම සහ විගණනය | 48 | 384 |
| කාර්යාල කළමනාකරණයේ නෛතික අංශ | 90 | 720 |
| අවසන් පරිශීලක පරිගණක ආරක්ෂාව | 93 | 372 |
| ගිනි හා ආරක්ෂාව | 18 | 432 |
| පුද්ගල සූදානම | 36 | 288 |
| නිපුනතා යාවත් කිරීමේ වැඩසටහන (පෙදරේරු සහ ජලනළ කාර්මික) | 8 | 360 |
| ආයතනික විමර්ෂණය | 69 | 552 |
| ගෘහස්ථ ගිනි | 78 | 312 |
| කාර්යාල කළමනාකරණය සහ කාර්යාල ක්‍රියාපටිපාටි | 47 | 376 |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 74 | 592 |
| රියදුරන් සඳහා රියදුරු තාක්ෂණය, මෝරදේ පනත හා මාර්ග ආරක්ෂාව | 78 | 624 |
| 2018 ජාතික විගණන පනත | 60 | 480 |
| නිවාස බලාගැනීම | 12 | 192 |
| ඉදිරිපත් කිරීමේ දක්ෂතා | 67 | 536 |
| ඖෂධ අවභාවිතා කළමනාකරණය | 40 | 160 |
| තොරතුරු පද්ධති. විගණනය | 23 | 184 |
| කර්මාන්තශාලා ආඥාපනත පරිපාලනය | 21 | 168 |
| කම්කරු නීතිය හා සාකච්ඡාව. පරිපාලන වෘත්තිකයන් සඳහා ක්‍රියාපටිපාටි | 28 | 224 |
| ආරම්භක පුහුණුව | 9 | 144 |
| කල්පනාවෙන් සිටින නායකයින් සංවර්ධනය | 24 | 192 |
| ආකල්ප වෙනස් කිරීම හා හැකියා සංවර්ධනය හා පීඩන කළමනාකරණය | 102 | 816 |
| Microsoft Office | 10 | 2,400 |
| පරිපාලන නිලධාරීන්ගේ රාජකාරි හා වගකීම් | 26 | 208 |
| වෘත්තීය සාර්ථකත්වය | 92 | 736 |
| ගුණාත්මක සේවා පරිසරය | 27 | 216 |
| සේඅඅ/සේභාඅ පනත හා පාරිතෝෂික ගෙවීම | 47 | 376 |
| අභ්‍යන්තර විනය පරීක්ෂණ පවත්වන ආකාරය | 39 | 312 |
| නීරෝගී හදවත | 43 | 172 |
| කාර්යාල සහයකයින්ගේ කාර්යභාරය හා වගකීම | 35 | 280 |
| මෝටර්වාහන පනත | 34 | 272 |
| එකතුව | 1481 | 13,492 |

# මානව ප්‍රාග්ධනය

අපගේ ව්‍යාපාර සාරධර්මවලට අනුගත වෙමින්, සේවකයින්, අසල්වැසියන් සහ සමාජය ඇතුළු ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ සහභාගිත්වය දැඩි කිරීම සඳහා මාවත් CPSTL විසින් නිරතුරුවම ගවේෂණය කරයි.

## සේවක උත්සව

- **ලේ දන්දීමේ වැඩසටහන**

සමාගමේ සේවකයින්ගේ පූර්ණ සහ සක්‍රිය සහභාගිත්වයෙන් අඛණ්ඩව 39 වැනි වරටත් 2019 වසර තුළ වාර්ෂික ලේ දන්දීමේ වැඩසටහන සාර්ථකව පවත්වන ලදී.



- **බෞද්ධ ධර්මදේශනාව**

CPSTLහි බෞද්ධ සංගමය විසින් සියලුම සේවකයින්ට සහභාගිවීම සඳහා ආරාධනය කරමින් කාර්යාල පරිශ්‍රය තුළ පෝය දින බෞද්ධ ධර්මදේශනා පවත්වනු ලබයි.





- **සංගීත චිකිත්සාව පිළිබඳ වැඩමුළුව**

වචන, ස්වරය, තාලය, සංගීතය, සංගීත චිකිත්සාවේ තාක්ෂණික සහ ප්‍රායෝගික අංක නොමැතිව සංගීතය අවබෝධකර ගන්නා ආකාරය ආවරණය කරමින් වැඩ සහ ජීවිතය අතර සමබරතාව ඇති කිරීමේ අරමුණ ඇතිව පුහුණු සහ මානව සම්පත් සංවර්ධන කාර්යය විසින් සංගීත චිකිත්සාව පිළිබඳ වැඩමුළුව පවත්වන ලදී.





# ස්වභාවික ප්‍රාග්ධනය




ස්වභාවික ප්‍රාග්ධනය යනු අපගේ වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය සඳහා ප්‍රධාන යෙදවුම වන අතර, පරිසරය කෙරෙහි අපගේ බලපෑම අවම බව සහතික කිරීම සඳහා ශක්තිමත් බැඳීම අපගේ සියලුම අංශ විසින් පෙන්වා දේ.

සම්පත් හිඟය සහ කාලගුණ වෙනස බරපතල ගෝලීය ගැටළුවක් ලෙස මතු වී ඇති අතර, එය ලොව වටා ආයතනවල තිරසාරත්වයට තර්ජනයක් විය හැක. CPSTL හි අපි බලශක්ති සහ ජලයේ කාර්යක්ෂමතාව උපරිම කිරීම, නාස්තිය අවම කිරීම සහ අපගේ කාබන් පියසටහන අඩුකිරීම තුළින් අපගේ ව්‍යාපාර තිරසාරත්වය වර්ධනය කිරීමට උත්සාහ ගනිමු. බලශක්ති පරිභෝජනය, බලශක්ති තීව්‍රතාව සහ අපජලය සහ අපද්‍රව්‍යවල තත්ත්වය සහ ප්‍රමාණය වැනි පාරිසරික දර්ශක මැනීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණ ක්‍රියාවට නංවා ඇත. වර්ෂය තුළ, පාරිසරිකමය රෙගුලාසි සහ නීතිවලට අනුකූල නොවීම නිසා සමාගම වෙත දඩමුදල් හෝ දඬුවම් පනවන ලද අවස්ථා නොමැත.

### බලශක්තිය

බලශක්ති සම්බන්ධ අපගේ ප්‍රධාන මූලාශ්‍ර වන්නේ විදුලිය, ඩීසල්, දැවි තෙල්ය. බලශක්තිය ප්‍රධාන වශයෙන් පර්යන්ත දෙක (කොලොන්නාව සහ මුතුරාජවෙල) තුළ පරිභෝජනය කරන අතර ඒවා ප්‍රධාන වශයෙන් බලශක්ති තීව්‍ර අක්වෙරළ ඒකකය සහ දිවයින පුරා ගබඩා වේ. මූලාශ්‍ර තුළින් වසර තුළ සමාගමේ බලශක්ති පරිභෝජනය පහතින් දැක්වේ.

| බලශක්ති මූලාශ්‍රය | මිනුම් ඒකකය | 2019 පරිභෝජනය | 2018 පරිභෝජනය |
|---|---|---|---|
| විදුලිය | කි.වො. | | 3,286,631 |
| ඩීසල් | කි.ලී. | 4,014 | 4,166 |
| ජලය | කි.ලී. | 299 | 333 |

CPSTL විසින් බලශක්ති කාර්යක්ෂමතාව වැඩි කිරීමට පියවර කිහිපයක් ගෙන ඇත.

පොම්පාගාර, පිරවුම් දොඹකර සහ ටැංකි ගොවිපල ඉදිකිරීම් සහ/හෝ ව්‍යාප්ත කිරීම් නව සංවර්ධනයන් සහ වැඩිදියුණු කිරීම් සහ එවැනි ස්ථාපනයන් සඳහා අවශ්‍ය යන්ත්‍ර සැලසුම්කළ ප්‍රමිති අනුව උපරිම ඵලදායී මෙහෙයුම් ස්ථානයක් මෙහෙයවීම සඳහා ඉංජිනේරු කාර්යය විසින් සැලසුම් කෙරේ. මෙසේ, අභ්‍යන්තර ඉංජිනේරු කණ්ඩායම විසින් සිදුකරන සැලැස්ම මගින් බලශක්ති කාර්යක්ෂමතාව අත්කර ගනි.

### ජලය

සමාගමේ මෙහෙයුම් ජලය ආශ්‍රිත නොවන අතර මූලිකවම සේවකයින්ගේ පරිභෝජනය සහ නඩත්තු කටයුතු  සඳහා පමණක් අපි ජලය භාවිතා කරමු. අපගේ ජල අවශ්‍යතාවන් නගර සභා මාර්ගවලින් මූලික වශයෙන් ඉටු කර ගනී. සමාගමේ මුළු ජල පරිභෝජනය පහතින් දැක්වේ

| බලශක්ති මූලාශ්‍රය | මිනුම් ඒකකය | 2019 පරිභෝජනය | 2018 පරිභෝජනය |
|---|---|---|---|
| නාගරික ජල සැපයුම | කි.ලී. | 299 | 333 |

# ස්වභාවික ප්‍රාග්ධනය

### අමුද්‍රව්‍ය

ශ්‍රී ලංකාව පොසිල ඉන්ධන නිෂ්පාදනය නොකරන බැවින්, මූලික අමුද්‍රව්‍ය වන්නේ ඛණිජ තෙල් පදනම් ඉන්ධන වන අතර සම්පූර්ණයෙන්ම ජාත්‍යන්තර පාර්ශ්වයන්ගෙන් ලබා ගනී.

### විමෝචන, අපද්‍රව්‍ය හා අපජලය

සියලුම ඛණිජ තෙල් නිෂ්පාදන වාෂ්පශීලී වන බැවින්, ඛණිජ තෙල් නිෂ්පාදන වාෂ්පීකරණය හේතු කොට ගෙන හාත්පස පැතුරුණු වායු දූෂණයක් පවතී. එමනිසා, CPSTL පරිශ්‍රය තුළ ආශ්වාස වායුවල තත්ත්වය තහවුරු කර ගැනීම සඳහා හාත්පස පැතුරුණු වායුවල තත්ත්වය මැනීම් සිදුකරන ලදී. එහි ප්‍රතිඵල අනුව, සියලුම ප්‍රතිඵල ප්‍රමිතිය විසින් පනවන ලද උපරිම සීමාවට පහළ මට්ටමේ විය.

ඛණිජ තෙල් නිෂ්පාදනවල අංශුමාත්‍ර වැසි ජලය මත දර්ශනය විය හැකිය. මාර්ග ටැංකි සහ දුම්රිය වැගන්වලට පිරවුම් කාලය තුළ සහ පොම්ප මෙහෙයුම් කාලය තුළ නිෂ්පාදන අහඹු ලෙස අපතේ යාම මෙයට ප්‍රධාන හේතුව වේ. ඊට අමතරව, මාර්ග සෝදායැවීම සඳහා භාවිතා කරන මුහුදු ජලයේ ද ඛණිජ තෙල් නිෂ්පාදනවල අංශුමාත්‍ර අඩංගු විය හැකිය. මෙම තෙල් සහිත ජලය මුදාහැරීම සඳහා අතුරුවාරක ටැංකි ක්‍රම භාවිතයෙන් ක්‍රමවේදයක් CPSTL විසින් යොදා ගනී. මෙම තෙල් සහිත ජලය සියලුම නිෂ්පාදන ටැංකි ආවරණය කරමින් ටැංකි ගොවිපල තුළ පිහිටි අතුරුවාරක හරහා ගමන් කරයි. අතුරුවාරකයේ ගුරුත්ව වෙනස මගින් ජලයෙන් තෙල් වෙන් කෙරේ. වෙන්කරන ලද තෙල් කලින් කල ගලි බව්සර් මගින් රැස් කරන අතර තෙල් රහිත ජලය තවදුරටත් නිරවුල් කිරීම සඳහා වෛකල්පිත විලකට යවනු ලැබේ. ජලයේ තත්ත්වය සිරිත් පරිදි පරීක්ෂා කෙරේ.

ටැංකි පිරිසිදු කිරීමේදී ඇතිවන රොන්මඩ CPSTL සඳහා තවත් අර්ධ ද්‍රව අපද්‍රව්‍යයකි. රොන්මඩ පිරිසිදු කිරීමේ උපලේඛනයට අනුව සහ රැස්කරන රොන්මඩ ප්‍රමාණය අනුව කලින් කල බාහිර පාරිභෝගිකයින්ට විකුණනු ලැබේ. ගරාජවලින් රැස්කරන ඉවත දමන එංජින් තෙල් ද ටෙන්ඩර් ක්‍රියාපටිපාටි තුළින් බාහිර පාරිභෝගිකයින්ට අලෙවි කරනු ලැබේ. ඊට අමතරව, පරිසරය සුරැකීම සඳහා වසර තුළ පහත සඳහන් වැඩි දියුණු කිරීම් සිදුකරන ලදී.

- හදිසි අවශ්‍යතාවයක් පරිදි, අවශෝෂක නොවන තෙල් බූමයක් HSE ඒකකය යටතේ මිලදී ගන්නා ලදී. අපතේ යන තෙල් ආපසු ලබාගැනීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීමට අහඹු ඉන්ධන කාන්දුවීම් තුළ මෙම බූමය භාවිතා කිරීමට නියමිතය.
- ආපන ශාලාවේ එකතුවන කාබනික අපද්‍රව්‍ය හැරවීමට සහ එය බැක්ටීරියා පරිවෘත්තීය ක්‍රියාව තුළින් බලශක්තිය බවට පරිවර්තනය කිරීමට ජීවවායු ජෙනරේටරයක් මිලදී ගන්නා ලදී.

### නිෂ්පාදන ප්‍රවාහනය

ඛණිජතෙල් නිෂ්පාදන ප්‍රවාහනය භූමිය සහ ජල මූලාශ්‍ර දෙක දූෂණය වන ඉන්ධන පිටාරගැලීම/කාන්දුවීම/අනතුරු හේතු කොට ගෙන පාරිසරික අවදානමක් ඇති කරයි. ප්‍රවාහන කාර්ය මණ්ඩලය මනාව පුහුණුකර ඇති බව සහ සැලසුම් නොකළ සිදුවීම් මෙහෙයවීම සහතික කිරීම තුළ පහත සඳහන් ආරක්ෂිත ක්‍රියාමාර්ග සමාගම විසින් යොදා ගනී. පිටාරගැලීම්/කාන්දුවීමක් වැනි අවස්ථාවක ප්‍රමිති සහ හදිසි ප්‍රතිචාර ක්‍රම පිළිබඳ ප්‍රවාහන කණ්ඩායම් සඳහා ඉදිරියට යන පුහුණු වැඩසටහන් සහ ආදර්ශන අපි පවත්වමු.

අපගේ වැඩසටහන්වලට පහත දෑ ඇතුළත්ය

- තෙල් පටවන නැවේ සිට නැව්බඩු මුදාහැරීම තුළ බෝයාව/ජැටියේදී ඉන්ධන කාන්දුවීම් වැලැක්වීම. නළ මාර්ගවල හානි නොමැති බව සහතික කිරීමට නැව්බඩු ලබාගැනිමට පෙර ලබාගැනීමේ සහ තෙල් පටවන නැවෙන් ගොඩබාන නළ දෙක පීඩන පරීක්ෂණයට ලක් කරන ලදී.
- ඉන්ධන පිටාරගැලීම සිදුවන අවස්ථාවකදී, ඉන්ධන අපකිරණ රසායනික ද්‍රව්‍ය සහ ඉන්ධන අවශෝෂක (ඉන්ධන පාදනය) සුළු ඉන්ධන පිටාර ගැලීම අවම කරන බව සහතික කිරීමට ක්‍රියාත්මකය.
- ජනතා වගකීම්, නිෂ්පාදන වගකීම් සහ දූෂණ වගකීම් සඳහා තෙවැනි පාර්ශ්ව රක්ෂණය.

# පාලනය සහ අනුකූලතාව

# ආයතනික පාලනය

## අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශනය

CPSTL හි අධ්‍යක්ෂ මණ්ඩලය සමාගම තුළ ආයතනික පාලන මූලධර්ම යොදා ගැනීම නිරීක්ෂණය කිරීම සඳහා දැඩිව කැපවී සිටින බවත් සහ ආයතනික පාලන වාර්තාවෙන් සමාගම තුළ ආයතනික පාලන ව්‍යවහාර පිළිබඳ සාධාරණ වාර්තාවක් සපයන බවත් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තහවුරු කිරීමට මම කැමැත්තෙමි.

ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය සහ සියලුම කාර්ය මණ්ඩලය අදාළ නියාමන සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කර ඇති බව මම ප්‍රකාශ කරමි.



**එම්. උවයිස් මොහමඩ්**
**සභාපති**



"සමාගමේ පාර්ශවකාර වටිනාකම් වැඩි කිරීමට සහ දිගුකාලීන තිරසාර වර්ධනය අත්කර ගැනීමට සෑම අංගයක්ම සමාගම මනාව පාලනය කරන බව සහතික කිරීමේදී මනා ආයතනික පාලනය මූලික වන බව අපි විශ්වාස කරමු."

CPSTL හි ආයතනික පාලනය යහපත් සහ ඵලදායි ආයතනික සංස්කෘතියක් නිර්මාණය කිරීමට සැලසුම් කරන අතර, ඉන් සෑම ගනුදෙනුවකදීම අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කළමනාකාරීත්වයේ වගවීම, විනිවිදබව, සාධාරණත්වය ශක්තිමත් කරමින් ආයතනය පිළිබඳ ජනතා විශ්වාසය ගොඩ නැගීමට සහය වේ. ආයතනික පාලනයේ අරමුණ වන්නේ සමාගමට දිගුකාලීන සාර්ථකත්වය අත්කර දියහැකි ඵලදායී, ව්‍යවසායකත්ව සහ විචක්ෂණ කළමනාකරණයක් ඇති කිරීමයි. පුළුල් අර්ථයෙන් එයට අයත් වන්නේ

- දැක්ම, මෙහෙවර, පරමාර්ථ සහ ක්‍රමෝපාය සැලසුම්කර සන්නිවේදනය කරන ආකාරය
- සාරධර්ම සමඟ මනාව අනුකූල වන ආකාරය
- අවදානම් කළමනාකරණය කරන ආකාරය
- විනිවිදභාවය ප්‍රවර්ධනය කරන ආකාරය
- තිරසාර ආකාරයකින් මෙහෙයුම් කළමනාකරණය කරන ආකාරය
- අනාගත නායකයින් දිරිමත් කරමින් සංවර්ධනය කරන ආකාරය
- පාර්ශවකාර වටිනාකම් වැඩි කිරීමට ආයතනික සංස්කෘතිය ප්‍රවර්ධනය කරන ආකාරය

ශ්‍රී ලංකාව තුළ ඛණිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදාහැරීමේ ප්‍රධාන දායකයා ලෙස, මෙම ආයතනය රටේ නියාමන ආයතන විසින් දක්වා ඇති නීතිකරණ, රෙගුලාසි සහ සංග්‍රහවලට අනුකූලව ආයතනික පාලනය පිළිබඳ මූලධර්ම ක්‍රියාත්මක කිරීමට සහතික වන අතර, එය සමාගම විසින් දක්වා ඇති අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශවලටද අනුකූල වේ.

## ආයතනික පාලන ව්‍යුහය

අධ්‍යක්ෂ මණ්ඩලය, එහි අනුකමිටු, ජ්‍යෙෂ්ඨ කළමනාකරණය, කොටස්හිමියන්, නියාමකයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර මූලික සම්බන්ධතා CPSTL හි පාලන ව්‍යුහය මගින් මෙහෙයවනු ලබයි.

CPSTL හි පාලන ව්‍යුහය ප්‍රධාන ස්ථර තුනක් යටතේ පැහැදිලි කළ හැකිය.

1. අනුකූලතාව
2. අභ්‍යන්තර පාලන ව්‍යුහය
3. සහතිකවීම හා පාලනය



# ආයතනික පාලනය

**01. අනුකූලතාව**

සමාගමේ ආයතනික පාලන ව්‍යවහාර පහත සඳහන් නීතිකරණ, සංග්‍රහ සහ ස්වේච්ඡා ව්‍යවහාර අවශ්‍යතාවන්ට අනුකූල වේ.

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කල ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය
- 2003 දී මුදල් අමාත්‍යංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශග
- 2007 අංක 7 දරන සමාගම් පනත
- 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සහ එයට සංශෝධන සහ වෙනත් ව්‍යවස්ථා
- සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය
- අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිපත්ති
- සමාගම් රෙගුලාසි
- ව්‍යාපාර චර්යා සංග්‍රහය
- අනු කමිටු සහ කළමනාකරණ කමිටුවල විෂය යොමු නිර්දේශ

**02. අභ්‍යන්තර පාලන ව්‍යුහය**

**අධ්‍යක්ෂ මණ්ඩලය**

සමාගමේ සියලුම කටයුතුවල ආයතනික පාලනය පිළිබඳ ඉහළම ප්‍රමිති පවත්වා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය කැප වී සිටී. පාලනයේ අරමුණ වන්නේ ඵලදායි සහ විචක්ෂණ කළමනාකරණය තුළින් කොටස්හිමියන්ට දිගුකාලීන තිරසාරත්වය ඇති කිරීමයි.

- **අධ්‍යක්ෂ මණ්ඩල වගකීම්**

අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලික වගකීම් පහත පරිදි වේ.

◊ ආයතනයේ දිගුකාලින සාර්ථකත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණකරන ක්‍රමෝපායන් සකස් කිරීම තුළ උපදෙස් හා මගපෙන්වීම් ලබාදිම.

◊ ක්‍රමෝපායික මඟ පෙන්වීම ලබාදීම සහ ආයතනික ක්‍රමෝපාය සහ සමාගමේ කාර්යසාධන පරමාර්ථ ඇගයීම, සමාලෝචනය සහ අනුමත කිරීම.

◊ වාර්ෂික සැලසුම් සහ දිගුකාලීන ව්‍යාපාර සැලසුම් සමාලෝචනය සහ අනුමත කිරීම

◊ පාලන සහ අනුකූලතා ක්‍රම නියාමනය

◊ සමාගම විසින් යොදාගන්නා මූල්‍ය සහ අනෙකුත් වාර්තාකරණ ව්‍යවහාර අනුමත කිරීම සහ නියාමනය

◊ ප්‍රධාන අත්කරගැනීම්, බැහැරකිරීම් සහ ප්‍රාග්ධන වියදම සමාලෝචනය සහ අනුමත කිරීම.

◊ අධ්‍යක්ෂ මණ්ඩලයේ සිට විධායක මට්ටම දක්වා බෙදනු ලබන අභිමතයන්/බලාධිකාරයන් වෙත යම් වෙනස්වීම් තිරණය කිරීම.

◊ අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි පාලනය.

- **අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය**

2019 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය පහත පරිදි විය.

01. එම්.ආර්.එම්. ආබිදීන් මහතා - නියෝජ්‍ය සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ
02. කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය - අධ්‍යක්ෂ
03. නිමල් ජයසුන්දර මහතා - විධායක අධ්‍යක්ෂ
04. සුරේෂ් පටිනේක් මහතා - අධ්‍යක්ෂ
05. ප්‍රමෝද් ජේන් මහතා - අධ්‍යක්ෂ
06. ෂාමල් සෙනරත් මහතා - අධ්‍යක්ෂ
07. ආනන්ද පාලිත මහතා - අධ්‍යක්ෂ
08. මනෝජ් කුමාර් ගුප්තා මහතා - අධ්‍යක්ෂ

2019 වසර තුළ අධ්‍යක්ෂවරු වෙනස්වීම.

| | අධ්‍යක්ෂවරයාගේ නම | අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වූ දිනය | අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්වූ දිනය | තනතුර |
|---|---|---|---|---|
| 1 | ධම්මික රණතුංග මහතා | 2017 ජුනි 01 | 2019 ජනවාරි 30 | සභාපති |
| 2 | පී.එස්. විතානගේ මහතා | 2019 ජනවාරි 30 | 2019 සැප්තැම්බර් 12 | සභාපති |
| 3 | සංජීව විජේරත්න මහතා | 2017 ජුනි 01 | 2019 ජනවාරි 30 | කළමනාකාර අධ්‍යක්ෂ |
| 4 | එම්.ආර්.එම්. ආබිදීන් මහතා | 2019 ජනවාරි 30 | | කළමනාකාර අධ්‍යක්ෂ |
| 5 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය | 2015 ඔක්තෝබර් 14 | | වි.නො.අ |
| 6 | ශ්‍යාම් බෝරා මහතා | 2015 ඔක්තෝබර් 14 | 2019 මැයි 14 | වි.නො.අ |
| 7 | නිමල් ජයසුන්දර මහතා | 2017 ජුනි 01 | | වි.අ |
| 8 | යූ.එන්. ගුණවර්ධන මහතා | 2017 ජුනි 01 | 2019 ජනවාරි 30 | වි.නො.අ |
| 9 | සුරාජ් පටිනේක් මහතා | 2018 මැයි 30 | | වි.නො.අ |
| 10 | ප්‍රමෝද් ජේන් මහතා | 2018 අගෝස්තු 16 | | වි.නො.අ |
| 11 | ෂාමල් සෙනරත් මහතා | 2019 ජනවාරි 30 | | වි.නො.අ |
| 12 | ආනන්ද පාලිත මහතා | 2019 මැයි 14 | | වි.නො.අ |
| 13 | මනෝජ් කුමාර් ගුප්තා මහතා | 2019 මැයි 20 | | වි.නො.අ |

**වි.නො.අ විධායක නොවන අධ්‍යක්ෂ** **වි.අ විධායක අධ්‍යක්ෂ**

වාර්ෂික වාර්තාවේ 10 සිට 13 දක්වා පිටුවල වර්තමාන අධ්‍යක්ෂවරුන්ගේ විස්තර මගින් සමාගමට අවශ්‍ය ක්‍රමෝපාය, කාර්යසාධනය, සම්පත් සහ ව්‍යාපාර පරිචයන් පිළිබඳ ගැටළුවලට ස්වාධීන තීරණ ලබාදීමේ පළපුරුද්ද සහ ප්‍රමාණවත් හැකියාව පෙන්වා දේ.

# ආයතනික පාලනය

**• අධ්‍යක්ෂ මණ්ඩලයේ විවිධත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩල තුළනය**

අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනික පාලන රාමුවේ ඉහළම සංරචකය වේ. විවිධ දක්ෂතා, දැනුම, පළපුරුද්ද, වෘත්තීය සුදුසුකම්, ස්ත්‍රීපුරුෂභාවය, වයස, ජාතිය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ විවිධත්වය තුළින් වඩාත් ඵලදායී තීරණ ගැනීමට සහ හැකියා සංචිතය හා සම්පත් වඩා යහපත් පරිදි භාවිතා කිරීමෙන් ප්‍රතිඵල අපේක්ෂා කරයි.

2019 දෙසැම්බර් 31 දිනට CPSTL අධ්‍යක්ෂ මණ්ඩලය අට දෙනෙකුගෙන් සමන්විත වූ අතර ඉන් දෙදෙනෙක් විධායක අධ්‍යක්ෂවරුන් වන අතර හය දෙනෙක් විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය. මොවුන් විවිධ ක්ෂේත්‍රවල දක්ෂතා, ප්‍රවීනත්වය සහ පළපුරුද්ද තුළ ප්‍රශස්ථ මුසුවකි. අධ්‍යක්ෂ මණ්ඩලය තුළ කාන්තා නියෝජනය ඇත.

| අධ්‍යක්ෂ | අධ්‍යක්ෂවරු ගණන |
|---|---|
| විධායක අධ්‍යක්ෂවරුන් (ED) | 2 |
| විධායක නොවන අධ්‍යක්ෂවරුන් (NED) | 6 |

**විධායක/ විධායක නොවන අධ්‍යක්ෂවරු**







**• අධ්‍යක්ෂවරු පත්කිරීම**

සාංගමික ව්‍යවස්ථාවලියේ නියමයන්ට යටත්ව වාර්ෂික මහ සභා රැස්වීමක් තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරු පත් කෙරේ. අධ්‍යක්ෂධුරය සඳහා අපේක්ෂකයින් සලකා බැලීමේදී, අනෙකුත් කරුණු අතර, පළපුරුද්ද පිළිබඳ පෘථුලබව, ව්‍යාපාර සහ මූල්‍ය ගැටළු අවබෝධකරගැනීම, මනා තීරණ ක්‍රියාත්මක කිරීමේ හැකියාව, විවිධත්වය. නායකත්වය, ජයග්‍රහණ සහ ව්‍යාපාරය සහ කර්මාන්තයට බලපාන කරුණු පිළිබඳ පළපුරුද්ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලකිල්ලට ගනී.

**• වගකීම් බෙදාහැරීම**

සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂගේ කාර්යභාරයන් ඔවුන් අතර වගකීම් පැහැදිලිව බෙදා හරිමින් 2017 ජුනි 01 දින සිට වෙන් කර ඇති අතර ඒ තුළින් අධ්‍යක්ෂ මණ්ඩලය අතර වගවීම සහ බලය පිළිබඳ සහ ව්‍යාපාරය කරගෙන යාම සඳහා විධායකයේ වගකීම පිළිබඳ තුළනය සහතික කරයි.

2017 ජුනි 01 දින සිට 2019 ජනවාරි 30 දින දක්වා කාලය තුළ ධම්මික රණතුංග මහතා සමාගමේ සභාපති වූ අතර සංජීව විජේරත්න මහතා කළමනාකාර අධ්‍යක්ෂවරයා විය. ඉන් පසුව, පී.එස්. විතානගේ මහතා නව සභාපති ලෙස පත් වූ අතර, එම්.ආර්.එම්. ආබිදීන් මහතා සමාගමේ නව කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස පත් විය.

සභාපතිගේ කාර්යභාරය වන්නේ ආයතනයේ කාර්යක්ෂමතාව සහ ව්‍යාපාර කාර්යයන් පවත්වා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබාදීමත්, විධායක නොවන සහ විධායක අධ්‍යක්ෂවරු අතර සම්බන්ධතාවයේ අවංකකම සහ ඵලදායීත්වය සහතික කිරීමත්ය. කළමනාකාර අධ්‍යක්ෂගේ කාර්යභාරය වන්නේ ක්‍රමෝපායික මඟ පෙන්වීම, ප්‍රතිපත්ති සකස් කිරීම, වරින් වර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ක්‍රියාපටිපාටිය මත පදනම් වී ආයතනයේ එදිනෙදා කටයුතු කළමනාකරණය කිරීමයි.

CPSTL හි මෙහෙයුම් උපවර්ගවලට බෙදිය හැකි අතර ඒවානම් කොලොන්නාව නිමාවේ මෙහෙයුම්, මුතුරාජවෙල පර්යන්තයේ මෙහෙයුම්, කොළඹ වරායේ ඉන්ධන පහසුකම් කාර්යාලයේ මෙහෙයුම් සහ දිවයින පුරා ලංකා තොග ගබඩාවල මෙහෙයුම්ය. මුතුරාජවෙල පර්යන්තයේ මෙහෙයුම් කටයුතු පර්යන්ත කළමනාකරු (මුතුරාජවෙල) විසින් මෙහෙයවයි. මෙහෙයුම් කළමනාකරු (අක්වෙරළ මෙහෙයුම්) කොළඹ වරායේ ඉන්ධන පහසුකමේ ප්‍රධානියා වේ. ලංකා තොග ගබඩා සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) ගේ අධීක්ෂණය යටතේ ගබඩා අධිකාරී විසින් මෙහෙයවනු ලබයි.

කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරන එම්.ආර්.එම්. ආබිදීන් මහතා පී.එස්. විතානගේ මහතාගේ ඉල්ලා අස්වීම සමඟ සභාපති තනතුර 2019 සැප්තැම්බර් 12 දින සිට ඇබෑර්තු වූ බැවින් නියෝජ්‍ය සභාපති ලෙසද කටයුතු කරයි.

**• අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ පැමිණීම**

විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වනු ලබන අතර විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවශ්‍ය විට සහ අවශ්‍ය වේලාවේදී කැඳවනු ලැබේ. ජ්‍යේෂ්ඨ කළමනාකරුවන් ආරාධනාවන් මත රැස්වීම්වලට සහභාගි වෙති.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් විධිමත් න්‍යාය පත්‍රයක් මත පවත්වන අතර අධ්‍යක්ෂවරුන් වෙත රැස්වීම්වලට පෙර ආයතනික කළමනාකරණය විසින් අදාළ සම්පූර්ණ පසුබිම් තොරතුරු ලබා දේ. 2019 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 10ක් පවත්වන ලදී.

මෙම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම පහත වගුවේ දැක්වේ.

# ආයතනික පාලනය

| | අධ්‍යක්ෂවරයාගේ නම | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පැමිණීම |
|---|---|---|
| 1 | ධම්මික රණතුංග මහතා | - |
| 2 | පී.එස්. විතානගේ මහතා | 09/09 |
| 3 | සංජීව විජේරත්න මහතා | - |
| 4 | එම්.ආර්.එම්. ආබිදීන් මහතා | 10/10 |
| 5 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය | 09/10 |
| 6 | ශ්‍යාම් බෝරා මහතා | 06/06 |
| 7 | නිමල් ජයසුන්දර මහතා | 09/10 |
| 8 | යූ.එන්. ගුණවර්ධන මහතා | - |
| 9 | සුරාජ් පට්නේක් මහතා | 08/10 |
| 10 | ප්‍රමෝද් ජේන් මහතා | 10/10 |
| 11 | ෂාමල් සෙනරත් මහතා | 10/10 |
| 12 | ආනන්ද පාලිත මහතා | 05/05 |
| 13 | මනෝජ් කුමාර් ගුප්තා මහතා | 04/04 |

* ධම්මික රණතුංග මහතා ඉල්ලා අස් වූ අතර පී.එස්. විතානගේ මහතා 2019 ජනවාරි 30 දින සිට ක්‍රියාත්මක වන පරිදි සභාපති ලෙස පත්කරන ලදී.
* සංජීව විජේරත්න මහතා ඉල්ලා අස් වූ අතර එම්.ආර්.එම්. ආබිදීන් මහතා 2019 ජනවාරි 30 දින සිට ක්‍රියාත්මක වන පරිදි කළමනාකාර අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදී.
* යූ.එන්. ගුණවර්ධන මහතා අධ්‍යක්ෂධූරයෙන් ඉල්ලා අස් වූ අතර ෂාමල් සෙනරත් මහතා 2019 ජනවාරි 30 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදී.
* ශ්‍යාම් බෝරා මහතා අධ්‍යක්ෂධූරයෙන් ඉල්ලා අස් වූ අතර ආනන්ද පාලිත මහතා 2019 මැයි 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදී.
* මනෝජ් කුමාර් ගුප්තා මහතා 2019 මැයි 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදී
* පී.එස්. විතානගේ මහතා 2019 සැප්තැම්බර් 12 දින සිට ක්‍රියාත්මක වන පරිදි සභාපති තනතුරින් ඉල්ලා අස්විය.

- **බලය බෙදීම සහ කමිටු**

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් වූ කරුණුවලට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩලය එහි අනු කමිටුවලට බලය බෙදා ඇත.

යම් විශේෂිත වගකීම් බෙදාහැර ඇති පහත සඳහන් කමිටු මගින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ.

**අ) විගණන කමිටුව**

විගණන කමිටුව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන අතර සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. විගණන කමිටුව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කළ සමස්ත පාලන ක්‍රියාවලිය තුළ ක්‍රියාත්මක වන අතර එහි වගකීම් එලදායිව මුදාහැරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ.

CPSTL හි විගණන කමිටුව සාමාජිකයින් 03කින් සමන්විත වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන ඔවුන් විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති. විගණන කමිටුවේ සංයුතිය සහ එය විසින් කරගෙන යනු ලබන කාර්යයන් වාර්ෂික වාර්තාවේ 52 පිටුවේ සිට 53 දක්වා පිටුවල ඉදිරිපත් කෙරේ.

**ආ) තොග සමාලෝචන කමිටුව**

තොග සමාලෝචන කමිටුව CPSTL කාර්ය මණ්ඩලය සහ CPC සහ LIOC නියෝජිතයින්ගේ සහභාගිත්වය ඇතිව සතිපතා පවත්වනු ලැබේ. තොග තත්ත්වය සමාලෝචනය කරන අතර ඉදිරි මාස තුන සඳහා අවශ්‍යතාවය කලින් සැලසුම් කරනු ලබයි. ආනයනය කළයුතු ප්‍රමාණය මෙරට අනාගත ඉල්ලුම, පිරිපහදු නිෂ්පාදන හැකියාව සහ ටැංකි ගබඩා ධාරිතාව සැලකිල්ලට ගැනීමෙන් පසු හඳුනාග නු ලබයි. විධිමත් සමීප නියාමනය රටතුල බාධා රහිත ඉන්ධන සැපයීම සහතික කිරීමට සංස්ථාවට හැකියාව ඇති කරයි.

**ඇ) ප්‍රසම්පාදන කමිටුව**

භාණ්ඩ වැඩ සහ සේවා මිලදී ගැනීම සඳහා ජාතික ප්‍රසම්පාදන ආයතනය විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අනුගමනය කරමින් ප්‍රසම්පාදන කාර්යයන්හි විනිවිදභාවය සහතික කිරීමට සහ සැපයුම් ප්‍රමාද අවම කිරීමට, මූල්‍යමය වශයෙන් වඩාත් වාසිදායක සහ ගුණාත්මක වශයෙන් සමාගමට වඩාත් හොඳම සේවා සහ සැපයීම් ලබා ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව කටයුතු කරයි.

මෙම කමිටුව CPSTL හි සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ විසින් මෙහෙයවනු ලබන අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් සහ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ නියෝජිතයින්ගෙන් සමන්විත වේ.

- **තොරතුරු සහ සම්පත් කරා අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රවේශය**

අධ්‍යක්ෂවරුන්ට තම රාජකාරි සහ වගකීම් එලදායීව කරගෙන යාම සඳහා කළමනාකරණය සහ ආයතනයේ තොරතුරු මෙන්ම සම්පත් කරා අසීමිත ප්‍රවේශය ඇත. විධායක කළමනාකරණය විසින් මෙහෙයුම් සැලසුම්, ක්‍රමෝපායන්ට අනුව ව්‍යාපාරයේ කාර්යසාධනය, මූල්‍ය කළමනාකරණය, පිරිවැයකරණය, වත්කම් කළමනාකරණය, අවදානම් කළමනාකරණය, අනුකූලතාව සහ නියාමන වෙනස්වීම් ඇතුළු කරුණු පිළිබඳ ඉදිරිපත්කිරීම් සිදුකරයි. අවශ්‍යයයි කල්පනා කරන අවස්ථාවලදී අධ්‍යක්ෂවරුන්ට සමාගමේ වියදමින් ස්වාධීන වෘත්තිය උපදෙස් සහ තොරතුරු සඳහා ප්‍රවේශය ඇත.

- **සමාගම් ලේකම්වරු**

අධ්‍යක්ෂ මණ්ඩලයට එහි රාජකාරි සහ වගකීම් මුදාහැරීමට මග පෙන්වමින් සහ ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිචයන් ප්‍රවර්ධනය කරමින් එකවුන්ටින් සිස්ටම්ස් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් ලේකම්වරු ලෙස කටයුතු කරයි. සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාගමේ ලේකම් වෙත ප්‍රවේශය ඇත. සමාගමේ ලේකම් වාර්තා සහ අනෙකුත් අදාළ වාර්තා තබාගනිමින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අනෙකුත් අනු-කමිටු රැස්වීම් වේලාවන් සම්බන්ධීකරණය කරයි.

## 03.සහතික කිරීම සහ පාලනය

- **මූල්‍ය වාර්තාකරණය**

මූල්‍ය ප්‍රකාශන සත්‍ය සහ සැබෑ ලෙස ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLAS) එනම් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිති (SLFRS) සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) වලට අනුකූලව සකස් කරනු ලබන අතර විගණන කමිටුව විසින් මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත්කිරීමට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතන්ට ඇති අනුකූලතාව, යෝග්‍යතාවය, ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම් සහ වැදගත් තීන්දුමය කරුණු පිළිබඳව කළමනාකරණය සහ බාහිර විගණකවරුන් සමඟ සමාලෝචනය කර සාකච්ඡා කර ඇත.

# ආයතනික පාලනය

- **විනිවිදභාවය සහ අනුකූලතාව**

සියලුම ගනුදෙනුවලදී විනිවිදභාවය පවත්වා ගැනීමට සහ නීති හා රෙගුලාසිවලට අනුකූලවීම සහතික කිරීමට මෙන්ම සදාචාර ප්‍රමිති, කම්කරු හා මානව හිමිකම්, සහ සමාගමේ ප්‍රතිපත්ති ආරක්ෂා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී.

- 1961 අංක 28 දරන ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථා පනත සහ 1971 අංක 38 දරන මූල්‍ය පනතේ විධිවිධානවලට අනුකූලව සමාගමේ අභ්‍යන්තර පාලන ක්‍රමය සැලසුම් කෙරේ.
- 1971 අංක 38 දරන මූල්‍ය පනතට අනුකූලව, විගණකාධිපති විසින් ආයතනයේ අභ්‍යන්තර විගණනය සිදුකරන අතර මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව ප්‍රකාශයට පත්කර පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබයි.
- වගවීම සහතික කිරීම සඳහා, ආයතනය නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS) සහ අනෙකුත් අදාළ රෙගුලාසිවලට අනුකූල වේ.

- **අභ්‍යන්තර පාලනය**

ඵලදායිතාවය අත්කරගැනීම සහ මෙහෙයුම්වල කාර්යක්ෂමතාව, මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසීබව සහ අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල බව සහ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් සාධාරණ සහතික කිරීම ලබාදීමට යහපත් සහ ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමයක් විධිමත් ලෙස ස්ථාපිතකර පවත්වාගෙන යන බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ. ඉන් මූල්‍ය සහ ගිණුම්කරණ තොරතුරුවල අවංකකම තහවුරු කරන අතර, මෙහෙයුම් සහ ලාභදායිතා ඉලක්ක සපුරාලමින් ආයතනය තුළ කළමනාකරණ ප්‍රතිපත්ති බාධා රහිතව ඉදිරියට යාමට ඉඩ සලස්වයි. යම් අභ්‍යන්තර පාලන ක්‍රමයක් මගින් සාධාරණ සහතික කිරීමක් පමණක් නොව සාධාරණ කාලසීමාවක් තුළ දෝෂ සහ අක්‍රමිකතා ඉදිරිපත් කර අනාවරණය කරන බවද සහතික කරනු ලබන බව සඳහන් කිරීම වැදගත්ය.

අභ්‍යන්තර විගණන කාර්යය විසින් ආයතනය CPSTL හි ස්ථාපිත අභ්‍යන්තර පාලන ක්‍රමය තුළ කාර්යක්ෂමව ක්‍රියාත්මක වන බව සහතික කරයි.

- **අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර විගණනය පවත්වනු ලබන අතර එය කළමනාකාරිත්වයෙන් ස්වාධීන වේ. අභ්‍යන්තර විගණනයක පරමාර්ථය වන්නේ ආයතනයක සියලුම කටයුතු තුළ දැඩි පාලනය තබා ගැනීමයි. මූල්‍ය වාර්තාවල සත්‍යතාවය සහ ආයතනයේ මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය සහතික කිරීම කළමනාකාරිත්වයට අවශ්‍ය වේ. අභ්‍යන්තර විගණනයක් මෙම කරුණු දෙක ස්ථාපිත කිරීමට සහය වේ. ඒ තුළින් විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් දක්වා ඇති ක්‍රියාපටිපාටි, නිති සහ රෙගුලාසිවලට අනුකූලව ආයතනය තුළ පවත්වා ගන්නා බව සහතික කරයි.

අභ්‍යන්තර විගණන අංශයේ විෂයපථය පහත පරිදි වේ.

◊ සියලුම ව්‍යාපාර ගනුදෙනු ක්‍රියාත්මක කිරීමට පෙර පවත්නා නිති සහ රෙගුලාසිවලට අනුකූලව විධිමත්ව බලය ලබා දෙන බව සහතික කිරීම.

◊ කාර්යක්ෂම කළමනාකරණය සඳහා සියලුම ගිණුම්කරණ තොරතුරු SAP පද්ධතියේ විධිමත්ව වාර්තාකරන බව මෙන්ම මූලික වාර්තා නිවැරදිව පවත්වාගන්නා බව සහ අදාළ සංඛ්‍යාලේඛන සහ පාලන දත්ත විධිමත්ව සැලසුම් කරන බව සහතික කිරීම.

◊ මූල්‍ය ගිණුම්කරණ ප්‍රකාශවලින් ආයතනයේ තත්ත්වය පිළිබඳව සත්‍ය සහ සැබෑ දැක්මක් අනාවරණය කරන බව සහතික කිරීම.

◊ දැනට ක්‍රියාත්මක අභ්‍යන්තර පාලන ක්‍රමයේ කාර්යක්ෂමතාව තක්සේරු කිරීම.

◊ පද්ධති පදනම් ප්‍රවේශය යොදා ගනිමින් පහත කරුණු සමාලෝචනය හා ඇගයීම;

  - දෙපාර්තමේන්තුව විසින් කරගෙන යන වැඩසටහන් සහ අනෙකුත් මෙහෙයුම්වල ප්‍රමාණය ඇගයීමට කළමනාකාරිත්වය විසින් භාවිතා කරන මිනුම් ඇතුළුව දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් පාලනය කිරීමට අදහස් කරන සියලුම පද්ධති සහ ක්‍රියාපටිපාටිවල සැලැස්ම සහ මෙහෙයුම ප්‍රතිපත්ති වල සාර්ථකත්වය.
  - නීතිකරණ සහ දක්වා ඇති වෙනත් අවශ්‍යතා සහ කළමනාකරණ සැලසුම්, ක්‍රියාපටිපාටි සහ ප්‍රතිපත්තිවලට අනුකූලතා මට්ටම.
  - වත්කම් අත්කර ගැනීම, බැහැරකිරීම සහ ආරක්ෂා කිරීම සහ වංචාව, දුරාචාරය සහ අක්‍රමිකතාවලින් ඇතිවන පාඩු ඇතුළුව අලාභ.
  - සම්පත් ආර්ථික සහ කාර්යක්ෂමව භාවිතා කිරීම සහ නාස්තිය අවම කිරීම සඳහා වැඩපිළිවෙල.
  - තීරණ ගැනීම සඳහා සහ වගවීම සඳහා ලබාදෙන තොරතුරුවල ප්‍රමාණවත්බව, විශ්වාසිබව සහ අවංකකම සහ මෙම තොරතුරු භාවිතා කරන ප්‍රමාණය.

# ආයතනික පාලනය

**2017 දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ආයතනික පාලනය පිළිබඳ මනා පරිචය සංග්‍රහය සමඟ අනුකූලතාවය**

| යොමු අංකය | ආයතනික පාලන මූලධර්මය | අනුකූලතාව පිළිබඳ විස්තර | අනුකූලතා තත්ත්වය |
|---|---|---|---|
| A | **අධ්‍යක්ෂවරු** | | |
| A.1 | අධ්‍යක්ෂ මණ්ඩලය | අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රමෝපායික මඟපෙන්වීම සැකසීමේදී සහ සමාගමේ සාර්ථක ක්‍රියාකාරිත්වය සඳහා යහපත් පාලන රාමුවක් ස්ථාපිත කිරීමේදී නායකත්වය ලබා දේ. | අනුකූලවිය |
| A1.1 | විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් | ◇ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වන අතර, විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවශ්‍ය අවස්ථාවල කැඳවනු ලැබේ.<br>◇ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල පැමිණීම 37 පිටුවේ වගුව තුළ විස්තර කෙරේ. | අනුකූලවිය |
| A1.2 | අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් සහ කාර්යභාරයන් | අධ්‍යක්ෂ මණ්ඩලය පහත වගකීම් භාරගනිමින් ව්‍යවසායකත්වමය නායකත්වය ලබාදිය යුතුය.<br>◇ ක්‍රමෝපාය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම<br>◇ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ දක්ෂතාව සහ අනුප්‍රාප්තිය<br>◇ තොරතුරුවල අවංකකම, අභ්‍යන්තර පාලන,ව්‍යාපාර අඛණ්ඩතාවය සහ අවදානම් කළමනාකරණය<br>◇ නීති, රෙගුලාසි සහ සදාචාර ප්‍රමිතිවලට අනුකූලතාව<br>◇ තීරණ ගැනීමේ දී සියලුම පාර්ශ්වකරුවන්ගේ යහපත සලකා බැලීම<br>◇ තිරසාර ව්‍යාපාර සංවර්ධනය<br>◇ සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීම සහ මූල්‍ය රෙගුලාසිවලට අනුකූලවීම. | අනුකූලවිය |
| A1.3 | රටේ නීතියට අනුකූලව කටයුතු කිරීම | සමාගම අදාළ නියමයන්, නීති සහ රෙගුලාසිවලට අනුකූල වන බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි. | අනුකූලවිය |
| A1.4 | සමාගමේ ලේකම්ගේ උපදෙස් හා සේවය සඳහා ප්‍රවේශය | ◇ එකවුන්ටින් සිස්ටම්ස් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් අධ්‍යක්ෂ මණ්ඩලයට එහි රාජකාරී සහ වගකීම් මුදාහැරීමට සහ ආයතනික පාලනය තුළ මනා පරිචයන් ප්‍රවර්ධනය කිරීමට මඟ පෙන්වමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ලෙස කටයුතු කරයි.<br>◇ එමෙන්ම පිළිපැදීමට අවශ්‍යවන නව නීති සහ රෙගුලාසි සම්බන්ධයෙන් ලේකම් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරයි. | අනුකූලවිය |
| A1.5 | ස්වාධීන විනිශ්චය | අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ කරුණු පිළිබඳ ස්වාධීනව ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට අධ්‍යක්ෂවරුන්ට සමාන අවස්ථාව ඇත. | අනුකූලවිය |
| A1.6 | අධ්‍යක්ෂ මණ්ඩලය සහ සමාග මට අදාළ කරුණුවලට ප්‍රමාණවත් කාලය සහ උත්සාහය යොමු කිරීම | සියලුම අධ්‍යක්ෂවරුන්ට අවශ්‍යනම් අමතර තොරතුරු සහ පැහැදිලි කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් සහතික කිරීමට එක් එක් රැස්වීම පිළිබඳ දැන්වීම, න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ලබා දේ. | අනුකූලවිය |
| A1.7 | අවශ්‍යනම්, සමාගමේ පොදු යහපත උදෙසා, අධ්‍යක්ෂවරුන්ගෙන් තුනෙන් එකකට අධ්‍යක්ෂ මණ්ඩල වෙත ඉදිරිපත් කිරීමට යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය. | | අදාළ නැත |
| A1.8 | අධ්‍යක්ෂ මණ්ඩල ආරම්භය සහ පුහුණුව | අභ්‍යන්තර සහ බාහිර වාතාවරණය සම්බන්ධයෙන් අදාළ තොරතුරු පිළිබඳ සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ, විධායක අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය විසින් අධ්‍යක්ෂවරු විධිමත්ව යාවත්කාලීන කරනු ලබයි. | අනුකූලවිය |

# ආයතනික පාලනය

| යොමු අංකය | ආයතනික පාලන මූලධර්මය | අනුකූලතාව පිළිබඳ විස්තර | අනුකූලතා තත්ත්වය |
|---|---|---|---|
| A.2 | සභාපති හා ප්‍රධාන විධායක නිලධාරියා අතර වගකීම් බෙදීම | ◊ 2017 ජුනි 01 දින සිට සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂගේ කාර්යභාරය තුළ පැහැදිලි වෙනසක් ඇත<br>◊ සභාපතිගේ කාර්යභාරය වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබාදීමයි.<br>◊ කළමනාකාර අධ්‍යක්ෂගේ කාර්යභාරය වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින් වර අනුමත කරන ක්‍රමෝපායික මඟපෙන්වීම, ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාපටිපාටි මත පදනම් වී ආයතනයේ එදිනෙදා කටයුතු කළමනාකරණය කිරීමයි. | අනුකූලවිය |
| A.2.1 | එක් පුද්ගලයෙක් තුළ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරියාගේ රාජකාරි සංයෝග කිරීම සාධාරණ කිරීම | 2019 සැප්තැම්බර් 12න් පසු, සභාපති තනතුර ඇබෑර්තු වූ අතර කළමනාකාර අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ එම්.ආර්.එම්. ආබ්දීන් මහතා නියෝජ්‍ය සභාපති ලෙස කටයුතු කරන ලදී. | අනුකූලවිය |
| A.3 | යහපත් ආයතනික පාලනය පවත්වා ගැනීමේදී සභාපතිගේ කාර්යභාරය | සභාපති අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබාදෙමින් පහත දෑ සහතික කරයි.<br>◊ අධ්‍යක්ෂවරුන්ගේ ඵලදායී සහභාගිත්වය සහ දායකත්වය.<br>◊ විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරු අතර බල තුලනය.<br>◊ සැලකීම යටතේ ඇති ගැටළු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ අදහස් නිශ්චය කෙරේ.<br>◊ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ කටයුතු පිළිබඳ සම්පූර්ණ පාලනය යටතේ සිටින අතර සියලුම පාර්ශ්වකරුවන්ට එහි බැඳීම් පිළිබඳ පරීක්ෂාවෙන් සිටී. | අනුකූලවිය |
| A.4 | මූල්‍ය විචක්ෂණභාවය ලබාගැනීම | සමාගමේ මූල්‍ය කරුණු කළමනාකරණය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයට මඟපෙන්වීමට අවශ්‍ය මූල්‍ය දැනුම සහ ප්‍රවීනත්වය සහිත වෘත්තිකයින් තිදෙනෙක් අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටී.<br>◊ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරයෙක් වන නිමල් ජයසුන්දර මහතාට ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත මූල්‍ය කටයුතු පිළිබඳ වසර 38කට වැඩි පළපුරුද්ද ඇත.<br>◊ ප්‍රමෝද් ජේන් මහතා ඉන්දියාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ සමාජිකයෙක් මෙන්ම ඉන්දියාවේ පිරිවැය හා කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙක් ද වන අතර, දිල්ලි විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී (ගෞරව) උපාධිය ලබා ගෙන ඇත.<br>◊ කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය මහ භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරියක් වන අතර, ඇයට රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුළුල් පළපුරුද්ද ඇත. | අනුකූලවිය |
| A.6 | සුදුසු සහ කාලීන තොරතුරු ලබාදීම | අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ න්‍යාය පත්‍රය නියමිත රැස්වීමට පෙර අධ්‍යක්ෂවරුන්ට අදාළ තොරතුරු පිළිබඳ ප්‍රමාණවත් විස්තරයක් ලබාදීමට කලින්ම බෙදාහරිනු ලබයි. | අනුකූලවිය |
| A.7 | අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම | අධ්‍යක්ෂවරු සාංගමික ව්‍යවස්ථාවලියේ නියමයන්ට යටත්ව වාර්ෂික මහ සභා රැස්වීමක් තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරයි.<br>2019 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනස්වීම් 35 පිටුවේ වගුව තුළ දැක්වේ. | අනුකූලවිය |

# ආයතනික පාලනය

| යොමු අංකය | ආයතනික පාලන මූලධර්මය | අනුකූලතාව පිළිබඳ විස්තර | අනුකූලතා තත්ත්වය |
|---|---|---|---|
| **B** | **අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය** | | |
| B.1 | විධායක සහ අධ්‍යක්ෂ පාරිශ්‍රමිකය පිළිබඳ ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා ක්‍රියාවලිය ස්ථාපනය | | අනුකූලවිය |
| B.2 | පාරිශ්‍රමිකයේ මට්ටම එය සැකසීම | | අනුකූලවිය |
| B.3 | ගෙවන ලද අධ්‍යක්ෂ මණ්ඩල මුළු පාරිශ්‍රමිකය අනාවරණය කිරීම | මූල්‍ය තොරතුරු - විස්තරාත්මක ආදායම් ප්‍රකාශනය | අනුකූලවිය |
| **C** | **කොටස්හිමියන් සමඟ සම්බන්ධතා** | | |
| C.1 | වාර්ෂික මහ සභා රැස්වීම ප්‍රයෝජනවත්ව භාවිතා කිරීම සහ මහ සභා රැස්වීම් පැවැත්වීම | | අනුකූලවිය |
| C.2 | කොටස්හිමියන් සමඟ සන්නිවේදනය | කාලීන තොරතුරු බෙදාහැරීමට අනෙකුත් කොටස්හිමියන් දෙදෙනා සමඟ විධිමත් මාර්ග සමාගමට ඇත. | අනුකූලවිය |
| C.3 | සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ඇතුළුව සියලුම යෝජිත වැදගත් ගනුදෙනු අධ්‍යක්ෂවරු විසින් කොටස්හිමියන්ට අනාවරණය කළ යුතුය. | | අනුකූලවිය |
| **D** | **වගවීම හා විගණනය** | | |
| D.1 | මූල්‍ය වාර්තාකරණය | ◇ වාර්ෂික වාර්තාවෙන් මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය, ව්‍යාපාර ආදර්ශය, පාලන ව්‍යුහය, අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනයන්, අභියෝග සහ අවස්ථා පිළිබඳ සමබර සමාලෝචනය සහතික කිරීමට සියලුම පියවර ගනු ලබයි.<br>◇ වාර්ෂික වාර්තාව සහ අනෙකුත් අතුරු වාර්තා පිළියෙල කිරීමේදී, සමාගමට අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම.<br>◇ පහත සඳහන් අනාවරණයන් සංග්‍රහය මගින් උපදෙස් ලබාදී ඇති පරිදි වාර්ෂික වාර්තාවේ ඇතුළත් කෙරේ.<br>i. කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ - 19 සිට 32 දක්වා පිටු.<br>ii. අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව - 50 සිට 51 දක්වා පිට.<br>iii. සමාගමේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශනය - 61 පිටුව<br>iv. අඛණ්ඩතාව පිළිබඳ ප්‍රකාශනය - 50 පිටුව<br>v. අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය - 38 පිටුව<br>vi. ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව - 55 සිට 60 දක්වා පිටු<br>vii. වගකීම පිළිබඳ සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂගේ ප්‍රකාශනය - 08 සිට 09 දක්වා පිටු<br>viii. මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 19 හි අනාවරණය කරන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු<br>ix. කැඳවීමට ප්‍රාග්ධනයේ බරපතල අලාභ නොමැත<br>◇ රජයේ චක්‍රලේඛ පරිදි අමාත්‍යාංශය විසින් ඉල්ලා සිටින අනෙකුත් අතුරු වාර්තා සමාගම ඉදිරිපත් කර ඇත | අනුකූලවිය |

# ආයතනික පාලනය

| යොමු අංකය | ආයතනික පාලන මූලධර්මය | අනුකූලතාව පිළිබඳ විස්තර | අනුකූලතා තත්ත්වය |
|---|---|---|---|
| D.2 | අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලනය | ප්‍රතිපත්ති, අභ්‍යන්තර පාලනයන් සහ විගණන කමිටුවේ මඟපෙන්වීම සමඟ කාලීන නියාමනය ඇතුළත් කරමින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් යහපත් අවදානම් කළමනාකරණය රාමුවක් සමාගම විසින් යොදා ගනී. මේවා 43 පිටුවේ අවදානම් කළමනාකරණ අංශය සහ 55 පිටුවේ විගණන කමිටු වාර්තාවේ විස්තර කෙරේ. | අනුකූලවිය |
| D.3 | විගණන කමිටුව | විගණන කමිටුව සාමාජිකයින් 03 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති. එයට අභ්‍යන්තර විගණන අංශය විසින් සහය වේ. විගණන කමිටුවේ සංයුතිය සහ එහි කාර්යයන් වාර්ෂික වාර්තාවේ 52 පිටුවේ ඉදිරිපත් කෙරේ. | අනුකූලවිය |
| **E** | **ආයතනික ආයෝජකයින්** | | |
| | කොටස්හිමි ඡන්දය | සියලුම ආයතනික කොටස්හිමියන් කොටස්හිමියන්ගේ රැස්වීම්වලට සහභාගිවීමට සහ ඔවුන්ගේ අදහස් අදාළ සියලුම දෙනා වෙත සන්නිවේදනය කිරීමට දිරිගන්වනු ලබයි. | අනුකූලවිය |
| | පාලන අනාවරණ ඇගයීම | වාර්ෂික වාර්තාව ආයතනික පාලන ක්‍රියාවලිය විස්තර කරයි. | අනුකූලවිය |
| **G** | **අන්තර්ජාලය සහ සයිබර් ආරක්ෂාව** | | |
| | සයිබර් අවදානම් කළමනාකරණයට හා සමාගමේ අභ්‍යන්තර සහ බාහිර තොරතුරු තාක්ෂණ උපාංග ආයතන ජාලයට සම්බන්ධ කරන ආකාරය සඳහා ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලයට තිබිය යුතුය. | ◊ ආපදා පිළියම් කළමනාකරණ මධ්‍යස්ථාන (DRMC) ව්‍යාපෘතිය ක්‍රියාත්ම කිරීම<br>◊ ජාල පරාමිති ආරක්ෂාව, දත්ත අහිමිවීම, සයිබර් - ප්‍රෝඩාව සේවා ප්‍රහාර පිළිබඳ බෙදාහැරි ප්‍රතික්ෂේපකිරීම, විධිමත් පරීක්ෂාවන් සමඟ ජංගම උපාංග හා සැකකටයුතු සයිබර් කටයුතු නියාමනය සහ පාලනය පිළිබඳ සහතික කිරීම් කළමනාකරණය කිරීම සඳහා ජාල ආරක්ෂක තාක්ෂණය ක්‍රියාත්මක කිරීම හා නිරන්තර පරීක්ෂාවන් සිදුකිරීම<br>◊ උපස්ථ සර්වර් (Backup server) සහ පිළියම් සර්වර් (Recovery server)<br>43 පිටුවේ අවදානම් කළමනාකරණ වාර්තාව තුළ තවදුරටත් විස්තර කෙරේ | අනුකූලවිය |
| **H** | **පාරිසරික සහ සමාජීය සාධක පාලන වාර්තාකරණය** (ESG) | | |
| H.1 | ESG කාර්යසාධනය පිළිබඳ ප්‍රමාණවත් අනාවරණයක් ලබාදීම | වාර්ෂික වාර්තාව කාර්යසාධනය පිළිබඳ සාකල්‍ය සමාලෝචනයක් ලබා දේ. සමූහය විසින් භාවිතා කරන විවිධ ප්‍රාග්ධනයේ කාර්යසාධනය වාර්තාවේ වෙනම කොටස් තුළ විස්තර කෙරේ. | අනුකූලවිය |
| H.2 | ESG පාලනය | 31 පිටුවේ ස්වාභාවික ප්‍රාග්ධනය කොටස බලන්න | අනුකූලවිය |

# අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය සමාගම තුළ ක්‍රමෝපායික ප්‍රමුඛතාවක් වන අතර, ව්‍යාපාරය සඳහා වටිනාකම ලබාදීමේ දී අත්‍යවශ්‍ය ලෙස සලකනු ලබයි. පාලනය කළ පරිසරයක් තුළ වර්ධන සැලසුම් ලබාදීමට සමාගමට සහයවන අවදානම් කළමනාකරණ හැකියාවන් සහ අභ්‍යන්තර පාලනය පිළිබඳ විධිමත් ක්‍රම CPSTL විසින් අඛණ්ඩව ගොඩ නගයි.



යහපත් අවදානම් කළමනාකරණ පරිචයන් දිගුකාලීන වර්ධනය සඳහා තීරණාත්මක බව CPSTL දැඩිව විශ්වාස කරයි. සමාගමේ පරමාර්ථය වන්නේ අඛණ්ඩ පැවැත්මක් ලෙස මෙහෙයුම්වලට අහිතකර අයුරින් බලපෑ හැකි සියලුම සාධක ඉහලයාමේ සහ පහළයාමේ හැකියාව සැලකිල්ලට ගනිමින් ආයතනයේ සියලුම කටයුතු සඳහා උපරිම තිරසාර වටිනාකමක් එකතු කිරීමයි. අවදානම් කළමනාකරණය අඛණ්ඩ සහ සංවර්ධන ක්‍රියාවලියක් වන අතර, එය ආයතනික ක්‍රමෝපාය සහ එහි ක්‍රියාත්මක කිරීම තුළ වැදගත් භූමිකාවක් ඉටු කරයි.

අවදානම් කළමනාකරණ ක්‍රමෝපාය සමාගමේ ආයතනික පාලනය, කළමනාකරණ තීරණ සහ ව්‍යාපාර ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය කොටසකි. ඒකාබද්ධ අවදානම් කළමනාකරණය ඉහළ සිට පහළ දක්වා මෙහෙයුම්වල ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා වැදගත් වේ. ව්‍යාපාර සැලසුම් කිරීම සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියට අවදානම් කළමනාකරණ වැඩසටහන් ඇතුළත් කිරීම තුළින් සැලසුම් කිරීම, වාර්තාකරණය, විගණනය සහ කළමනාකරණ තොරතුරු පද්ධති අතර ඵලදායී ඒකාබද්ධ කිරීමක් ලබා දෙනු ඇත.

සමාගමේ ව්‍යාපාර අවදානම් සඳහා සාධක ගණනාවක් බලපාන අතර ඒවා සියල්ලම සමාගමේ පාලනය යටතේ නොමැත. ආයතනික කීර්තිනාමය, ආරක්ෂාව, පරිසරය, සෞඛ්‍යය හා ආරක්ෂක ගැටළු, නිෂ්පාදනවල තත්ත්වය සහ තොරතුරු තාක්ෂණය වැනි සාමාන්‍ය ව්‍යාපාර අවදානම් නිරාවරණ සමඟ බාහිරින් ඇතිවන අභියෝග සමාගමේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ කොටසක් ලෙස අඛණ්ඩව සමාලෝචනය කෙරේ.

### අවදානම් පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලයට ක්‍රමෝපායික මඟපෙන්වීම් ලබාදීම සහ අවදානම් කළමනාකරණය කිරීම සඳහා අවසාන වශයෙන් වගකීම ඇත. අවදානම් සඳහා පැහැදිලි වගකීමක් සහිතව අවදානම් කාලීනව හඳුනාගැනීම පහසු කිරීමට අවදානම් පාලන ව්‍යුහයක් ඔවුන් විසින් ක්‍රියාවට නංවා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය, විගණන කමිටුව සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සමාගම තුළ කළමනාකරුවන්ට සහ සේවකයින්ට මඟ පෙන්වමින් සහ සහයවෙමින් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය මෙහෙයවනු ලබයි.

**අධ්‍යක්ෂ මණ්ඩලය**

අවදානම් රුචිය සැකසීම, අවදානම් ක්‍රමෝපාය සන්නිවේදනය සහ අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිපත්ති අනුමත කිරීම සඳහා අවසාන වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී.

**විගණන කමිටුව**

මෙම කමිටුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන වාර්තා අගයමින් අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණත්වය සමාලෝචනය කරන අතර බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය සහ කාර්යසාධනය ඇගයීමට ලක් කරයි. එමෙන්ම මෙම කමිටුව එක් එක් දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරන අවදානම් සමාලෝචනය කරන අතර සමාගම විසින් ගනු ලබන පියවර අනුමත කරයි. එබැවින් එකී අවදානමෙන් ඇතිවන බලපෑම පාලනය කර අවම කර ගත හැක.

**ක්‍රියාත්මක ප්‍රධානීන්**

කාර්ය ප්‍රධානීන් ඔවුන්ට අයත් දෙපාර්තමේන්තුව තුළ අවදානම් පාලනය සඳහා සහ අවදානම් අවම කිරීමට සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක වන බවට සහ ඒවා සමාගමේ අවදානම් කළමනාකරණ ප්‍රමිති සහ අභ්‍යන්තර පාලන ක්‍රම සමඟ අනුකූල වන බවට සහතික කිරීම සඳහා මූලිකවම වගකීමට බැඳී සිටී.

**අභ්‍යන්තර හා බාහිර විගණන**

අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්යභාරය වන්නේ ආයතනයේ අවදානම් කළමනාකරණය පාලනය සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ඵලදායීව ක්‍රියාත්මක වන බවට ස්වාධීන තහවුරු කිරීමක් ලබාදීමයි.
සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සහ සමාගමේ මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය පිළිබඳ සාධාරණ සහ සත්‍ය නියෝජනය පිළිබඳ යුක්ති සහගත සහතික කිරීමක් ලබාදීමට අභ්‍යන්තර විගණකවරු වගකීමට බැඳී සිටී.

# අවදානම් කළමනාකරණය

## අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

අවදානම් කළමනාකරණය යනු අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර, එය සමාගමේ කාර්යසාධන සමාලෝචනයට සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඇතුළත් කර ඇත. අවදානම් කළමනාකරණයේ අරමුණ වන්නේ සිදුවිය හැකි ප්‍රශ්න සිදුවීමට පෙර හඳුනා ගැනීම වන අතර ඒ තුළින් අවදානම් මෙහෙයවීමේ කටයුතු අවශ්‍ය පරිදි සැලසුම් කර ක්‍රියාත්මක කිරීම හෝ අරමුණු අත්කර ගැනීම කෙරෙහි බලපෑම් අවම කිරීමට කටයුතු කිරීමයි.

අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පියවර හතරකින් සමන්විත වේ.

### 01. අවදානම් ඇගයීම

ව්‍යාපාරයට අභ්‍යන්තර හා බාහිර පරිසරයෙන් ඇතිවන වර්තමාන, අනාගත සහ සිදුවිය හැකි අවදානම් හඳුනාගැනීම, විශ්ලේෂණය කිරීම සහ ඇගයීම පිළිබඳ ක්‍රමානුකූල ක්‍රියාවලියකි.

### 02. අවදානම් පිළියම/ අවදානම් අවමකිරීම

අවදානම් කළමනාකරණය යනු අවදානමක් අවම කිරීමට ගන්නා ක්‍රියාමාර්ගයකි. සමාගම විසින් අවදානම වලක්වා ගැනීම, මාරුකිරීම, අඩුකිරීම හෝ පිළිගැනීම සිදුකළද, එය අවදානමේ ස්වභාවය සහ ඇගයීම මත රඳා පවතී.

### 03. නියාමනය සහ සමාලෝචනය

අවදානම නියාමනය යනු ඉදිරියට යන අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර ඒ තුළින් ක්‍රියාත්මකව පවත්නා අවදානම් කළමනාකරණ ක්‍රමෝපායන්ට අවශ්‍ය ගැලපීම් හඳුනාගනී.

### 04. සන්නිවේදනය සහ උපදේශනය

සන්නිවේදනය සහ උපදේශනය අවදානම කළමනාකරණය තුළ වෙනස් අවස්ථාවක් නොවන නමුත් සමස්ත ක්‍රියාවලිය තුළ ක්‍රියාත්මක වේ. ආයතනයක කාර්ය මණ්ඩලයේ සෑම දෙනාම තම කාර්යභාරයට අනුව ආයතනයේ අවදානම් ක්‍රමෝපාය, අවදානම් ප්‍රමුඛතා සහ අදාළ වගකීම් පිළිබඳ දැනුවත් බවට ආයතනයක් විසින් සහතික කළ යුතුය. අනෙකුත් කරුණු අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්වලට යහපත් අභ්‍යන්තර තොරතුරු සහ සන්නිවේදනය ක්‍රියාවලිය සහතික කිරීම සහ අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය පිළිබඳ බාහිර ප්‍රචාරණය සඳහා වගකීම ඇතුළත්ය.



# අවදානම් කළමනාකරණය

**අවදානම් කළමනාකරණයට සමාගමේ ප්‍රවේශය**

අවදානම විධිමත්ව හඳුනාගෙන පාලනය සහ අවම කිරීම සඳහා පහත සාරාංශ කර ඇති පරිදි දෙයාකාර ආරක්ෂක ආදර්ශ සමාගම යොදා ගනී

| පළමු පෙළ ආරක්ෂක උපක්‍රමය |
|---|
| **කාර්ය ප්‍රධානීන්** |
| කාර්ය ප්‍රධානීන් ඔවුන්ගේ කාර්යයන්ට අදාළවන අවදානම් හඳුනාගැනීම, මැනීම, නියාමනය,වාර්තාකරණය සහ කළමනාකරණය සඳහා වගකීමට බැඳී සිටී.<br><br>සමාගම අභ්‍යන්තර පාලනය පිළිබඳ විස්තීර්ණ ක්‍රමයක් නිර්මාණය කර ඇති අතර, ඒ තුළින් අදාළ අවදානම් සොයාගැනීම, කළමනාකරණය කිරීම සහ වැලැක්වීම සඳහා අංශ ප්‍රධානීන්ට හැකියාව ඇති කරමින් සියලුම ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ආවරණය කරයි. |
| **දෙවැනි පෙළ ආරක්ෂක උපක්‍රමය** |
| **අභ්‍යන්තර විගණනය සහ බාහිර විගණනය** |
| අභ්‍යන්තර විගණනය මගින් අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලන රාමුවේ ප්‍රමාණතාව සහ ඵලදායිත්වය පිළිබඳ ස්වාධීන තක්සේරු කිරීමක් විගණන කමිටුවට ලබා දේ.<br><br>බාහිර විගණකවරුන් ස්වාධීන ආයතනයක් වන අතර, ඔවුන්ගේ වගකීම වන්නේ සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සහ සාධාරණ සහතික කිරීමක් ලබාදීමයි |

**සමාගමට බලපාන මූලික අවදානම් පිළිබඳ දළ විශ්ලේෂණය**

| අවදානම | මූලික ධාවකයින් | අවම කිරීමේ ක්‍රමෝපායන් |
|---|---|---|
| **ස්වභාවික උවදුරු සහ අවිනිශ්චිතතා** | | |
| අපගේ මෙහෙයුම්වලට අපගේ පාලනයෙන් තොර ස්වාභාවික ආපදා සහ වෙනත් සිදුවීම් බලපානු ලැබේ  | ◇ ගංවතුර, නායයාම් සහ දරුණු කුණාටුවලින් බාධා | ◇ රක්ෂණ ආවරණ හඳුනාගත් සමහර අවදානම් වලට ලබාගැනීම |
| **ත්‍රස්තවාදී ප්‍රහාර** | | |
| ශ්‍රී ලංකාව තුළ පාස්තු ඉරිදා දින මාරාන්තික මරාගෙන මැරෙන බෝම්බ දැමීම, 2009 දී සිවිල් යුද්ධය අවසන් කිරීමෙන් පසුව ඇතිවූ දරුණුම අර්බුදය ලෙස ආර්ථිකය කම්පනයට පත් කරන ලදී  | | ◇ සමාගම ආර්ථිකයේ මර්මස්ථානයක් වන බැවින්, ආයතනය තුළ ඉහළ ආරක්ෂක ක්‍රියාමාර්ග සහ පාලනයන් ක්‍රියාත්මක කෙරේ. |

# අවදානම් කළමනාකරණය

| මෙහෙයුම් අවදානම | | |
|---|---|---|
| මෙහෙයුමට අදාළ උවදුරු සමාගමට බලපෑ හැකිය.<br> | ◊ අනපේක්ෂිත කාන්දුවීම්/නළ මාර්ගවලට හානිවීම් මෙහෙයුම් ප්‍රමාදයට හේතු වේ<br>◊ සැපයීම්, යටිතල පහසුකම් හෝ මනා සංවිධානයේ බාධාවන් අනතුරු<br>◊ විශාල ප්‍රමාණයේ ගිනි | ◊ කාන්දුවීම්/ හානිවීම් අවම කිරීම පිණිස නළමාර්ග විධිමත්ව සේවා කිරීම සහ නඩත්තු කිරීම.<br>◊ හානිකර බලපෑම අවම කිරීම සඳහා සේවකයින් ප්‍රමාණවත්ව පුහුණු කිරීම.<br>◊ CPSTL අභ්‍යන්තර ගිනි සේවා ඒකකයක් ස්ථාපිත කර ඇත. |

| තරඟකාරී අවදානම | | |
|---|---|---|
| අනෙකුත් පර්යන්ත සමාගම් වලට අපගේ පාරිභෝගිකයන් සඳහා වඩා අඩු මිලකට ඉතා හොඳ ගබඩා පහසුකම් ලබාදිය හැකි නම්, ඉන් ඇතිවන තරඟය අපගේ මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිඵල වලට අහිතකර ලෙස බලපෑ හැකිය. | ◊ CPSTL හි කොටස්හිමියන් දෙදෙනෙක් වන අනෙකුත් පර්යන්ත සමාගම් (CPC සහ LIOC) දෙකේ තරඟයට අපි මුහුණ දෙමු | ◊ බවුසර් සමුදාය වැඩිකිරීම, ගබඩා පහසුකම වැඩිකිරීම හෝ වෙනත් ආකාරයෙන් දැනට පවත්නා පර්යන්ත පුළුල් කිරීම.<br>◊ නිවැරදි දක්ෂතා සහිත සේවකයින් බඳවා ගැනීම පුහුණු කිරීම සහ මෙහෙයවීම මගින් ඉහළ සේවා ප්‍රමිති පවත්වා ගැනීම.<br>◊ අපගේ තරඟකරුවන්ට ඉදිරියෙන් සිටීම සඳහා, නව තාක්ෂණය යොදා ගනිමින් වෙනස්වන පාරිභෝගික වරණයන් සපුරාලීම සඳහා පර්යේෂණ හා සංවර්ධනය තුළින් නව්‍යකරණ කෙරෙහි අඛණ්ඩ අවධානය යොමු කිරීම |

| නෛතික අවදානම | | |
|---|---|---|
| අපගේ මෙහෙයුම් ශ්‍රී ලංකා නීති සහ නිෂ්පාදන තත්ත්ව පිරිවිතරවලට අදාළ රෙගුලාසිවලට යටත් වන අතර, අප බෙදාහරින සමහර නිෂ්පාදන තත්ත්ව පිරිවිතර සපුරාලීමට අසමත්වීමේ ප්‍රතිඵලයක් ලෙස අපගේ වෙළෙන්ඳන් විසින් අපට විරුද්ධව ඉදිරිපත්කරන හිමිකම් ඉල්ලීම් මත පදනම් වී අපිට අලාභවලට මුහුණ දීමට සිදුවේ. | ◊ නිෂ්පාදන තත්ත්ව පිරිවිතර හෝ වාෂ්ප පීඩනය, සල්ෆර් අන්තර්ගතය, එතනෝල් අන්තර්ගතය සහ බයෝඩීසල් අන්තර්ගතය ඇතුළුව සම්මිශ්‍රණ අවශ්‍යතාවය මත නෛතික අවශ්‍යතාව<br>◊ අපගේ මෙහෙයුම්වලට අදාළවන නිෂ්පාදන තත්ත්ව නීති කඩකිරීම සැලකියයුතු දඩ සහ දණ්ඩනවලට මෙන්ම සෘණාත්මක ප්‍රචාරණයට යටත් විය හැක<br>◊ ජනතාවගේ භාවිතය සඳහා පිරිවිතරයට අඩු (උප ප්‍රාමාණික) නිෂ්පාදන බෙදාහැරීම නිසා එන්ජින් ක්‍රියාකාරිත්වය දුර්වල විය හැකිය. එමෙන්ම එමගින් එන්ජිමට හානියක් පවා සිදුවිය හැකි අතර අලාභ ගෙවීම් වලට හා සෘණාත්මක ප්‍රචාරයන්ට හේතු විය හැක. | ◊ ඕනෑම වර්ගයක පෙට්‍රෝලියම් ඉන්ධන පරීක්ෂාව සඳහා නවීන රසායනාගාරයක් CPSTL සතුවන අතර නියාමනය සහ සහතික කිරීමට අනුකූලව දැඩි තත්ත්ව පාලන යාන්ත්‍රණයක් අනුගමනය කරයි.<br> |

# අවදානම් කළමනාකරණය

| සෞඛ්‍ය, ආරක්ෂාව සහ පාරිසරික අවදානම | | |
|---|---|---|
| සංකීර්ණ සහ නිතරම වෙනස්වන, පාරිසරික, සෞඛ්‍ය සහ ආරක්ෂක නීති සහ රෙගුලාසිවලට අනුකූලවීම සඳහා සමාගමට සැලකිය යුතු පිරිවැයක් සහ වගකීම්ක් දැරීමට සිදුවේ. | ◊ සමාගම විසින් මෙහෙයවන ප්‍රධාන නිෂ්පාදන ගිනිගන්නා සුළු බැවින් මෙහෙයුම් කටයුතු ඉහළ අවදානමක් යටතේ පවතී. සුළු වැරදීමක් වුවද විශාල ප්‍රමාණයේ ගින්නකට හේතු විය හැකි අතර එය සමාගමේ මෙහෙයුම් මෙන්ම රටේ ආර්ථිකය කඩාවැටීමකට හේතු වේ.<br>◊ ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩාකිරීම, මෙහෙයවීම සහ ප්‍රවාහනය මගින් පරිසරයට හානිකර ද්‍රව්‍ය සහ වායු මුදාහැරීම හා බැහැර කිරීම සිදුවිය හැක.<br>◊ අපගේ ව්‍යාපාරය අහඹු පිටාර ගැලීම්, කාන්දුවීම්, ඛනිජතෙල් බැහැරකිරීම් හෝ නිදහස් කිරීම් හෝ පරිසරයට සහ අවට ප්‍රදේශවලට උවදුරු සිදුවීම් වියහැකි අතර, ඒවා විමර්ශණය කර පිළියම් යෙදීම සඳහා සැලකියයුතු වගකීමක් දැරීමට සිදුවේ.<br>◊ අදාළ පාරිසරික, සෞඛ්‍ය සහ ආරක්ෂක නීති සහ රෙගුලාසිවලට අනුකූලවීමට අසමත්වීම, පරිපාලන, සිවිල් හෝ සාපරාධී දණ්ඩනවලට, බලපත් අහෝසිවීමකට, අපගේ මෙහෙයුම් සියල්ල හෝ කිහිපයක් සීමා කිරීමට හෝ තහනම් කිරීමක් ඇතුළු සම්බාධකයන්ට යටත් විය හැකිය. | ◊ CPSTL සතුව අභ්‍යන්තර ගිනි සේවා ඒකකයක් ප්‍රථමාධාර පුහුණුව, ගිනි නිවීමේ පෙරහුරු, ආරක්ෂිත පුහුණුව සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ඇත. ගිනි ආරක්ෂණ උපකරණ අඛණ්ඩව පරීක්ෂා කර සුදුසු තත්ත්වයේ ඇති බවට සහතික කරයි උදා- කලින් කල ගිනි සයිරන් නලා සේවා කර පරීක්ෂා කිරීම, කාර්යාල උපකරණ තෙල්දමා සහ නළ මාර්ග පරීක්ෂා කිරීම<br>◊ CPSTL විසින් කලින් කල විධිමත් ටෙන්ඩර් ක්‍රියාවලියක් තුළින් රොන්මඩ තෙල් බැහැරකරමින්, එම අපද්‍රව්‍ය පරිසරයට හානි නොවන බව සහතික කරයි<br>◊ අවශ්‍ය ප්‍රමිතිය තුළ අපජලයේ ගුණාත්මක බව රඳා ගනිමින් අපජලය මුදාහැරීමේ ක්‍රමයක් පවත්වාගෙන යයි.<br>◊ විධිමත් පරිදි අපද්‍රව්‍ය වෙන්කිරීමේ සහ බැහැර කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.<br>◊ නළමාර්ග/ අක්වෙරළ කාන්දුවීම් හැසිරවීම සඳහා මනාව පුහුණුව ලත් සේවකයින් යෙදවීම. |

| සයිබර් අවදානම | | |
|---|---|---|
| අපගේ වත්කම් මෙහෙයවීමට සහ අපගේ ව්‍යාපාරය කළමනාකරණය කර ගැනීමට අපි තාක්ෂණික පද්ධති භාවිතා කරමු. අපගේ තොරතුරු තාක්ෂණ පද්ධතිය සයිබර් ප්‍රහාරයකට හෝ වෙනත් ආරක්ෂක කඩකිරීමකට ලක්විය හැකි අතර, එය වැදගත් මෙහෙයුම් හෝ මූල්‍යමය පාලයන් කඩකිරීමකට හේතු වන අතර එමගින් අපගේ මෙහෙයුම්, වාණිජමය කටයුතු හෝ මූල්‍ය ක්‍රියාවලිය කඩාකප්පල්වීමක් සිදු විය හැක.<br> | ◊ හැකර්වරුන්ගේ (hackers) ඉලක්කගත ප්‍රහාරයක් හරහා සයිබර් සිදුවීමක බලපෑම, ඉලක්ක නොකළ ප්‍රහාරයක ප්‍රතිඵලයක් ලෙස එයට සමපාත අලාභය, අභ්‍යන්තර ප්‍රහාරය, අහඹු සයිබර් සිදුවීම හෝ මේවායේ එකතුවක්. | ◊ සම්පූර්ණයෙන් ක්‍රියාත්මක ආපදා පිළියම් කළමනාකරණ මධ්‍යස්ථානය (DRMC).<br>◊ ජාල පරාමිති ආරක්ෂාව, දත්ත අහිමිවීම, සයිබර්-ප්‍රෝඩාව, සේවා ප්‍රහාර පිළිබඳ බෙදාහැරීම් ප්‍රතික්ෂේප කිරීම, ජංගම උපාංග පාලනය යනාදිය සඳහා ජාල ආරක්ෂණ තාක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ විධිමත් පරීක්ෂාවන් සහ පාලන පිළිබඳ සහතික කිරීම් සිදුකිරීම.<br>◊ උපස්ථ සර්වර් (Backup server) සහ පිළියම් සර්ව (Recovery server) |

# අවදානම් කළමනාකරණය

| සේවක රඳවාගැනීමේ අවදානම | | |
|---|---|---|
| අපගේ අනාගත සාර්ථකත්වය අපගේ විධායක නිලධාරීන් සහ අනෙකුත් ප්‍රධාන පෙළේ නිලධාරීන්ගේ අඛණ්ඩ සේවය මත රඳා පවතී. අපගේ විධායක නිලධාරියෙකුගේ හෝ ප්‍රධාන පෙළේ නිලධාරියකුගේ සේවය අපට අහිමිවුවහොත් එමගින් අපගේ ව්‍යාපාරයේ මෙහෙයුම් ප්‍රතිඵල වලට සහ මූල්‍ය තත්ත්වයට හානි විය හැක. | ◊ දැනට පවත්නා උසස්වීම් ක්‍රමය සහ ක්‍රියාපටිපාටි පිළිබඳ සේවක අප්‍රසාදය වෘත්තිය සංවර්ධන අවස්ථා නොමැතිකම<br>◊ අගය නොකිරීමේ හැඟීම<br>◊ දුර්වල නායකත්වය<br>◊ නම්‍යශීලී නොවීම | ◊ සේවා හඳුනාගැනීම, ඇගයීම සහ උසස්වීම් ඇතුළත් ශක්තිමත් සේවක වටිනාකම් යෝජනා තුළින් සේවක අභිප්‍රේරණය පවත්වා ගැනීම.<br>◊ වෘත්තිය ප්‍රගතිය සඳහා අවස්ථාවන්<br>◊ අඛණ්ඩ සහභාගිත්වය සහ සමාජ සහ ශුභසාධන උත්සව පැවැත්වීම<br>◊ සියළුම සේවකයන් ආවරණය වන පරිදි පුහුණු, සංවර්ධනය සහ ව්‍යුහගත පුහුණු වැඩසටහන් සඳහා අඛණ්ඩ ආයෝජනය<br> |

| ආර්ථිකමය අවදානම | | |
|---|---|---|
| අපගේ මූල්‍ය ප්‍රතිඵල අපගේ පර්යන්ත තුළ අපි ඉටුකරනු ලබන සැහැල්ලු පිරිපහදු නිෂ්පාදන, බහුල පිරිපහදු නිෂ්පාදන, බොර තෙල් සහ අනෙකුත් අදාළ සේවා සඳහා ඉල්ලුම මත රඳා පවතී. පොදුවේ ආර්ථික පහත වැටීම් යම් තිරසාර කාලසීමාවක් සඳහා මෙම නිෂ්පාදනවල ඉල්ලුම ප්‍රධාන වශයෙන් පහළ වැටීමකට හේතු විය හැකිය. අපගේ පර්යන්තවල ගබඩා භාවිතය තුළ සැලකිය යුතු අඩුවීමකට එය හේතු විය හැකි අතර එය අපගේ මුදල් ප්‍රවාහයට සහ අපගේ කොටස්හිමියන් දෙදෙනාට බෙදාහැරීම සඳහා අපගේ හැකියාව අඩුකිරීමකට මඟ පාදනු ඇත. | ◊ බොර තෙල් සඳහා මිල සූත්‍රය යෙදීමෙන් ගෝලීය වෙළෙඳපොල තුළ බැරැලයක මිල අනුව ඉන්ධන මිල අඛණ්ඩව වෙනස් වේ.<br>◊ තීරුබදු/බදු, පොළී අනුපාත, උද්ධමනය, බලශක්ති මිල ගණන් මත රජයේ පවත්නා ප්‍රතිපත්ති ඉන්ධන ඉල්ලුම කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරයි. | ◊ අහිතකර ආර්ථික සාධක තුළින් ඇතිවන අවිනිශ්චිත මූල්‍ය අර්බුදවලට මුහුණදීම සඳහා කෙටිකාලීන සහ දිගුකාලීන මූල්‍ය වත්කම් වල ආයෝජනය<br>◊ අනෙකුත් මූලාශ්‍රවලින් ආදායම් වර්ධනය එනම්, රසායනාගාර පරීක්ෂණ ගාස්තු, පුද්ගලික බව්සර් සඳහා පුහුණුව/ගෙනයාමේ ගාස්තු, ගිනි නිවීමේ උපකරණ සේවා කිරීම, ක්‍රමාංකන ගාස්තු, කුලී ආදායම යනාදිය |

| තොග, දේපල හා උපකරණ අවදානම | | |
|---|---|---|
| ගබඩාකළ නිෂ්පාදනවල ගිනිගැනීමේ ස්වභාවය හේතු කොට ගෙන, රක්ෂණ ආවරණවල ප්‍රමාණවත් නොවන/ව්‍යාකූල ආවරණ, රක්ෂණ සමාගම් විසින් රක්ෂණ හිමිකම් අගරු කිරීමකට හේතු විය හැක. | | ◊ IBSL යටතේ ලියාපදිංචි රක්ෂණ සමාගම්වලින් ලබාගත් රක්ෂණය.<br>◊ CPSTL විසින් ගිනි හා වාණිජ රක්ෂණය, නැව්කඳ ඔප්පුව (අක්වෙරළ නළමාර්ග), නිෂ්පාදන රක්ෂණය, රථවාහන රක්ෂණය, ගබඩා ටැංකි හා උපකරණ යනාදිය වැනි ප්‍රමාණවත් රක්ෂණ ඔප්පු රැගෙන ඇත. |

# අවදානම් කළමනාකරණය

| | | |
|---|---|---|
| **සේවක සම්බන්ධතා අවදානම** | | |
| අපි රැස්වීමේ නිදහස පිළිබඳ අයිතිය හඳුනාගෙන ඇති බැවින්, අපගේ සේවකයින්ගෙන් 99%ක් පමණ වෘත්තිය සමිතිවලට අයත්ය. | ◊ වෘත්තිය සමිතිවල කම්කරු වැඩවර්ජන අනවශ්‍ය බාධා ඇති කරයි. | ◊ වෘත්තීය සමිති සමඟ සම්බන්ධතා ශක්තිමත් කිරීම හා එය භාවිතයෙන් ඔවුන් අවදානම් තර්ජන ඇති කිරීමට පෙර මැසිවිලි නිරාකරණය කිරීමට මෙය වේදිකාවක් ලෙස භාවිතා කිරීම.<br>◊ ගැටළුකාරී ක්ෂේත්‍ර හඳුනා ගැනීමට, වෘත්තීය සමිති නියෝජිතයින් සමඟ විධිමත් ව්‍යුහගත සාකච්ඡා පැවැත්වීම<br>◊ අදාළ ගැටළු සාකච්ඡා කිරීම සඳහා සේවකයින්ට විවෘත දොර ප්‍රතිපත්තිය. |
| **ඉන්ධන පර්යන්ත කර්මාන්තයට අදාළ විශේෂ කාර්යයන් සඳහා කොන්ත්‍රාත්කරුවන් ලබාගැනීමට නොමැතිකම/ සීමිතකම** | | |
| අවශ්‍ය සේවාවන් ඉක්මණින් සොයා ගැනීමේ අපහසුව හා ඉහළ වැඩ පිරිවැය | | ◊ රැකියාවන් සමඟ යෙදවීම මගින් දේශීය හවුල්කරුවන් සංවර්ධනය කිරීම. දේශීය හවුල්කරුවන් සමඟ සමීප හවුල්කරුවන් ලෙස විදේශීය හැකියාව සහිත හවුල්කරුවන්ගේ සහභාගිත්වය ශක්තිමත් කිරීම. |
| **දේශීය ප්‍රජාවගේ සම්බන්ධතා පිළිබඳ අවදානම** | | |
| අප ක්‍රියාත්මක ප්‍රජාවගේ සමාජ-ආර්ථික ප්‍රගතිය කරා සවිබලගැන්වීම සහ දායකවීම සමාගමේ ප්‍රතිරූපය සඳහා තීරණාත්මකය.<br>උදා- කොළඹ සිට කොලොන්නාව දක්වා නව නළමාර්ග ව්‍යාපෘතිය පිළිබඳ ගම්වැසියන්/පදිංචිකරුවන් අතර ආරවුල<br> | | ◊ ඉහළ මට්ටමේ ප්‍රජා සහභාගිත්වය සහ අපගේ ප්‍රජාව සමඟ අර්ථවත් සම්බන්ධතා පෝෂණය කිරීම.<br>◊ අඛණ්ඩව ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිවල ආයෝජනය.<br> |
| **වංචා සහ නීතිවිරෝධී කටයුතු** | | |
| කළමණාකරණයේ වංචා, සේවක වංචා සහ වෙනත් නීතිවිරෝධී කටයුතු පිළිබඳ අවදානම | | ◊ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය පිළිබඳ ස්වාධීන සහතිකය ලබාදීමට වෙනම අභ්‍යන්තර විගණන අංශයක් CPSTL සතු වේ.<br>◊ බලය බෙදීම අංශ ප්‍රධානීන්ගේ අධීක්ෂණය සහ අභ්‍යන්තර විගණන අංශයේ මඟපෙන්වීම යටතේ එක් එක් ක්‍රියාවලිය සඳහා සකස් කර ඇත.<br>◊ මූල්‍ය ප්‍රකාශනවල අවංකභාවය හා නිරවද්‍යතාව බාහිර විගණක විසින් ඇගයීමට ලක් කර ඇත. |

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධානවලට අනුව පිළියෙල කළ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමාගමේ කටයුතු පිළිබඳව වූ වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් ඉදිරිපත් කර සිටී.

මෙය අධ්‍යක්ෂවරුන් විසින් 2020 මාර්තු 02 දින අනුමත කරන ලදී.

## ප්‍රධාන කටයුතු

සමාගමේ ප්‍රධාන කටයුතු වන්නේ ශ්‍රී ලංකාවේ ඛණිජ තෙල් තොග ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ කටයුතු පහසු කිරීම සඳහා පිහිටුවන ලද පොදු භාවිත පහසුකම් සහ 2003 ඔක්තෝබර් 13 දිනැති අංක1310-8 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ වඩාත් පූර්ණ ලෙස විස්තර කර ඇති තෙල් පර්යන්තය, ගබඩා පහසුකම්, නළ මාර්ග, සහ ඉන්ධන ප්‍රවාහන මෙහෙයුම් සමාලෝචනය සහ මූල්‍යමය වැදගත් සිදුවීම්, වාහන යනාදියෙන් සමන්විත ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ යටිතල පහසුකම් අයිතිකාරීත්වය සමග ක්‍රියාත්මක කිරීමත් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් භුක්ති විඳින මුතුරාජවෙල සහ කොලොන්නාවේ ස්ථාපනයන් දිවයින පුරා පිහිටි තොග ගබඩා සහ අදාළ පහසුකම් කොළඹ වරායේ පිහිටි තෙල් පහසුකම් භාවිත කිරීමට අයිතිය සහ / හෝ බදු අයිතිය, එකස්ථාන පාවෙන බෝයාව සිට මුතුරාජවෙල ස්ථාපනය දක්වා වූ කොළඹ වරායේ සිට කොලොන්නාව ස්ථාපනය දක්වා නළ මාර්ගය ශාඛා සිට පාරිභෝගිකයින්ගේ සීමා දක්වා ගාලු වරායේ සිට මාගල්ල තොග ගබඩාව දක්වා නළ මාර්ගය ඉහත සඳහන් කළ ස්ථාපන සහ තොග තෙල් ගබඩා තුළ පිහිටි නළ මාර්ගයත් අයිති සහ /හෝ කාර්යයන් සහ/ හෝ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට අයත්ය

## මෙහෙයුම් සමාලෝචනය සහ මූල්‍යමය වැදගත් සිදුවීම්

රු.බි. 1.7ක ශුද්ධ ලාභයක් සමඟ රු.බි. 15.3ක ආදායමක් මෙහෙයුම්වලින් පෙන්වා ඇත.

| විස්තරය | 31.12.2019<br>රු. | 31.12.2018<br>රු. |
|---|---|---|
| පිරිවැටුම් | 15,339,875,966 | 13,130,224,803 |
| බදු පෙර ඉපයීම් | 2,927,856,033 | 1,522,230,109 |
| බදු පසු ලාභය/ (අලාභය) (PAT) | 1,765,326,987 | 197,317,904 |

## ප්‍රකාශිත ප්‍රාග්ධනය

2019 දෙසැම්බර් 31 දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 7,500,000,000/-කි. කොටස්හිමියන්ට බෙදාහැරීම පහත පරිදි වේ.

| | සාමාන්‍ය කොටස් |
|---|---|
| ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව | 500,000,000 |
| ලංකා ඉන්දියන් තෙල් සමාගම | 250,000,000 |

## දේපල, පිරියත හා උපකරණ

වසර තුළ දේපල, පිරියත හා උපකරණවල වෙනස්වීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 10 යටතේ දක්වා ඇත

## ලාභාංශ

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කොටසකට රු.0.48ක අතුරු ලාභාංශයක් අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ කරන ලදි.

## ආයතනික පරිත්‍යාග

වසර තුළදී රු. 3,781,450ක පරිත්‍යාග සහ අනුග්‍රාහක ගෙවීම් සමාගම සිදුකර ඇත.

## 2019 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂවරුන්

2019 දෙසැම්බර් 31 දිනට සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි විය;

එම්.ආර්.එම්. ආබ්දීන් මහතා
කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය
නිමල් ජයසුන්දර මහතා
සුරේෂ් පට්නේක් මහතා
ප්‍රමෝද් ජේන් මහතා
ෂාමල් සෙනරත් මහතා
ආනන්ද පාලිත මහතා
මනෝජ් කුමාර් ගුප්තා මහතා

## අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය

අධ්‍යක්ෂවරුන් විසින් ලබාගත් ගෙවීම් මූල්‍ය ප්‍රකාශනවල විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත

## සම්බන්ධතා ලේඛනය

2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධානවලට අනුව සමාගම සම්බන්ධතා ලේඛනයක් පවත්වාගෙන යයි. 2007 අංක 7 දරන සමාගම් පනතේ 192 (2) වගන්තියේ විධිවිධාන පරිදි සියලුම අධ්‍යක්ෂවරුන් ප්‍රකාශයන් සිදුකර ඇත. සමාලෝචිත වර්ෂය තුළ අදාළ සටහන් සම්බන්ධතා ලේඛනයේ තබා ඇත.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරු තම දැනුමේ සහ විශ්වාසයේ තරමට, සමාගම විසින් රජය සහ සේවකයින් සම්බන්ධයෙන් සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් මේ දක්වා ගෙවා දමා හෝ පොත්වල ප්‍රතිපාදනය කර ඇති බවට අධ්‍යක්ෂවරු සෑහීමට පත්වෙති.

## අඛණ්ඩතා පැවැත්ම

ව්‍යාපාර මෙහෙයුම් කරගෙන යාමට සමාගමට ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට අධ්‍යක්ෂවරුන්ට විශ්වාසය. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා අඛණ්ඩතා පැවැත්ම පදනම යොදා ගැනීම යෝග්‍ය බව අධ්‍යක්ෂවරු සලකා ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

### ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

සමාගම වෙත ප්‍රමාණවත් බලපෑම් ඇති කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කළ යුතු ගැලපීම් අවශ්‍ය කරන මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 22 යටතේ දක්වා ඇති ඒවා හැර ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදු වූ වැදගත් සිදුවීම් නොමැත.

### විගණකවරු

19 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව, සමාගමේ විගණකවරු වශයෙන් විගණකාධිපති හෝ ඔහු විසින් නම්කළ අයෙකු සමාගමට පත්කිරීම අවශ්‍ය වේ.

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ විගණනය ජාතික විගණන කාර්යාලය විසින් සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශවල විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ විගණකවරුන්ට ගෙවන ලද ගාස්තු හෙළිදරව් කර ඇත.

අධ්‍යක්ෂවරුන් දැනුවත්ව සිටින පරිදි, ඉහත හෙළිදරව්කළ පරිදි හැර විගණකවරන්ට සමාගම සමග කිසිම (විගණකවරයෙක් වශයෙන් හැර) සම්බන්ධතාවක් නොමැත. එමෙන්ම විගණකවරුන්ට සමාගමේ හෝ එහි සමූහ සමාගම්වල කිසිදු අයිතියක් නොමැත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ ආචාරධර්ම මාලාව අනුව ඔවුන් ස්වාධීන බවට තහවුරු කර සිටී.

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන්

එම්. උවයිස් මොහමඩ්
**සභාපති /කළමනාකාර අධ්‍යක්ෂ**

ඊ.ඒ. රත්නසීල
**අධ්‍යක්ෂ**

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ගිණුම්කරණ පද්ධති ලේකම් කාර්යාල සේවා (පුද්ගලික) සමාගම
**සමාගමේ ලේකම්වරු**

# විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

### සංයුතිය

විගණන හා කළමනාකරණ කමිටුව සාමාජිකයින් 03 කින් සමන්විත වන අතර, ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙති.

- කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය -සභාපතිවරිය
- ප්‍රමෝද් ජේන් මහතා - සාමාජික
- ආනන්ද පාලිත මහතා - සාමාජික

රාජ්‍ය වාණිජ ව්‍යවසායන් හි විගණන හා කළමනාකරණ කමිටුව පවත්වා ගැනීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද භාණ්ඩාගාර චක්‍රලේඛය තුළ දක්වා ඇති පරිදි වගකීම්, බලතල සහ විශේෂිත රාජකාරි ආවරණය කරමින් කමිටුවේ විගණන ප්‍රඥප්තිය සකස් කර ඇත.

### විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යයන්

කමිටුව විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ක්‍රියාවලින්හි විශ්වාසනියත්වය, යොදාගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ක්‍රමවල අනුරූපතාව ඒවායේ අනුකූලතාව සහතික කිරීම සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම සහ අනාවරණයන්හි ප්‍රමාණවත්බව තුළ සමාගම විසින් යොදාගනු ලබන මූල්‍ය වාර්තාකරණ ක්‍රමය සමාලෝචනය කරයි. එමෙන්ම, මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා, සමාගම් පනතේ සහ අනෙකුත් අදාළ මූල්‍ය වාර්තාකරණ රෙගුලාසි සහ අවශ්‍යතාවල තොරතුරු අවශ්‍යතාවන්ට සමාගමේ අනුකූලතාවයද කමිටුව විසින් සමාලෝචනය කරයි. තවද, මෙම කමිටුව විසින් අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණවත්බව සමාලෝචනය කරන අතර බාහිර විගණකවරුන්ගේ ස්වාධිනත්වය සහ කාර්යසාධනය ඇගයීමට ලක් කරයි. කමිටුව විසින් අනුමැතිය සහ නිකුතුව සඳහා මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කරයි. කමිටුව සමාගම අනාවරණය වන අවදානම් සමාලෝචනය කර සමාගම විසින් ගනු ලබන පියවර අනුමත කරයි. එවිට එකී අවදානම්වලින් ඇතිවන බලපෑම් කළමනාකරණය කර අවම කරයි.

### අභ්‍යන්තර විගණන

වත්කම් සුරක්ෂිත බවට සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රමය මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත්කිරීම සමඟ විශ්වාසී බවට අධ්‍යක්ෂවරුන් වෙත සාධාරණ සහතිකය ලබාදීම සඳහා සැලසුම් කර ඇති ගිණුම්කරණ ක්‍රම සහ මූල්‍ය පාලනයේ ඵලදායිත්වය ඇගයීම සඳහා අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ විෂයපථය හා ආවරණය කමිටුව සමාලෝචනය කරයි. අභ්‍යන්තර විගණන කාර්යය සමාගම තුළ ස්ථාපිත කර ඇත. විගණන නිර්දේශ පසුව ක්‍රියාත්මක කරන බව සහතික කිරීමට පසු විපරම් සමාලෝචන කලින් කල පැවැත්වීමට උපලේඛන ගත කර ඇත. අවදානම පදනම් අභ්‍යන්තර විගණනය යනු අභ්‍යන්තර විගණනයේ විෂයපථය පුළුල් කිරීම සඳහා 2018 වසර තුළ අළුතින් හඳුන්වාදුන් ප්‍රවේශයකි. අවදානම ශ්‍රේණිගතකිරීම තුළින් ඉක්මන් පිළියම් ක්‍රියාමාර්ග සඳහා එළිදැරවෙන ගැටළු කෙරෙහි වඩා ඉහළ අවධානයක් කළමනාකරණය වෙත ලබා දේ. අභ්‍යන්තර විගණනයේ විෂයපථය අනුමත අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය මගින් පාලනය කෙරේ.

### ව්‍යවස්ථාපිත විගණන

2018 ජාතික විගණන පනතට අනුකූලව විගණනයේ ස්වභාවය, ප්‍රවේශය සහ විෂයපථය සමාලෝචනය කිරීමට ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලයේ ව්‍යවස්ථාපිත විගණකවරු සමඟ කමිටුව කටයුතු කරයි. මතුවන ගැටළුවලට සහ ක්‍රියාත්මක අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වයට ප්‍රතිචාරාත්මකව කළමනාකාරිත්වය විසින් ගනු ලබන පියවර ද සාකච්ඡා කරයි.

### රැස්වීම්

සමාලෝචිත වසර තුළ, ඉහත දක්වා ඇති පරිදි කමිටුව වෙත පවරන ලද කාර්ය ඉටු කිරීමට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අටක් (08) පවත්වනු ලැබ ඇත.

වසර තුළ, විගණන කමිටු රැස්වීම්වල සාමාජිකයින්ගේ සහභාගිත්වය පහත පරිදි වේ.

| අනු අංකය | දිනය | කමිටුවේ ශක්තිය | සහභාගි වූ සාමාජිකයින් ගණන | සාමාජිකයින්ගේ නම් |
|---|---|---|---|---|
| 01. | 08.02.2019 | 02 | 02 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය<br>ප්‍රමෝද් ජේන් මහතා |
| 02. | 14.02.2019 | 02 | 02 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය<br>ප්‍රමෝද් ජේන් මහතා |
| 03. | 22.03.2019 | 02 | 02 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය<br>ප්‍රමෝද් ජේන් මහතා |
| 04. | 09.05.2019 | 02 | 02 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය<br>ප්‍රමෝද් ජේන් මහතා |
| 05. | 03.06.2019 | 02 | 02 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය<br>ප්‍රමෝද් ජේන් මහතා |
| 06. | 15.08.2019 | 02 | 02 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය<br>ප්‍රමෝද් ජේන් මහතා |
| 07. | 19.09.2019 | 03 | 03 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය<br>ප්‍රමෝද් ජේන් මහතා<br>ආනන්ද පාලිත මහතා |
| 08. | 25.11.2019 | 02 | 02 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය<br>ප්‍රමෝද් ජේන් මහතා |

# විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

### විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යභාරය

විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කළහැකි කාර්යයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා ක්‍රමෝපායික ගැටළු පිළිබඳ තීරණ හා නිර්දේශ කිහිපයක් සිදුකර ඇත.

- අභ්‍යන්තර පාලන ක්‍රමයේ ප්‍රමාණවත් බව කළමනාකරණය, විගණකාධිපති සහ අභ්‍යන්තර විගණකවරු සමඟ සමාලෝචනය කිරීම.
- මූල්‍ය ප්‍රකාශනවල විනිවිදභාවය අවබෝධ කර ගැනීමේ හැකියාව සහ විශ්වාසනියත්වය සහතික කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීම සහතික කිරීමට මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පාලනය කිරීම.
- අලාභ ලබන ඒකක නැවත සකස් කිරීම සඳහා ක්ෂණික සුදුසු කටයුතු යෝජනා කිරීම හෝ නිර්දේශ කිරීම සඳහා දරන ලද අලාභය සඳහා හේතු සහ බලපෑම හඳුනාගැනීම සහ විස්තරාත්මක විශ්ලේෂණ සහ අධ්‍යයන කරගෙන යන ලදි.
- වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහන, සැලකියයුතු විගණන සොයාගැනීම් සහ කාර්යය සැලැස්ම සමාලෝචනය.
- අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය විස්තීර්ණ සහ ඉදිරියට යන බව සහතික කරමින් පිළිගත් මට්ටමක් දක්වා අවදානම අවම කිරීම සඳහා අවදානම් සහ පිලියම් කටයුතු හඳුනා ගැනිම
- ඉහළ සිට ආරම්භ කරමින් ශක්තිමත් සහ ඵලදායී අභ්‍යන්තර පාලනය සඳහා ආයතනය අතර පුළුල් බැඳීමක් නිර්මාණය.
- නීති සහ රෙගුලාසි, සදාචාරය, බැඳියා පිළිගැටුම් සහ විෂමාචාරය සහ වංචාව විමර්ෂණය කිරීම සමඟ අනුකූලතාවයට අදාළ ආයතනික ප්‍රතිපත්ති සමාලෝචනය.
- තත්ත්වය, ප්‍රගතිය සහ නව සංවර්ධනයන් මෙන්ම ගැටළුකාරී ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ජ්‍යේෂ්ඨ කළමනාකරණය සමඟ අඛණ්ඩ සන්නිවේදනය.

### නිගමනය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS/LKAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කෙරේ. මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම යටතේ සකස් කෙරේ. සමාගමේ කටයුතු එහි ප්‍රතිපත්ති සමඟ අනුකූලව පාලනය කරන බවට සහ සමාගමේ වත්කම් විධිමත් ලෙස ගණනය කරන බවට සහ ප්‍රමාණවත් පරිදි සුරක්ෂිත කරන බවට සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අභ්‍යන්තර පාලනය තුළින් සාධාරණ සහතිකයක් ලබා දෙන බවට විගණන කමිටුව සෑහීමට පත්වෙති.



කේ.ඩී.ආර්. ඕල්ගා
සභාපතිනිය
**විගණන හා කළමනාකරණ කමිටුව**

# මූලාශ්‍ර තොරතුරු

සභාපති

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තියට අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම හී මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය ව්‍යාචනය**

2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශයත් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම හී ("සමාගම") මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ සිදුකරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ අනුරූපී මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් මම ප්‍රකාශ නොකරමි. මාගේ වාර්තාවේ මතය ඉදිරිපත්කරන කොටසේ මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන්, මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මාහට නොහැකි විය.

**1.2 මතය ව්‍යාචනය සඳහා පදනම**

(අ) දේපල, පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (LKAS 16) 51 පරිච්ඡේදය පරිදි, වත්කම්වල ඵලදායී ජීව කාලය එක් එක් මූල්‍ය වසර අවසානයේදී සමාලෝචන කළ යුතු අතර, අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේනම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08ට අනුකූලව වෙනස්වීම් ගණනය කළ යුතුවේ. කෙසේවෙතත්, සමාගම විසින් අඛණ්ඩව භාවිතා කරමින් සිටින රු. මිලියන 6,074ක් පිරිවැය වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණවල ඵලදායී ජීව කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම් ගත කර නොමැත. සමාගමේ ආරම්භක වර්ෂය වන 2003න් පසු එහි වත්කම් ප්‍රත්‍යාගනනය කර නොතිබිනි.

(ආ) **අන්තර් සමාගම් ශේෂ**

ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව (CPC) සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම (LIOC) අතර අන්තර් සමාගම් ශේෂවල නිරවද්‍යතාව, පැවැත්ම, වටිනාකම සහ සම්පූර්ණත්වය පහත සඳහන් හේතු නිසා විගණනය තුළ සහතික නොකරන ලදී.

(i) විගණනය සඳහා ලබාගතහැකි තොරතුරු අනුව, මව් සමාගම වන ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවෙන් ලැබියයුතු රුපියල් මිලියන 1,173ක මුදල 2018 වසර තුළ එක්සිම් බැංකුවේ ණය නිරවුල් කිරීම සලකා බලමින් ලීටරයට ශත 13 ක මුළු ප්‍රතිදාන ගාස්තුවල ණය පොලී සංරචක ඉවත් කිරීමට ඒවායේ ගිණුම්වලින් කපාහැර තිබුණි. කෙසේවෙතත්, මේ දක්වා සමාගම විසින් මේ සම්බන්ධයෙන් කටයුතුකර නිගමනයට එළඹ නොමැති අතර කිසිදු හානිකරන වෙන්කිරීමක් සිදුකර නොමැත. එමනිසා, මෙම ලැබියයුතු ශේෂය අයකර ගැනීම විගණනය තුළ බරපතල ලෙස සැක සහිත විය.

(ii) සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළ සමාලෝචිත වසර අවසානයේදී ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව වෙතින් ලැබියයුතු ප්‍රමාණය රු.මිලියන 6,248,87 කි. එසේවුවත්, ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පරිදි සමාලෝචිත වසර අවසානයේදී සමාගමට ලැබිය යුතු ප්‍රමාණය (රු.මිලියන 1,029.45ක මාර්ගස්ථ මුදල අඩුකිරීමට පෙර) රු. මිලියන 4,625.74ක් විය. එබැවින්, රු.මිලියන 1,623.13ක සැසැඳිය නොහැකි වෙනසක් එකී ශේෂ දෙක අතර නිරීක්ෂණය විය.

(iii) ලංකා ඉන්දියන් තෙල් සමාගම වෙතින් ලද ශේෂය තහවුරු කිරීමට අනුව, සමාගමට ගෙවියයුතු මුදල රුපියල් මිලියන 370.9ක් වූ අතර, සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව අනුරූප මුදල රුපියල් මිලියන 376.0ක් ලෙස පෙන්වන ලදී. එමනිසා, රුපියල් මිලියන 5.1 ක සැසැඳිය නොහැකි වෙනසක් එකී ශේෂ දෙක අතර නිරීක්ෂණය විය.

(ඇ) සැලකියයුතු ප්‍රමාණයකින් සමන්විත තොග අයිතම වර්ග 1300 ට වැඩි ප්‍රමාණයක් ව්‍යවසාය සම්පත් සැලසුම් කිරීමේ පද්ධතිය (ERP) තුළ නිරීක්ෂණය විය. එනම් දීර්ඝ කාලයක් තුළ එකී තොග අයිතමවල වටිනාකම සමාගමේ SAP පද්ධතියට ඇතුළත් කර නොමැත. එමනිසා, සමාලෝචිත වසර අවසානයේදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ පෙන්වනු ලබන රු.මිලියන 676ක් වටිනා තොග අයිතමවල නිරවද්‍යතාව. වටිනාකම සහ සම්පූර්ණත්වය විගණනය තුළ විශ්වාස කළ නොහැක.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08ට පටහැනිව, 2010 සිට 2014 දක්වා කාලසීමාව සඳහා රු.මිලියන 62.5ක ප්‍රමාණයකින්ද, 2014 සිට 2018 දක්වා කාලසීමාව සඳහා රු.මිලියන 225.15ක ප්‍රමාණයකින්ද 2018 වසර සඳහා රු.මිලියන 70.1 ක ප්‍රමාණයකින්ද සමන්විත රු.මිලියන 357.7ක එකතුවකින් යුත් ටග් බෝට්ටු ගාස්තු සමාලෝචිත වසර තුළ ගිණුම්ගත කර තිබුණු අතර, 2017 සහ 2018 වසරට අදාළ රු.මිලියන 1.91 ක් වූ දුම්රිය මාර්ග නඩත්තු ගාස්තු සමාලෝචිත වසරේ වියදම් ලෙස ගණනය කර තිබුණි.

(ඉ) 2018 සහ 2019 තුළ මිලදී ගෙන ඇති රු. මිලියන 82.62ක් වූ අයිතම 11 ගිණුම්ගත කර නොතිබූ අතර සමාලෝචිත වසර අවසානයේදී සමාගම විසින් අත්තිකාරම් ගිණුම් යටතේ දක්වා ඇත.

(ඊ) **වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු ශේෂ**

(i) රජයේ සැපයීම්, ප්‍රසම්පාදන සැපයීම්, පොදු වව්චර් සැපයීම් සහ ප්‍රවාහන විකුණුම්කරුවන්ගෙන් සමන්විත රු. මිලියන 38.96ක් වූ වෙළෙඳ සහ අනෙකුත් ගෙවීම් 48ක හර ශේෂ පවතින බව සමාලෝචිත වසර අවසානයේදී නිරීක්ෂණය විය. 2010 හෝ ඊට පෙර සිට රු. මිලියන 2.98ක ණයහිමියන් 14ක්, වසර 05ට වැඩි වසර 10 දක්වා රු. මිලියන 0.55ක් වූ ණයහිමියන් 03ක් සහ වසර 01 සිට වසර 05 දක්වා රු. මිලියන 35.42ක් වූ හර ශේෂ 31ක් නිරවුල් නොකර පවත්නා බව පෙන්නුම් කරයි. දැනට පවත්නා හර ශේෂ නිරවුල් නොකර හර ශේෂ සහිත එම ණයහිමියන් සමඟ පසුකාලීන ගනුදෙනු සමාගම විසින් සිදු කර ඇති බව නිරීක්ෂණය විය. එමනිසා, එම හර ශේෂවල පැවැත්ම, නිරවද්‍යතාව සහ වටිනාකම ප්‍රමාණවත් සහ උචිත සාක්ෂි නොමැතිවීම හේතු කොට ගෙන විගණනය තුළ සහතික නොකරන ලදී.

(ii) 2010 වසර හෝ ඊට පෙර සිට පාර්ශ්වයන් 81ක රු. මිලියන 7.18ක් වූ ගෙවිය යුතු වෙළෙඳ ශේෂ, වසර 5 සිට 10 දක්වා රු. මිලියන 40.18ක් වූ ගෙවියයුතු ශේෂ 210ක් සහ වසර 01 සිට වසර 05 දක්වා රු. මිලියන 39.45ක් වූ ගෙවියයුතු ශේෂ 18 සමාලෝචිත වසර අවසානයේදී නිරවුල් නොකර පැවතුනි. කෙසේවෙතත්, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි නොමැතිවීම හේතු කොට ගෙන එම ණය ශේෂවල පැවැත්ම, නිරවද්‍යතාව සහ වටිනාකම සහතික කිරීමට විගණනය අසමත් විය.

(උ) රු. මිලියන 8.8ක් වූ අනෙකුත් ලැබීම් සමාලෝචිත වසර අවසානය වන විටත්, වසර 5ට වැඩි කාලයක් තිස්සේ අයකර නොගෙන පැවතුනි. එමනිසා, මෙම ශේෂ අයකර ගැනීම පිළිබඳ ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි නොමැතිවීම හේතු කොට ගෙන විගණනයේදී මෙම ශේෂ නැවත අයකර ගැනීමේ හැකියාව සහතික නොවීය.

(ඌ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්නට ඇති මුළු ගෙවියයුතු අගය එකතුකළ බදු (VAT), ගෙවියයුතු උපයනවිට ගෙවීම් (PAYE), ගෙවියයුතු ආර්ථික සේවා ගාස්තු (ESC) ශේෂ සහ සමාලෝචිත වසර අවසානයේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන වාර්තාවල දක්වා ඇති අනුරූප ප්‍රමාණ අතර රු. මිලියන 437.53ක වෙනසක් ගෙවියයුතු මුළු ආදායම් බදු අතර නිරීක්ෂණය විය.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටින අතර, වංචාව, වැරදි හේතුවෙන් දැක්විය හැකි, ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලකයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අඛණ්ඩතා පැවැත්මට අදාළ කරුණු අවශ්‍ය පරිදි අනාවරණය කරමින් අඛණ්ඩ පැවැත්මක් මත ඉදිරියට යාමට සමාගමේ හැකියාව තක්සේරු කිරීම සඳහා සහ කළමනාකරණය සමාගම ඈවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අදහස් කරන්නේනම් හෝ එසේ කිරීම හැර වෙනත් ප්‍රායෝගික විකල්පයක් නොමැතිනම් ගිණුම්කරණය පිළිබඳ අඛණ්ඩතා පැවැත්මේ පදනම භාවිතා කිරීමට කළමනාකරණය වගකීමට බැඳී සිටී.

පාලනය කරන පාර්ශවය සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පාලනය සඳහා වගකීමට බැඳී සිටී.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය පරිදි, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි එහි සියලුම ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳ විධිමත් පොත්පත් සහ වාර්තා, සමාගම විසින් පවත්වා ගැනීම අවශ්‍ය වේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්**

මාගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව ප්‍රකාශන පිළිබඳ විගණනයක් කිරීම සහ විගණකගේ වාර්තාවක් නිකුත් කිරීමයි. කෙසේවෙතත්, මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතයක් සඳහා පදනමක් ලබා ගැනීමට ප්‍රමාණවත් සුදුසු හා උචිත සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතා සඳහා විශේෂ ප්‍රතිපාදන ඇතුළත්ය.

- විගණනයේ අරමුණ සඳහා අවශ්‍යයයි සලකනු ලබන සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා හට ලබා ගැනීමට නොහැකි වූ අතර, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (ඈ) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ අවශ්‍යතාවය පරිදි සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා තබාගෙන තිබුණේද යන්න තීරණය කිරීමට මා හට නොහැකි විය.

- මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරන සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවය හා අනුකූල වේ.

- ඉදිරිපත්කර ඇති මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ අවශ්‍යතාවය පරිදි ඉකුත් වසර හා අනුරූප වේ.

- ඉදිරිපත්කර ඇති මූල්‍ය ප්‍රකාශනවලට මෙම වාර්තාවේ 1.2 (අ), 1.2.(ආ). 1.2.(ඇ) සහ 1.2. (උ) පරිච්ඡේද තුළ විස්තර කර ඇති කරුණු හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ අවශ්‍යතාවය පරිදි පසුගිය වසර තුළ මා විසින් සිදුකළ සියලුම නිර්දේශයන් ඇතුළත්ය.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් කරුණු හැර මාගේ අවධානය යොමු වූ කිසිවක් නොමැත.

- සමාගමේ පාලන මණ්ඩලයේ යම් සාමාජිකයෙක්ට සමාගම විසින් එළඹි යම් ගිවිසුම්වලට සෘජු හෝ වක්‍ර බැඳියාවක් ඇති බවත්, එය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ අවශ්‍යතාවය පරිදි සාමාන්‍ය ව්‍යාපාර රටාවෙන් බැහැර වන බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ අවශ්‍යතාවය පරිදි පහත නිරීක්ෂණ හැර සමාගම යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලන මණ්ඩලය විසින් නිකුත් කළ පොදු හෝ විශේෂ නියෝගවලට හෝ අනුකූල වී නොමැති බව.

| | නීති/නියෝගවලට යොමුව | විස්තරය |
|---|---|---|
| (අ) | 2003 ජූනි 2 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 - යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ | |
| (i) | මාර්ගෝපදේශ 5.1.3 | සමාගම වසර 3ක් සඳහා ආයතනික සැලැස්මක් පිළියෙල කර නොමැති අතර මාර්ගෝපදේශයෙන් අවශ්‍ය කරන පරිදි විගණනයට ඉදිරිපත් කර නොමැත. |
| (ii) | මාර්ගෝපදේශ 5.2.2(ආ) | අමාත්‍යංශයේ අනුමැතිය සහ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ එකඟතාව රු. මිලියන 10 ඉක්මවන ප්‍රාග්ධන වියදම සඳහා ලබාගෙන නොතිබුනි. |
| (iii) | මාර්ගෝපදේශ 5.2.2 | රු. මිලියන 6,981ක් වූ ඇස්තමේන්තු පිරිවැයක් සහිත ප්‍රාග්ධන ව්‍යාපෘති තිස් අට (38) විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් නොමැතිව සිදුකර තිබුනි. |
| (iv) | මාර්ගෝපදේශ 9.2 | සමාගමට අනුමත ආයතනික සටහනක් සහ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සමඟ ලියාපදිංචි සේවක සංඛ්‍යාවක් නොමැත |
| (v) | මාර්ගෝපදේශ 9.3 | මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය සහ අමාත්‍යංශය විසින් අනුමත කළ බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ ක්‍රියාවලියක් (SORAP) සමාගමට නොමැත |
| (vi) | මාර්ගෝපදේශ 9.10 | කොන්ත්‍රාත් සේවකයින් බඳවා ගැනීම සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතින් සමාගම විසින් ලබාගෙන නොතිබුනි. සමාලෝචිත වසර අවසානයේදී සිටි කොන්ත්‍රාත් පදනම් සේවකයින් ගණන 29 කි. |

| | | |
|---|---|---|
| (vii) | මාර්ගෝපදේශ 9.12 | සමාගම විසින් යොදාගත් සුභසාධන යෝජනා ක්‍රමය සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුනි. කෙසේවෙතත්, රු. මිලියන 239.29ක මුදලක් සමාගම විසින් සමාලෝචිත වසර තුළ සේවක සුභසාධනය සඳහා ගෙවා තිබුනි. |
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ - 2006 | බාහිර ප්‍රවාහකයින් (බව්සර්) තෝරා ගැනීමේදී ටෙන්ඩර් ක්‍රියාපටිපාටියක් අනුගමනය කර නොතිබුනි. තවද, බාහිර ප්‍රවාහකයින් තෝරා ගැනීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පවා ලබාගෙන නොතිබුනි. |
| (ආ) | 2013 නොවැම්බර් 04 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක. FP/06/35/02/01 සහ 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සේවකයින්ගේ පුද්ගලික වැටුප්වලින් උපයන විට ගෙවීම් (PAYE) බදු අඩු නොකර, සමාගම විසින් සමාලෝචිත වසර තුළ රු. මිලියන 162.2ක් වූ සේවක උපයන විට ගෙවීම් බදු ගෙවා ඇත. |
| (ඇ) | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ 1997 ඔක්තෝබර් 24 දිනැති මුදල් චක්‍රලේඛ අංක 124 | නිලධාරීන් විසි හතක් වෙත සමාලෝචිත වසර අවසානයේදී මාස 03 කට වැඩි කාලසීමාවක් පුරප්පාඩු වූ තනතුරක රාජකාරි ආවරණය සඳහා පවරා ඇති අතර මෙය චක්‍රලේඛ විධිවිධානයට පටහැනිය. |

**(ඉ) අනෙකුත් රජයේ ආයතනවලට දෙනලද ආයතනයේ සම්පත්**

ආයතනයේ චක්‍රලේඛ උපදෙස්වලට, විශේෂයෙන් යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12, අතිගරු ජනාධිපති විසින් නිකුත්කරන ලද 2006 ජනවාරි 04 දිනැති අංක CSA/PI/40 සහ 2010 මැයි 14 දිනැති අංක CS/1/17/1 ලිපි සහ 2004 ජනවාරි 08 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 21 සඳහන් චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව, 2019 වසර තුළ සමාගම විසින් සේවකයින් තිදෙනෙක් (03) මුදා හැර ඇති අතර, ඔවුන්ගේ පාරිශ්‍රමිකය ලෙස රු. මිලියන 4.73ක මුදලක් වියදම් කර ඇත.

- පහත දෑ හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ අවශ්‍යතාව පරිදි එහි බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුව සමාගම කටයුතු කර නොමැති බව සඳහන් කිරීම;

**(අ) නිරවුල් කිරීමේ ගිවිසුම්වල නියමයන් හා කොන්දේසි අනුව විධිමත් නියාමන ක්‍රියාවලියක් නොමැතිකම**

මගේ පසුගිය වසරවල විගණන වාර්තාවල පැවසූ පරිදි, ශ්‍රී ලංකා රජය සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම අතර 2007 ජනවාරි 05 දින අත්සන් කළ නිරවුල් කිරීමේ ගිවිසුමේ 03 වගන්තියට අනුව, රටේ මුළු ඛණිජ තෙල් නිෂ්පාදනවලින් 5% ක උපරිමයක් දක්වා එහි චීන වරාය නිමාවෙන් ලංකා ඉන්දියන් තෙල් සමාගම විසින් ඛණිජ තෙල් නිෂ්පාදන බෙදාහැරීමට සහ සපුගස්කන්ද පිරිපහදුවෙන් 5% ක ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට උපරිමයක් දක්වා විසින් ඛණිජ තෙල් නිෂ්පාදන බෙදාහැරීමට සීමා කරන ලදී. කෙසේවෙතත්, ඉහත විධිවිධානවල අනුකූලතාව නියාමනය සඳහා විධිමත් ක්‍රියාවලියක් ස්ථාපිත කොට නොතිබුනි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාගමේ මුළු ආදායමින් සැලකියයුතු ප්‍රමාණයක් අහිමිවීමේ හැකියාවක් ඇත.

**(ආ) පොදු භාවිත පහසුකම සඳහා කොටස්හිමි ගිවිසුම සහ කොටස් විකුණුම් මිලදී ගැනීමේ ගිවිසුම කල්පිරීම නිසා සංශෝධිත මිල සූත්‍රය ප්‍රමාදවීම**

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියන් තෙල් සමාගම සහ සමාගම අතර පොදු භාවිත පහසුකම සඳහා කොටස්හිමි ගිවිසුම සහ කොටස් විකුණුම් මිලදී ගැනීමේ ගිවිසුම 2008 දෙසැම්බර් 31 දින කල්පිරී ඇති බව සඳහන් කරන ලදී. දීර්ඝ කිරීමක් ලබාගෙන නොමැති අතරම, අධ්‍යක්ෂ මණ්ඩලයේ විධිමත් ඇගයීම සහ අනුමැතිය සහිතව අදාළ සියලූම පාර්ශ්වයන් සහභාගි කරවමින් නව ගිවිසුමක් ද අත්සන් කර නොතිබුනි. ප්‍රතිදාන ගාස්තු, ස්ලැබ් අයකිරීම් ඇතුල්ව ප්‍රවාහන ආදායම් තිරණය කිරීමේ අරමුණ සඳහා යොදාගනු ලබන මිල සූත්‍රය 2011 වර්ෂයේ සිටම නැවත සංශෝධනය කර නොතිබුනි.

# විගණකාධිපතිගේ වාර්තා

**(ඇ) පොදු භාවිත පහසුකම්**

සමාගම 2019 මැයි 13 දින ලංකා ඉන්දියන් තෙල් සමාගම නොමැතිව ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ පොදු භාවිත පහසුකම් ගිවිසුමකට ඇතුළත් වී තිබුණි. මෙම ගිවිසුමට අනුව, ඛණිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම හා ප්‍රවාහනය සම්බන්ධයෙන් නියමයන් හා කොන්දේසි සහ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව සහ සමාගම අතර ආදායම තීරණය කිරීමේ ක්‍රමය සම්බන්ධව එකඟ විය. කෙසේවෙතත්, ප්‍රධාන පරිශීලක සහ 2003 වසරේ පොදු භාවිත පහසුකම් කොටස්හිමි ගිවිසුම තුළ සිටි පාර්ශ්වයක් වන, ලංකා ඉන්දියන් තෙල් සමාගමට බලපාන එම කරුණු සම්බන්ධයෙන් නියමයන් හා කොන්දේසි පැහැදිලිව විගණනය නොවීය. එමනිසා, සමාගම සහ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව අතර ඇතුළත් වූ නියමයන් හා කොන්දේසි ලංකා ඉන්දියන් තෙල් සමාගම ප්‍රතික්ෂේප කිරීම තුළ යම් අහිතකර තත්ත්වයන් සහ පිරිවැය සමාග මට ගෙවීමට සිදුවන බව නිරීක්ෂණය විය.

**(ඈ)** සමාගමේ 3,249ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන්, තනතුරු 343ක් 2019 දෙසැම්බර් 31 දිනට ඇබෑර්තු වී තිබුණි. එයින් තනතුරු 44ක ඇබෑර්තු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ඉංජිනේරු සහ සහය සේවා), ප්‍රධාන තොරතුරු නිලධාරී සහ කළමනාකරු (ගිනි හා ආරක්ෂාව, කළමනාකරු (අභ්‍යන්තර විගණන) යනාදිය ඇතුළුව ජ්‍යෙෂ්ඨ නිලධාරී මට්ටමේ විය. කෙසේවෙතත්, පුද්ගලයින් 833ක අනුමත සේවක සංඛ්‍යාවෙන් බාහිරව බඳවා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඒ) වගන්තියේ අවශ්‍යතාව පරිදි අදාළ නීතිවලට අනුකූලව කාලරාමුවක් තුළ සමාගමේ සම්පත් ආර්ථිකමය වශයෙන් කාර්යක්ෂමව සහ ඵලදායී ආකාරයෙන් ප්‍රසම්පාදන කර නොතිබූ බව සඳහන් කිරීම.

**ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න**
විගණකාධිපති

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

**2019 දෙසැම්බර් 31 දිනට**

| | සටහන | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත හා උපකරණ | 10 | 16,014,759,551 | 16,046,854,744 |
| අස්පෘශ්‍ය වත්කම් | 11 | 101,433,160 | 127,341,560 |
| වෙනත් මූල්‍ය වත්කම් | 14.1 | 1,640,163,452 | 1,138,830,704 |
| | | 17,756,356,163 | 17,313,027,008 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 12 | 675,841,555 | 657,620,365 |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු | 13 | 8,247,643,666 | 7,679,235,133 |
| වෙනත් මූල්‍ය වත්කම් | 14.2 | 1,525,800,944 | 1,523,439,398 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 15 | 3,999,712,050 | 3,148,644,883 |
| | | 14,448,998,215 | 13,008,939,779 |
| **මුළු වත්කම** | | 32,205,354,378 | 30,321,966,787 |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 16 | 7,500,000,000 | 7,500,000,000 |
| ප්‍රාග්ධන සංචිතය | 16.1 | 979,000,000 | 979,000,000 |
| රඳවාගත් ඉපයීම් | | 17,729,810,194 | 16,287,261,312 |
| මුළු හිමිකම් | | 26,208,810,194 | 24,766,261,312 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් | 17 | 1,706,098,260 | 1,451,971,373 |
| විලම්භිත බදු වගකීම් | 8.1 | 2,085,914,526 | 1,997,626,173 |
| | | 3,792,012,786 | 3,449,597,546 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළෙඳ සහ වෙනත් ගෙවියයුතු දෑ | 18 | 1,064,779,767 | 1,815,024,740 |
| ගෙවියයුතු ආදායම් බදු | | 1,139,751,631 | 291,083,189 |
| **මුළු වගකීම්** | | 2,204,531,398 | 2,106,107,929 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 32,205,354,378 | 30,321,966,787 |

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූල වන බව මම සහතික කරමි.

**ජේ.ඒ.යූ.ආර්.කේ. ජයලත්**
මූල්‍ය ප්‍රධානී

මෙම මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැදේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරනු ලැබුයේ

**ඊ.ඒ. රත්නශීල මහතා**
අධ්‍යක්ෂ

**එම්.යූ මොහමඩ් මහතා**
සභාපති

පිටු අංක 65 සිට 92 දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අඩංගු කොටසක් වේ.

2020 මාර්තු 02 දින
කොළඹ

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

**2019 දෙසැම්බර් 31 දිනට**

| | සටහන | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| ආදායම | 3 | 15,339,875,966 | 13,130,224,803 |
| සෘජු වියදම් | | (8,580,154,080) | (7,903,351,446) |
| දළ ලාභය | | 6,759,721,886 | 5,226,873,357 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම | 4 | 852,348,796 | 704,333,113 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 4.1 | (70,222,231) | - |
| පරිපාලන වියදම් | | (4,937,022,268) | (4,526,853,560) |
| මෙහෙයුම් ලාභය | | 2,604,826,183 | 1,404,352,910 |
| මූල්‍ය ආදායම | 5 | 323,029,850 | 117,877,199 |
| බදු පෙර ලාභය | 6 | 2,927,856,033 | 1,522,230,109 |
| ආදායම් බදු වියදම් | 7.1 | (1,162,529,046) | (1,324,912,205) |
| වසර සඳහා ලාභය | | 1,765,326,987 | 197,317,904 |
| පසුගිය කාලපරිච්ඡේදයන් හි ලාභ හෝ අලාභවලට නැවත | | | |
| වර්ගිකරණය නොකළ යුතු අනෙකුත් විස්තීර්ණ ආදායම | | | |
| නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මත වූ ආයුගණක ලාභය/ අලාභය | 17 | (135,802,924) | 75,079,946 |
| අනෙකුත් විස්තීර්ණ ආදායම මත බදු | 8.1 | 38,024,819 | (18,334,523) |
| වර්ෂය සඳහා බදු අඩුකරන ලද අනෙකුත් විස්තීර්ණ ආදායම | | (97,778,105) | 56,745,424 |
| වර්ෂය සඳහා බදු අඩුකරන ලද මුළු විස්තීරණ ආදායම | | 1,667,548,882 | 254,063,327 |
| කොටසක ඉපයීම් | 9.2 | 2.35 | 0.26 |

පිටු අංක 65 සිට 92 දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අඩංගු කොටසක් වේ.

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

**2019 දෙසැම්බර් 31 දිනට**

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. | ප්‍රාග්ධන සංචිතය රු. | රඳවාගත් ඉපයීම් රු. | එකතුව රු. |
|---|---|---|---|---|
| **2018 ජනවාරි 1 දිනට ශේෂය** | 7,500,000,000 | 979,000,000 | 16,684,197,985 | **25,163,197,985** |
| වසර සඳහා ලාභය | - | - | 197,317,904 | **197,317,904** |
| අනෙකුත් විස්තීර්ණ ආදායම | - | - | 56,745,423 | **56,745,423** |
| මුළු විස්තීර්ණ ආදායම | - | - | 254,063,327 | **254,063,326** |
| ගෙවූ ලාභාංශය | - | - | (651,000,000) | **(651,000,000)** |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 7,500,000,000 | 979,000,000 | 16,287,261,312 | **24,766,261,310** |
| වසර සඳහා ලාභය | - | - | 1,765,326,987 | **1,765,326,987** |
| අනෙකුත් විස්තීර්ණ ආදායම | - | - | (97,778,105) | **(97,778,105)** |
| මුළු විස්තීර්ණ ආදායම | - | - | 1,667,548,882 | **1,667,548,882** |
| ගෙවූ ලාභාංශය | - | - | (225,000,000) | **(225,000,000)** |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 7,500,000,000 | 979,000,000 | 17,729,810,194 | **26,208,810,193** |

පිටු අංක 65 සිට 92 දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අඩංගු කොටසක් වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2019 දෙසැම්බර් 31 දිනට**

| | සටහන | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් ජනිත වූ (භාවිතා කළ) මුදල් ප්‍රවාහ** | | | |
| ආදායම් බදු වියදම්වලට පෙර ලාභය | | **2,927,856,033** | 1,522,230,109 |
| **ගැලපුම්** | | | |
| මූල්‍ය ආදායම | 5 | **(323,029,850)** | (117,877,199) |
| සේවක ණය හානිකරණය සඳහා දීමනාව | | **-** | - |
| තොග හා අනෙකුත් ලැබීයයුතු දෑ හානිකරණය සඳහා දීමනාව | | **11,978,285** | (301,901,998) |
| දේපල, පිරියත හා උපකරණ විකිණීම මත අලාභය /(ලාභය) | 4 | **(29,445,300)** | (26,421,610) |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා වෙන්කිරීම | | **265,146,147** | 226,725,802 |
| ක්ෂයවීම් | 10.2 | **1,003,171,663** | 953,409,624 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | 11.2 | **25,908,400** | 2,478,236 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය (අලාභය)** | | **3,881,585,378** | 2,258,642,964 |
| තොගවල වැඩිවීම/ (අඩුවීම) | | **(30,199,472)** | (122,887,774) |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබියයුතු දෑ හි වැඩිවීම/(අඩුවීම) | | **(568,408,533)** | 1,567,002,316 |
| අනෙකුත් මූල්‍ය වත්කම්වල වැඩිවීම/(අඩුවීම) | | **(503,694,294)** | (379,041,297) |
| වෙළෙඳ සහ අනෙකුත් ගෙවියයුතු දෑ හි වැඩිවීම/(අඩුවීම) | | **(750,244,973)** | (30,559,793) |
| **මෙහෙයුම්වලින් ජනිත වූ /(භාවිතා කළ) මුදල** | | **2,029,038,106** | 3,293,156,416 |
| ගෙවූ ආදායම් බදු | | **(187,547,432)** | (563,208,064) |
| ගෙවූ නිශ්චිත ප්‍රතිලාභ | 17 | **(146,822,184)** | (173,664,381) |
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් ජනිත වූ /(භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | **1,694,668,490** | 2,556,283,971 |
| **ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ** | | | |
| දේපල, පිරියත හා උපකරණ අත්කර ගැනීම් | 10.1 | **(980,846,563)** | (375,230,766) |
| දේපල, පිරියත හා උපකරණවලින් ලද මුදල් | | **39,215,390** | 26,594,468 |
| මූල්‍ය ආදායම | 5 | **323,029,850** | 117,877,199 |
| **ආයෝජන කාර්යයන්ගෙන් ජනිත වූ (භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහ** | | **(618,601,323)** | (230,759,099) |
| **මූල්‍ය කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ** | | | |
| ණය ආපසු ගෙවීම් | | - | - |
| ගෙවූ ලාභාංශ | | **(225,000,000)** | (651,000,000) |
| **මූල්‍ය කාර්යයන්ගෙන් ජනිත වූ (භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | **(225,000,000)** | (651,000,000) |
| **මුදල් හා මුදලට සමාන දෑ හී ශුද්ධ වැඩිවිම/ (අඩුවීම)** | | **851,067,167** | 1,674,524,872 |
| වසර ආරම්භයේදි මුදල් සහ මුදල් හා සමාන දෑ | 15 | **3,148,644,883** | 1,474,120,011 |
| **වසර අවසානයේදි මුදල් හා මුදලට සමාන දෑ** | 15 | **3,999,712,050** | 3,148,644,883 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**2019 දෙසැම්බර් 31 දිනට**

## 1. සංස්ථාපිත තොරතුරු

### 1.1 පොදු

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ("සමාගම") යනු 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2003 ඔක්තෝබර් 08 වන දින සංස්ථාපනය කරන ලද සීමාසහිත වගකීම ඇති සමාගමක් වන අතර, සමාගම ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කර ඇත. සමාගමේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව, කොලොන්නාව යන ස්ථානයෙහිය.

### 1.2 මූලික කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

වර්ෂය තුළ, සමාගමේ මූලික කටයුතු වූයේ ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදාහැරීමයි.

### 1.3 මව් සමාගම සහ අවසාන පාලන පාර්ශ්වය

අධ්‍යක්ෂවරුන්ගේ මතය අනුව, සමාගමෙහි අවසාන මව් සමාගම වන්නේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කරන ලද ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවයි.

### 1.4 නිකුත්කිරීම සඳහා බලය පවරන දිනය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් මූල්‍ය ප්‍රකාශණ නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාව අනුව 2020 මාර්තු 02 දින බලය පවරනු ලැබීය.

## 2. පිළියෙල කිරීමේ පදනම

### 2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින් සමන්විත වූ සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියමකරනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS/ LKASs) වලට අනුකූලව සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ නියමයන්ට අනුකූලව පිළියෙල කොට ඉදිරිපත්කර ඇත.

#### 2.1.1 අගය කිරීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ පහත අයිතමයන් හැර සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.

- නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා වන වගකීම් ආයුගණක ක්‍රම අනුව තක්සේරුකර වර්තමාන අගයට හඳුනාගෙන ඇත.

#### 2.1.2 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් සහිතව දිගටම පවත්වාගෙන යාමට සමාගමේ හැකියාව පිළිබඳව තක්සේරුවක් අධ්‍යක්ෂවරුන් සිදුකර ඇති අතර, දැකිය හැකි අනාගතය සඳහා ව්‍යාපාරය තුළ අඛණ්ඩව කටයුතු කිරීමට සම්පත් සමාගම ඇති බවට ඔවුන් තෘප්තිමත්ය. එසේම අඛණ්ඩ පැවැත්මක් සහිතව දිගටම පවත්වාගෙන යාමට සමාගමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු මට්ටමේ සැකයක් ඇතිකළ හැකිව තිබෙන යම් ප්‍රමාණාත්මක අවිනිශ්චිතභාවයක් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත්ව නොමැති අතර ඔවුන් ඈවර කිරීමට හෝ සමාගමේ මෙහෙයුම් කටයුතු නවතාලීමට අදහස් නොකරයි. එම නිසා මූල්‍ය ප්‍රකාශන දිගටම අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කරනු ඇත.

### 2.2 ක්‍රියාකාරී සහ ඉදිරිපත්කිරීමේ මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරන අතර එය සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කරන මුදල් වර්ගය වේ.

### 2.3 තුලනාත්මක තොරතුරු

සමාගම විසින් නිසැක වශයෙන්ම ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගෙන ඇති අතර, ඒවා පසුගිය වර්ෂයේ දී භාවිතා කළ ඒවා සමග අනුරූප වේ. පසුගිය වසරේ සංඛ්‍යා සහ වාක්‍යාංශ වත්මන් ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා අවශ්‍ය විට නැවත සකස් කර ඇත.

### 2.4 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පන

ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීම සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වල වාර්තා කරන ලද ප්‍රමාණයට බලපාන විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පන කළමණාකරණය විසින් සිදු කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අවශ්‍ය වේ. මෙම උපකල්පන හා ඇස්තමේන්තුවල අවිනිශ්චිතතාවන් වත්කම් සහ වගකීම්වල ධාරණ වටිනාකම්වලට අනාගත කාලසීමාවන් තුළ බලපාන සැලකියයුතු ගැලපීමක් අවශ්‍ය වන ප්‍රතිඵල ඇතිකිරීමට හේතු වනු ඇත.

ඇස්තමේන්තු හා උපකල්පනයන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සිදුකරන වෙනස් කිරීම් ඇස්තමේන්තුවට වෙනස්කිරීම් සිදුකළ කාලසීමාවේදී සහ එය බලපාන අනාගත කාලවලදී හඳුනාගනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගන්නා ලද වටිනාකම් කෙරෙහි වඩාත් සැලකියයුතු බලපෑමක් ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ දී, ඇස්තමේන්තු කිරීම, අවිනිශ්චිතතාවය සහ තීරණාත්මක විනිශ්චයන් සම්බන්ධ වඩා වැදගත් ක්ෂේත්‍ර පහත පරිදි වේ.

**අ) සේවක ප්‍රතිලාභ වගකීම**

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂිකවල පිරිවැය මෙන්ම වර්තමාන අගය ආයුගණක මිණුම් ක්‍රම භාවිතා කරමින් නිශ්චය කරනු ලැබේ. වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම්, සහ අනෙකුත් අදාළ දත්තයන් පිළිබඳව උපකල්පන සිදුකිරීම ආයුගණක මිනුම් ක්‍රමය තුළ ඇතුලත් වේ. සේවක ප්‍රතිලාභවල දීර්ඝ කාලීන ස්වභාවය හේතුවෙන් එකී ඇස්තමේන්තු

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**2019 දෙසැම්බර් 31 දිනට**

සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ. එසේම තවදුරටත් උපකල්පනයන්ගේ විස්තරත් සමාගම ඉහත මූලික උපකල්පනයන් සම්බන්ධයෙන් කළමනාකරණය විසින් ඒවායේ සංවේදීතාවය පිළිබඳව සිදුකරන ලද විශ්ලේෂණයක් සහ සංවේදීතා විශ්ලේෂණයේ ප්‍රතිඵල සටහන් 17.2 සහ 17.4 දක්වා ඇත.

**ආ) වෙළෙඳ ලැබිය යුතු දෑ හානිකරණය**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට වෙළෙඳ ලැබිය යුතු දෑ හානිකරණය වී ඇති බවට විෂය මූලික සාක්ෂි පවතින්නේ ද යන්න සමාගම තක්සේරු කර බලයි. දැනට පවතින ලැබිය යුතු දෑවල දැනට පවත්නා තත්ත්වය සහ ණය අයකරගැනීම පිළිබඳ අතීත අත්දැකීම් පදනම් කරගෙන හානිකරන අලාභය ගණනය කරයි. සැබෑ සහ අපේක්ෂිත හාණිකරණ පිළිබිඹුවීමට එකි වෙන්කිරීම් කලින් කළ ගලපනු ලැබේ. වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභය සටහන් 2 .5. 11 සහ 13 හි හෙළිදරව් කර ඇත.

**(ඇ) ආදායම් බදු සහ විලම්භිත බදු**

සමාගම ආදායම් බදුවලට යටත් වේ. ආදායම් බදු සඳහා වෙන් කිරීම තීරණය කිරීමේ දී සැලකිය යුතු විනිශ්චයන් අවශ්‍ය වේ. අවසාන බදු තීරණය අවිනිශ්චිත වන බොහෝ ගණුදෙනු සහ ගණනය කිරීම් ඇත. අතිරේක බදු ගෙවීමට සිදුවේද යන ඇස්තමේන්තුව මත පදනම්ව අපේක්ෂිත බදු ගැටළු මත ආයතනය බදු වගකීම් හදුනාගනී. මෙම කරුණුවල අවසාන ප්‍රතිඵලය මුල් අවස්ථාවේ දී වාර්තාකල ගණන්වලින් වෙනස් වන විට, එවැනි වෙනස්කම් ජංගම මෙන්ම එවැනි තීරණයක් ගන්නා කාල පරිච්ඡේදයේ විලම්භිත බදු වත්කම් සහ වගකීම් වලට බලපායි. වැඩිදුර තොරතුරු සටහන් 07 සහ 08 හි හෙළිදරව් කර ඇත.

## 2.5 වැදගත් ගිණුම් ප්‍රතිපත්ති සාරාංශය

### 2.5.1 විදේශ විනිමය පරිවර්තනය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරන අතර එය සමාගමේ ක්‍රියාත්මක සහ වාර්තා කිරීමේ ව්‍යවහාර මුදල වේ. විදේශ ව්‍යවහාර මුදල්වලින් සිදුවෙන ගනුදෙනු, ගනුදෙනුව සිදුවන දිනයේ පැවති අනුපාතයට ක්‍රියාත්මක මුදලින් මූලිකව වාර්තා කරයි. විදේශ ව්‍යවහාර මුදල්වලින් දක්වා ඇති මූල්‍ය වත්කම් සහ වගකීම් වාර්තා කරන දිනයේ පවතින අනුපාතයට ක්‍රියාත්මක මුදලට පරිවර්තනය කෙරේ. සියලු වෙනස්කම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කෙරේ. විදේශ ව්‍යවහාර මුදල්වලින් ඓතිහාසික පිරිවැයට මනිනු ලබන මූල්‍ය නොවන අයිතමයන් මූලික ගනුදෙනු දිනයේ පැවති විනිමය අනුපාතයට පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යවහාර මුදල්වලින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය නොවන අයිතමයන් සාධාරණ අගය තීරණය කල දිනයේ පැවති විනිමය අනුපාතය භාවිතයෙන් පරිවර්තනය කරනු ලැබේ.

### 2.5.2 ආදායම හදුනා ගැනීම

ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒම නිශ්චිත විට සහ ආදායම විශ්වාසවන්ත ලෙස මැනිය හැකි විට ආදායම හඳුනාගනී. ලබාගත් හෝ ලැබිය යුතු ප්‍රතිශ්ඨාවේ සාධාරණ අගයෙන් වෙළෙඳ වට්ටම්, ආපසු එවුම්, ප්‍රතිදාන සහ විකුණුම් බදු (එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බද්ද) අඩු කොට ආදායම මනිනු ලැබේ.

ආදායම් ප්‍රමාණය විශ්වාසවන්තව මැනිය හැකිවිට, අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ගලා ඒමේ සම්භාවිතාවයක් ඇතිවිට සහ පහත විස්තර කර ඇති ආකාරයට සමාගමේ සෑම ක්‍රියාකාරකමක් සඳහාම අදාළ විශේෂිත නිර්ණායක සපුරා ඇතිවිට, සමාගම විසින් ආදායම හඳුනාගනී. විකිණීමට අදාළ සියලු අවිනිශ්චිතතාවයන් විසඳන තුරු, ආදායම් ප්‍රමාණය විශ්වාසවන්තව මැනිය හැකි සේ නොසලකයි.

**අ) සේවාවන් සැපයීම**

සේවාවන් සැපයූ හෝ ඉටුකළ ගිණුම් කාලපරිච්ඡේදය තුළ සේවාවන් සැපයීමෙන් ජනිතවන ආදායම හදුනාගනී.

**පර්යන්ත ගාස්තුව**

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියන් තෙල් සමාගම සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව අතර 2003 වර්ෂයේ දී අත්සන් කළ පසුව 2011 සහ 2019 වර්ෂවල සංශෝධනය කළ, පොදු භාවිතා ගිවිසුම අනුව, අලෙවිකරණ සමාගම් වලින් අයකරවාගත් මෙහෙයුම් පිරිවැයවලින් සමන්විත වේ. එය ඔවුන්ට හිමි ඛනිජතෙල් නිෂ්පාදනයන් හුවමාරුවන අවස්ථාවේ දී හඳුනාගැනේ. විකුණනු ලබන ඛනිජතෙල් නිෂ්පාදිතයන් ලීටරයකට යන අනුපාතය යටතේ මනිනු ලැබේ.

**මෙහෙයුම් ආන්තිකය**

මිල සූත්‍රයේ පූර්ව නිශ්චිත අනුපාතයන් මත පදනම්ව මෙහෙයුම් ආන්තිකය හඳුනාගනී. විකුණනු ලබන ඛනිජතෙල් නිෂ්පාදිතයන් ලීටරයකට යන අනුපාතය යටතේ මෙහෙයුම් ආන්තිකය මනිනු ලැබේ.

**ප්‍රවාහන ආදායම**

දුම්රිය, වැගන්, නළමාර්ග සහ බවුසර් ගනුදෙනුකරුවන් වෙනුවෙන් දරණ ලද ප්‍රවාහන පිරිවැය අයකර ගැනීමයි. ලීටර පරිමාව සහ ගමන් කරන ලද දුර ප්‍රමාණය මත පදනම්ව ආදායම හඳුනාගනී.

**(ආ) මූල්‍ය ආදායම**

පොලිය උපචිත වනවිට, ඵලදායි පොළී ක්‍රමය භාවිතා කරමින් මූල්‍ය ආදායම හදුනාගනී.

**(ඇ) වෙනත්**

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගනී.

දේපල, පිරියත හා උපකරණ සහ ආයෝජන ඇතුළුව වෙනත් ජංගම නොවන වත්කම් විකිණීමෙන් හටගන්නා ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ සහ අලාභ, විකිණීමෙන්

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**2019 දෙසැම්බර් 31 දිනට**

ලද මුදල් වලින් වත්කම්වල ධාරණ අගය සහ ආශ්‍රිත විකිණීමේ වියදම් අඩු කිරීමෙන් පසු ආදායම් ප්‍රකාශනයට ගණනය කර ඇත.

අහඹු කටයුතුවල සිට ප්‍රධාන ආදායම් උත්පාදන කටයුතු දක්වා සහ වැදගත් නොවන සමාන ගනුදෙනු සමූහයකින් හටගන්නා ලාභ සහ අලාභයන්, ශුද්ධ පදනම මත එකට එකතුකර වාර්තාකොට ඉදිරිපත් කරනු ලබයි.

**2.5.3 වියදම හඳුනාගැනීම**

ව්‍යාපාරය කරගෙන යාමේදී සහ දේපල, පිරියත හා උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් පවත්වාගෙන යාමේදී දරන ලද සියළුම වියදම කාලසීමාව සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අයකර ඇත.

**2.5.4 බදුකරණය**

කාලපරිච්ඡේදය සඳහා වන බදු වියදම වර්තන සහ විලම්භිත බදුවලින් සමන්විත වේ. වෙනත් විස්තීර්ණ ආදායම් හෝ සෘජුවම ස්කන්ධයට අදාළව හඳුනාගන්නා අයිතමයන් සම්බන්ධයෙන් හැරෙන්නට බදු කාලපරිච්ඡේදය සඳහාවන ලාභයට හඳුනාගනී. මෙහිදී බදු, පිළිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායම හා සෘජුවම ස්කන්ධයට ද හඳුනා ගනී.

**වර්තන බදු**

වර්තමාන සහ පෙර කාලපරිච්ඡේදයන් සඳහා වර්තන ආදායම් බදු වත්කම් සහ වගකීම් බදු අධිකාරීන්ගෙන් අයකර ගැනීමට අපේක්ෂිත හෝ බදු අධිකාරීන්ට ගෙවීමට ඇති ප්‍රමාණයන්ට මිනිනු ලැබේ. ප්‍රමාණය ගණනය කිරීමට යොදාගන්නා බදු අනුපාතයන් සහ බදු නීති, වාර්තාකරන දින පනවනු ලබන ක්‍රියාත්මකව පවතින හෝ ප්‍රමාණාත්මකව නීතිගතකර ඇති ඒවා වේ.

ආදායම් බදු වෙන්කිරීම මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පරිදි ආදායම් සහ වියදම් මූලිකාංග මත පදනම් වන අතර අදාළ බදු නීතිකරණයට අනුකූලව ගණනය කරනු ලබයි.

ස්කන්ධය තුළ සෘජුවම හඳුනාගන්නා ලද අයිතමයන්ට අදාළ වර්තන ආදායම් බද්ද ස්කන්ධය තුළම හඳුනාගන්නා අතර විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා නොගනී.

**විලම්භිත බදු**

වත්කම් සහ වගකීම්වල බදු පදනම සහ මූල්‍ය වාර්තාකරන පරමාර්ථ සඳහා වන ධාරණ අගයන් අතර, වාර්තාකරන දිනට පවතින තාවකාලික වෙනස මත, වගකීම් ක්‍රමය භාවිතා කරමින්, විලම්භිත බදු වෙන් කිරීම සිදුකරයි.

ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක දී, වත්කමක් සහ වගකීමක් මූලික හඳුනාගැනීමකින් හටගන්නා විලම්භිත ආදායම් බදු වගකීම් ඇතිවිට සහ ගනුදෙනුව සිදුවන අවස්ථාවේ දී ගිණුම්කරණ ලාභයට හෝ බදු අයවන ලාභ හෝ පාඩුවලට බල නොපාන, තාවකාලික වෙනස්කම් ඇතිවිට හැර සියලුම බදු අයවන තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වගකීම් හඳුනාගනු ලබයි.

අඩුකල හැකි තාවකාලික වෙනස්කම්වලට අදාළ විලම්භිත බදු වත්කම ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක දී වත්කමක් සහ වගකීමක් මූලික හඳුනාගැනීමකින් හටගන්නේ නම් සහ ගනුදෙනුව සිදුවන කාලයේදී ගිණුම්කරණ ලාභයට හෝ බදු අයවන ලාභ හෝ පාඩුවලට බල නොපාන්නේ නම්, අඩුකලහැකි තාවකාලික වෙනස්කම්, ඉදිරියට ගෙනයනු ලබන භාවිතා නොකල බදු වත්කම් සහ භාවිතා නොකල බදු අලාභ භාවිතා කිරීම සඳහා බදු අයවන ලාභ ඇතිවීම සිදුවිය හැකි වන විට, සියලුම අඩුකල හැකි තාවකාලික වෙනස්කම්, ඉදිරියට ගෙනයනු ලබන භාවිතා නොකල බදු වත්කම් සහ භාවිතා නොකල බදු අලාභ සඳහා විලම්භිත බදු වත්කම් හඳුනාගනු ලබයි.

විලම්භිත ආදායම් බදු වත්කම්වල ධාරණ අගය එක් එක් වාර්තා කරන දිනට සමාලෝචනය කරන අතර භාවිතා කල යුතු විලම්භිත බදු වත්කම මුළුමනින්ම හෝ කොටසක් ඉඩදීම සඳහා ප්‍රමාණවත් බදු අයවන ලාභයක් පවතින බවට තවදුරටත් සම්භාවිතාවක් නොමැති විට විලම්භිත බදු වත්කම අඩුකල යුතුය.

වත්කම උපලබ්ධි වනවිට හෝ වගකීම පියවනවිට වාර්තා කරන දිනට ක්‍රියාත්මකව පවතින හෝ ප්‍රමාණවත්ව නීතිගතකර ඇති බදු අනුපාතයන් (සහ බදු නීති) පදනම් කරගත් වර්ෂය සඳහා යොදාගන්නා බදු අනුපාතයන්ට අනුව විලම්භිත බදු වත්කම් සහ වගකීම් මිනිනු ලැබේ.

විකුණුම් බදු (එකතුකල අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බද්ද)

බදු අධිකාරීන්ගෙන් අයකරගත නොහැකි, වත්කම් හෝ සේවාවන් මිලදී ගැනීමේ දී දරන ලද, අදාළ පරිදි විකුණුම් බදු ඇතුලත් අගයට වත්කමේ පිරිවැයෙහි හෝ වියදම් අයිතමයෙහි කොටසක් ලෙස සහ ලැබිය යුතු සහ ගෙවිය යුතු ලෙස හඳුනාගන්නා විට හැර, අනෙකුත් විකුණුම් බදු අඩුකිරීමෙන් පසු ආදායම්, වියදම් සහ වත්කම් හඳුනාගනු ලබයි. බදු අධිකාරීන් වෙනුවෙන් ලැබිය යුතු සහ ගෙවිය යුතු විකුණුම් බදු ප්‍රමාණය මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ලැබිය යුතු සහ ගෙවිය යුතු දෑ වල කොටසක් ලෙස ඇතුළත් කරයි.

**2.5.5 මූල්‍ය උපකරණ - මූලික හඳුනා ගැනීම සහ පසුකාලීන අගය කිරීම**

**2.5.5.1 මූල්‍ය වත්කම්**

සමාගමේ මූල්‍ය වත්කම්වලට මුදල් හා කෙටිකාලීන තැන්පතු, වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ සහ ආශ්‍රිත පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු ගණන් ඇතුලත් වේ.

මූලික හඳුනාගැනීම සහ මැනීම

ශ්‍රීලගිප්‍ර 39 හි විෂයපථය තුළ ඇති මූල්‍ය වත්කම් ලාභය හෝ

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**2019 දෙසැම්බර් 31 දිනට**

අලාභය තුලින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු මුදල්, කල්පිරෙන තෙක් තබාගන්නා ආයෝජන, විකිණීමට ඇති මූල්‍ය වත්කම් හෝ ඵලදායී ඉදිරි රැකුමක් ඇති ඉදිරි රැකුම් සාධන පත්‍ර ලෙස යොදවා ඇති ව්‍යුත්පන්න ලෙස සුදුසු පරිදි වර්ගීකරණය කරයි. සමාගම විසින් එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය මූලික හදුනාගැනීමේ දී තීරණය කරයි.

සියලු මූල්‍ය වත්කම් මූලිකවම ඒවායේ සාධාරණ වටිනාකමට හදුනාගන්නා අතර, ලාභාලාභ තුලින් සාධාරණ අගයට නොදක්වන වත්කම් සම්බන්ධයෙන් ඍජුවම හදුනාගත හැකි ගනුදෙනු පිරිවැය ද ඊට එකතු කරයි.

වෙළෙඳපොලේ රෙගුලාසි හෝ සම්මුතියකට (සාමාන්‍ය ආකාරයේ වෙළෙඳාම්) අනුව පිහිටුවා ගන්නාලද, කාල පරාසයක් තුළ වත්කම් බෙදාහැරීමට අවශ්‍යවන මූල්‍ය වත්කම් මිලදී ගැනීම් හෝ විකිණීම් වෙළෙඳ දිනට, එනම් සමාගම වත්කම් මිලටගැනීම් හෝ විකිණීම් සිදුකරන දිනට, හඳුනාගනු ලබයි.

**පසුකාලීන අගය කිරීම**

මූල්‍ය වත්කම් පසුකාලීනව අගය කිරීම පහත දැක්වෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ

**අ) ණය සහ ලැබිය යුතු**

ණය සහ ලැබිය යුතු මුදල් යනු සක්‍රීය වෙළෙඳපොලක් තුළ ලැයිස්තුගත නොකල ස්ථාවර හෝ තිරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික අගය කිරීමෙන් පසු එවැනි මූල්‍ය වත්කම් පසුකාලීනව සඵල පොළී අනුපාත ක්‍රමය (EIR) භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට හානිකරණය අඩුකර අගය කරනු කරයි. අත්පත්කර ගැනීම මත යම් වට්ටමක් හෝ අධිමිලක් සහ සඵල පොළී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරේ. EIR ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් තුළ ඇතුලත් කරයි. හානිකරණයෙන් ඇතිවන අලාභ ආදායම් ප්‍රකාශය තුළ මූල්‍ය පිරිවැයෙහි හඳුනා ගනී.

**ඉවත් කිරීම**

මූල්‍ය වත්කමක් (හෝ අදාළ වන විටදී මූල්‍ය වත්කමකින් කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක්) ඉවත් කරනු ලබන්නේ;

- වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති හිමිකම කල් ඉකුත්ව ගොස් ඇති විට.

- සමාගම විසින් මුදල් ප්‍රවාහයන් ලැබීමට සමාගමට ඇති අයිතිය පවරා ඇති විට, හෝ මාරු කිරීම් වැඩපිළිවෙලක් යටතේ ලබාගත් මුදල් ප්‍රවාහයන් මුළුමනින්ම සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව තුන්වන පාර්ශවයක් වෙත ගෙවීමට බැඳීමක් ඇතිකරගෙන ඇතිවිටක සහ (අ) සමාගම විසින් සැලකිය යුතු ලෙස වත්කම සම්බන්ධ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා ඇති විට, නැතහොත් (ආ) සමාගම විසින් සැලකිය යුතු ලෙස වත්කම සම්බන්ධ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා හෝ රදවා තබාගෙන නොමැති වුව ද වත්කමෙහි පාලනය පවරා ඇති විට.

සමාගම විසින් වත්කමෙන් මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති අයිතිය පවරා ඇති විට හෝ මාරුකිරීම් වැඩ පිළිවෙලකට එළඹ සැලකිය යුතු ලෙස වත්කම සම්බන්ධ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා හෝ රඳවා තබාගෙන නොමැතිව හෝ එහි පාලනය පවරා නොමැතිව ඇති විට වත්කම හදුනාගනු ලබන්නේ ඒ සඳහා සමාගමේ අඛණ්ඩ මැදිහත්වීම් මට්ටම අනුවය.

එවැනි විටදී, සමාගම ආශ්‍රිත වගකීමක්ද හදුනාගනී. සමාගම විසින් රඳවා තබාගත් හිමිකම් සහ බැඳීම් පෙන්නුම් වන පදනමක් මත පවරන ලද වත්කම සහ ආශ්‍රිත වගකීම අගය කරනු ලබයි.

පවරන ලද වත්කම මත ඇපයක ස්වරූපයක් ගන්නා අඛණ්ඩ මැදිහත්වීම එය වත්කමෙහි මුල් ධාරණ අගය සහ සමාගමට ආපසු ගෙවීමට අවශ්‍යවන, උපරිම මුදල් ප්‍රමාණය යන අගයන්ගෙන් වඩා අඩු අගයට මිණුම් කරයි.

**මූල්‍ය වත්කම් හානිකරණය**

මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් සමූහයක අගය හානිකරණය වී තිබේ ද යන්න පිළිබඳව විෂය මූලික සාක්ෂි තිබේද යන්න, සමාගම සෑම වාර්තාකරන දිනකටම තක්සේරු කරයි. වත්කමෙහි මූලික හදුනාගැනීමට පසුව සිදුව ඇති සිදුවීම් එකක් හෝ කිහිපයක ප්‍රතිඵලයක් වශයෙන් (සිදුව ඇති අලාභ සිද්ධියක්) ඇතිවීමත්, එකී අලාභ සිද්ධිය සිදුවීම මගින් මූල්‍ය වත්කම හෝ මූල්‍ය වත්කම් සමූහයේ, විශ්වාසවන්තව මිනුම් කළහැකි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් මත බලපෑමක් ඇතිකරනවිට, හානිකරණය පිළිබඳ විෂයානුකූල සාක්ෂි ඇත්නම් පමණක් මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමූහයක හානිකරණය සිදුවී ඇතැයි සලකනු ලබයි. ණයගැතියන් හෝ ණයගැතියන් සමූහයක් සැලකියයුතු මූල්‍ය දුෂ්කරතාවයන් අත් විදිමින් සිටිනවිට, පොළිය හෝ මුල් මුදල නොගෙවීම, ගෙවීම පැහැර හැරීම, ඔවුන් බුන්වත්භාවයට හෝ වෙනත් මූල්‍ය අසංවිධානාත්මක තාවයන්ට පත්වනු ඇතිවිට, සහ පැහැර හැරීම සමග සහසම්බන්ධවන හිගවල හෝ ආර්ථික තත්ත්වයන්ගේ වෙනසක් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ මැනියහැකි අඩුවීමක් නිරීක්ෂණ දත්ත මගින් පෙන්නුම් කරන අවස්ථා ඇගයීම් හානිකරණය වීම පිළිබඳ සාක්ෂිවලට ඇතුලත් කල හැක.

**ක්‍රමක්ෂය පිරිවැයට පවත්වා ගන්නා මූල්‍ය වත්කම්**

ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගන්නා මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් සමාගම විසින් පළමුව තක්සේරු කරනු ලබන්නේ, තනිතනිව සැලකියයුතු මූල්‍ය වත්කම් සඳහා තනි තනිව හානිකරණය වීම පිළිබඳ විෂයමූලික සාක්ෂි

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**2019 දෙසැම්බර් 31 දිනට**

පවතින්නේද යන්න පිළිබඳ හෝ තනිතනිව නොසැලකියයුතු මූල්‍ය වත්කම් සඳහා සාමූහිකව හානිකරණය වීම පිළිබඳ විෂයමූලික සාක්ෂි පවතින්නේද යන්න පිළිබඳවයි. තනිතනිව තක්සේරු කළ මූල්‍ය වත්කම් සඳහා හානිකරණය වීම පිළිබඳ විෂයමූලික සාක්ෂි නොමැති බවට සමාගම විසින් නිශ්චය කරගන්නේ නම්, ඒවා සැලකියයුතු වුවත්, නැතත්, සමාන ණය අවදානම් ගතිලක්ෂණ පවතින මූල්‍ය වත්කම් සමූහයක් එයට ඇතුලත් කොට, හානිකරණය වීම සඳහා හානිකරණ අලාභයක් ඇත්නම් හෝ එය අඛණ්ඩව පවතින බව හදුනා ගත්තේ නම්, එකී වත්කමේ හානිකරණය වීම පිළිබඳ සාමූහික තක්සේරුවට ඇතුළත් නොකරයි.

හානිකරණය අලාභයක් දරා ඇති බවට විෂයමූලික සාක්ෂි ඇති විට අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ (තවමත් දරා නොමැති අනාගත අපේක්ෂිත ණය අලාභ හැර) වර්තමාන අගය අතර වෙනස මගිනි.

ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගයන්, මූල්‍ය වත්කමේ මුල් සඵල පොලී අනුපාතයට වට්ටම් කරනු ලැබේ. ණයක් සඳහා විචල්‍ය පොළී අනුපාතිකයක් ඇත්නම්, යම් හානිකරණය අලාභයක් මිනුම් කිරීම සඳහා වන වට්ටම් අනුපාතය වන්නේ වර්තන සඵල පොළී අනුපාතයයි.

වත්කමේ ධාරණ අගය අත්තිකාරම් ගිණුමක් භාවිත කිරීම හරහා අඩුකරන අතර අලාභයේ ප්‍රමාණය ආදායම් ප්‍රකාශයේ හදුනා ගැනේ. පොළී ආදායම, අඩුවූ ධාරණ අගය මත අඛණ්ඩව උපචිත වන අතර, හානිකරණය අලාභය මැනීමේ කාර්යය සඳහා අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමට භාවිතා කරන පොළී අනුපාතය භාවිතයෙන් පොලිය උපචිත කිරීම සිදු කරයි. පොලී ආදායම ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායමේ කොටසක් ලෙස වාර්තා කරයි. අනාගත අයකරගැනීම සම්බන්ධයෙන් යථාර්තවාදී අපේක්ෂාවක් නොමැති අවස්ථාවේදී සහ සියලු අතිරේක ඇප උපලබ්ධි වී ඇති හෝ සමාගමට පැවරනු ලැබ ඇති විට, ණය සහ ණය ආශ්‍රිත ඉඩහැරීම් සමාගම ලියාහරියි. හානිකරණය හදුනාගත් පසු ඇති වූ සිදුවීමක් නිසාවෙන්, පසු කාලීන වසරකදී, හානිකරණය හඳුනා ගැනීමෙන් පසු සිදුවන සිදුවීමක් නිසා, තක්සේරු කරන ලද හානිකරණ අලාභය ඉහළයාම හෝ පහළ යාම සිදුවේනම්, පෙර හඳුනාගත් හානිකරණ අලාභය දීමනා ගිණුම ගැලපීම මගින් වැඩි කිරීම හෝ අඩු කිරීම කෙරේ. අනාගත ලියාහැරීමක් පසුව නැවත අයකරගතහොත්, අයකරගැනීම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයට බැර කරයි.

### 2.5.5.2 මූල්‍ය වගකීම්

වෙළෙඳ ගෙවිය යුතු දෑ, ආශ්‍රිත පාර්ශ්වයන්ට ගෙවිය යුතු දෑ, බැංකු අයිරා සහ පොලි දරන ණය සහ ණය ගැනීම් සමාගමේ මූල්‍ය වගකීම් වලට ඇතුලත් වේ.

#### මූලික හදුනා ගැනීම සහ අගය කිරීම

ශ්‍රීලගිප්‍ර 39 යේ විෂයපථය තුළ වූ මූල්‍ය වගකීම්, ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගයට මූල්‍ය වගකීම්, ණය සහ ණයට ගැනීම් සහ සුදුසු පරිදි ඵලදායී ඉදිරි රැකුමක් සඳහා යොමුකරන ලද ව්‍යුත්පන්නයන් වර්ග කෙරේ. සමාගම මූලික හදුනාගැනීමේ දී මූල්‍ය වගකීම් වර්ග කිරීම තීරණය කරයි.

සියලු මූල්‍ය වගකීම් මූලිකව සාධාරණ අගයට හදුනාගන්නා අතර, ණය සහ ණයට ගැනීම් ක්‍රමක්ෂය පදනමට තබාගනී. සෘජුව ආරෝපනය වන ගනුදෙනු පිරිවැය මීට ඇතුලත් වේ. මූලික සාධාරණ අගය සහ නාමික අගය අතර යම් වෙනසක් ඇත්නම්, එය මෙහෙයුම් කල්බදු ආදායම් සංරචකයක් වශයෙන් ඇතුලත් කරන අතර, අදාළ කාලසීමාව පුරාවට සරල මාර්ග ක්‍රමයට හදුනාගනු ලබයි.

#### පසුකාලීනව අගය කිරීම

පහත සඳහන් පරිදි මූල්‍ය වගකීම් අගය කිරීම ඒවායේ වර්ගීකරණය මත රදා පවතී:

**(අ) ණය සහ ණය ගැනීම්**

මූලික හදුනාගැනීමෙන් පසුව, පොළී දරන ණය සහ ණය ගැනීම් සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය

පිරිවැයට පසු කාලීනව මනිනු ලැබේ. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය පිරිවැය ක්‍රියාවලිය තුළ මෙන්ම වගකීම් ඉවත්කිරීම් සිදු කරනවිට ආදායම් ප්‍රකාශය තුළ ලාභ අලාභ හදුනාගැනේ.

අත්පත් කරගැනීමේ දී ඇති වූ යම් වට්ටමක් සහ අධිමිලක් සහ සඵල පොලී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැය තුළ ඇතුලත් කරයි.

#### ඉවත් කිරීම

වගකීම යටතේ ඇති බැදියාව මුදාහැර ඇති විට හෝ අවලංගුකර ඇතිවිට හෝ කල් ඉකුත්ව ඇතිවිට මූල්‍ය වගකීමක් ඉවත් කෙරේ. සැලකිය යුතු ලෙස වෙනත් නියමයන් මත එම ණයහිමියාගෙන් හෝ පවතින වගකීමක නියමයන් සැලකිය යුතු ලෙස නවීකරණය කිරීමෙන් හෝ දැනට පවතින මූල්‍ය වගකීමක් වෙනසක් මගින් ප්‍රතිසම්පාදනය කලවිට, එවැනි හුවමාරුවක් හෝ නවීකරණයක් මුල් වගකීම ඉවත් කිරීමක් ලෙස සහ නව වගකීමක් හදුනා ගැනීමක් ලෙස සලකනු ලබන අතර අදාළ ධාරණ අගයන්ගේ වෙනස ආදායම් ප්‍රකාශයේ හදුනාගනු ලැබේ.

### 2.5.6 සාධාරණ අගය මැනීම

අගය කරන දිනයට වෙළෙඳපොල සහභාගිවන්නන් අතර නිසිලෙස කරන ගනුදෙනුවක දි වත්කමක් විකිණීම සඳහා ලැබෙන මිල හෝ වගකීමක් පැවරීම සඳහා ගෙවනු ලබන මිල සාධාරණ අගය වේ. වත්කමක් විකිණීම හෝ වගකීම පැවරීමට වන ගනුදෙනුව:

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**2019 දෙසැම්බර් 31 දිනට**

- වත්කම හෝ වගකීම සඳහා වන ප්‍රධාන වෙළෙඳපොලේ දී

  හෝ

- ප්‍රධාන වෙළෙඳපොලක් නැතිවිට දී වත්කම හෝ වගකීම සඳහා වන වඩාත්ම වාසිදායක වෙළෙඳපොලේදී

ප්‍රධාන හෝ වාසිදායක වෙළෙඳපොල සමාගමට ඇතුලත් විය හැකි වෙළෙඳපොලක් වියයුතුය.

වෙළෙඳපොල සහභාගීවන්නන් තමන්ට ආර්ථික වශයෙන් වඩාත්ම වාසිදායක ලෙසට හැසිරේය යන උපකල්පනය කරමින් වත්කම හෝ වගකීම මිල කිරීමේ දී වෙළෙඳපොලට සහභාගීවන්නන් කරනු ලබන උපකල්පන මත පදනම්ව සාධාරණ අගය මනිනු ලැබේ.

ඉහළම හා හොඳම භාවිතය යොදාගනිමින් හෝ ඉහළම සහ හොඳම භාවිතය යොදාගනු ඇතැයි සැලකෙන වෙනත් වෙළෙඳපොලට සහභාගීවන්නෙකුට විකිණීමෙන් වෙළෙඳපොල සහභාගීවන්නෙකුට ඇති ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමේ හැකියාව මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මැනීමේ දී සැලකිල්ලට ගනු ලැබේ.

ඇගයුම් කිරීමේ දී අදාළ නිරීක්ෂණය කලහැකි යෙදවුම් භාවිතය උපරිම කරමින් සහ නිරීක්ෂණය කල නොහැකි යෙදවුම් භාවිතය අවම කරමින් අවස්ථාවට යෝග්‍ය ශිල්පක්‍රම සමාගම යොදාගනී.

මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ අගය මනිනු ලැබූ හෝ හෙළිදරව් කරනු ලැබූ සියලුම වත්කම් හා වගකීම් සාධාරණ අගය මැනීමට සමස්තයක් වශයෙන් වැදගත් පහළම මට්ටමේ යෙදවුම් මත පදනම්ව, සාධාරණ අගය ධූරාවලිය තුළ පහත සඳහන් පරිදි වර්ග කරනු ලබයි.

- මට්ටම 1 - සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළෙඳපොලෙහි ලැයිස්තුගත (නොගැලපූ) මිල ගණන්

- මට්ටම 2 - සාධාරණ අගය මැනීමට වැදගත් සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කල හැකි පහළම මට්ටමේ යෙදවුම් සඳහා වන ඇගයීම් ක්‍රම

- මට්ටම 3 - සාධාරණ අගය මැනීමට වැදගත් සාධාරණ අගය හෙළිදරව් කිරීම සඳහා නිරීක්ෂණය කල නොහැකි පහළම මට්ටමේ යෙදවුම් ඉහත විස්තරකර ඇති ආකාරයට ස්වභාවය, ගුණාංග, වත්කම් හා වගකීම්වල අවධානම් සහ සාධාරණ අගය ධූරාවලියේ මට්ටම පදනම් කරගෙන සමාගම වත්කම් හා වගකීම් පන්තීන් තීරණය කර ඇත.

### 2.5.7 තොග

යල් පැන ගිය සහ සංසරණය අඩු අයිතමයන් සඳහා ප්‍රමාණවත් පරිදි වෙන්කිරීමක් කල පසු, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු වටිනාකමට තොග ආගණනය කෙරේ. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුළ තොග සහ විකිණිය හැකි මිලක් නිම කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදුකිරීමට අත්‍යවශ්‍ය වන ඇස්තමේන්තුගත පිරිවැය අඩුකල පසු ශුද්ධ උපලබ්ධි අගය වේ.

තොග වර්තමාන තත්ත්වයට සහ ස්ථානයට ගෙන ඒමේ දී දරන ලද පිරිවැය, සූත්‍රය භාවිතා කිරීමෙන් ගිණුම්ගත කරනු ලැබේ.

| | | |
|---|---|---|
| පාරිභෝජන ද්‍රව්‍ය, මෝටර් රථ අමතර කොටස් හා අළුත්වැඩියාව සඳහා පොදු භාණ්ඩ | - | පදනම බර තබන ලද සාමාන්‍ය මත මිලදී ගැනීමේ පිරිවැයට |
| නිමි තොග | - | සත්‍ය ගැනුම් පිරිවැයට |

### 2.5.8 දේපල, පිරියත සහ උපකරණ

එදිනෙදා නඩත්තු කිරීමේ පිරිවැය හැර, පිරිවැයේ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණය අඩුකල පසු අගයට දේපල, පිරියත සහ උපකරණ දක්වා ඇත. හඳුනාගැනීමේ නිර්මාපකය සපුරාලන්නේ නම් දේපල, පිරියත සහ උපකරණවල කොටසක් ප්‍රතිසම්පාදනය කිරීමේ පිරිවැය, දැරූවිට එවැනි පිරිවැයට ඇතුලත් වේ.

වසර අවසානයට තව දුරටත් අසම්පූර්ණ තත්ත්වයේ පවතින, භාරගත් කාර්යයන් මත ගෙවන ලද, සියලුම අගයන් කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩවලින් පෙන්නුම් කරයි.

අනිශ්චිත ජීව කාලයක් පවතින බවට සැලකෙන නිසාවෙන් ඉඩම් ක්ෂය නොකරයි. සෑම වත්කමකම පිරිවැය, එකී වත්කම්, භාවිතා කිරීමට හැකි තත්ත්වයට පත්වූ දින සිට ඇරඹෙන පරිදි වන ඒවායේ ඵලදායී ජීවිත කාලය ඒවායේ සුන්බුන් අගයට දක්වා බෙදාහැරීම සඳහා සරල මාර්ග ක්‍රමය මත ක්ෂයවීම් ගණනය කරයි. වත්කම් විකිණීමේ දී වත්කම ඉවත්කරන දින සිට ක්‍ෂයවීම් අවසාන කරයි.

වත්කම්වල සුන්බුන් අගය, ඵලදායී ජීවිත කාලය් සහ ක්ෂය ක්‍රමය සමාලෝචනය කොට යෝග්‍ය වන්නේ නම්, අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දීම ගලපනු ලබයි. වත්කමක ධාරණ අගය එහි අපේක්ෂිත අයකරගත හැකි අගයට වඩා වැඩි වන්නේ නම්, වත්කමක ධාරණ අගය වහාම එහි අයකර අගය දක්වා කපා හරිනු ලබයි.

විකිණීමෙන් ලද මුදල් ධාරණ අගය සමඟ සැසඳීමෙන් බැහැර කිරීම මත ලාභ අලාභ තීරණය කරනු ලබන අතර ඒවා ආදායම් ප්‍රකාශයෙහි ඇතුළත් කරනු ලබයි.

### 2.5.9 අස්පෘශ්‍ය වත්කම්

අ) **ආයතන සම්පත් සැලසුම්කරන (ERP) පද්ධතිය සහ ආයතන සම්පත් සැලසුම්කරන (ERP) බලපත්‍ර ගාස්තු**

මිලට ගත් මෘදුකාංග යෙදුම් සඳහා බලපත්‍ර ලබාගැනීමේ දී දරණ ලද පිරිවැය බලපත්‍ර ගාස්තු මගින් පෙන්නුම් කරයි. බලපත්‍ර ගාස්තු පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**2019 දෙසැම්බර් 31 දිනට**

අඩුකොට ගෙන යයි. බලපත්‍රවල පිරිවැය ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය වන වසර 5 පුරා බෙදාහැරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය ගණනය කරයි.

**2.5.10 මුදල් හා මුදල් සමාන දෑ**

අතැති මුදල් ඉල්ලුම් තැන්පතු සහ පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි සහ වටිනාකම වෙනස්වීම සම්බන්ධයෙන් නොසැලකියයුතු තරමේ අවදානමක් සහිත, ඉහළ ද්‍රවශීලතාවයන් ඇති කෙටිකාලීන ආයෝජන වශයෙන් මුදල් හා මුදල් සමාන දෑ අර්ථකථනය කරනු ලබයි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අරමුණ සඳහා, මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වන්නේ අතැති මුදල් සහ පියවිය යුතු බැංකු අයිරාව අඩුකල පසු ඉතිරිවන බැංකු තැන්පතු වලිනි. මාස තුනක් හෝ ඊට අඩු කල්පිරීම් සහිත ආයෝජනද මුදල් හා මුදල් සමාන දෑ ලෙස සලකනු ලැබේ.

**2.5.11 මූල්‍ය නොවන වත්කම් හානිකරණය**

අනිශ්චිත ජීව කාලයක් සහිත වත්කම් ක්‍රමක්ෂය වීමට භාජනය නොකරන අතර, හානිකරණයවීම සම්බන්ධව පරීක්ෂා කරනු ලබයි. ධාරණ අගය අයකරගැනීමට නොහැකි වනු ඇති බවට සිදුවීම් හෝ අවස්ථාවන්ගේ වෙනස්කම් පෙන්නුම් කරන විට දී, ක්‍රමක්ෂය සඳහා භාජනය වන වත්කම් හානිකරණය සඳහා සමාලෝචනය කරනු ලැබේ. වත්තමක ධාරණ අගය එහි ආපසු අයකරගත හැකි අගය ඉක්මවන ප්‍රමාණයට හානිකර අලාභය හඳුනාගනු ලැබේ. ආපසු අයකරගත හැකි අගය වන්නේ වත්කමේ සාධාරණ අගයෙන් එය විකිණීමට යන පිරිවැය අඩුකල පසු ලැබෙන අගය සහ භාවිත අගය යන දෙකෙන් වඩා වැඩි අගයයි. හානිකරණය තක්සේරු කිරීමේ අරමුණ සඳහා, වෙන් වෙන්ව හඳුනාගත හැකි මුදල් ප්‍රවාහයන් (මුදල් ජනනය කරන ඒකක) ඇති පහළම මට්ටම්වලට වත්කම් කාණ්ඩ කරනු ලැබේ.

**2.5.12 වෙන්කිරීම්**

සමාගමට, අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන බැඳීමක් (නීතිමය හෝ සම්ප්‍රයුක්ත) පවතින විට, මෙම බැඳීම් නිරාකරණය කිරීමට ආර්ථික ප්‍රතිලාභ හා බැඳුණු සම්පත් පිටතට ගලායාමේ සම්භාවිතාවක් ඇති විට සහ බැඳීමේ ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ලෙස ඇස්තමේන්තුවක් කලහැකි විටක, වෙන්කිරීම් හඳුනාගනු ලැබේ. වෙන්කිරීම මුළුමනින්ම හෝ කොටස් ප්‍රතිපූර්ණ කිරීමට සමාගම අපේක්ෂා කරනවිට, එම ප්‍රතිපූර්ණය සැබැවින්ම නිශ්චිත නම් පමණක්, එය අඩුකල පසු ලැබෙන අගයට ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලැබේ. මුදලේ කාල වටිනාකම සැලකිය යුතු වන්නේ නම්, වෙන්කිරීම් තීරණය කරනු ලබන්නේ, අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් මුදලේ කාල වටිනාකම පිළිබඳ ප්‍රවර්තන වෙළෙඳපොල තක්සේරුකිරීම් සහ යෝග්‍ය විටදී වගකීමට විශේෂිත වන අවදානම පෙන්නුම් කරන බදු පෙර අනුපාතයට වට්ටම් කිරීමෙහි වට්ටම් කිරීම භාවිතා කරන විට, කාල පරාසය හේතුවෙන් වෙන්කිරීමෙහි සිදුවන ඉහළයාම, පොළී වියදම් ලෙස හඳුනා ගැනේ.

**2.6 සේවක ප්‍රතිලාභ**

**(අ) නිශ්චිත ප්‍රතිලාභ බැදීම - පාරිතෝෂිකය**

'ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය' භාවිතා කරමින් සෑම මූල්‍ය වර්ෂයකදීම, ආයුගණකයකුගේ අවවාද අනුව සමාගම විසින් නිශ්චිත සැලසුමක් ලෙස සලකනු ලබන පාරිතෝෂික බැඳීම්වල පොරොන්දු වූ විශ්‍රාම ප්‍රතිලාභවල වර්තමාන අගය ගිණුම් කරනු ලබයි. ආයුගණක ලාභ සහ අලාභ ඒවා හටගන්නා කාලසීමාව තුලදී වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගනු ලබයි. වගකීම මූල්‍යනය කරනු නොලැබේ.

**ආයුගණන ලාභ සහ අලාභ හඳුනාගැනීම**

ආයුගණන ලාභ සහ අලාභ ඒවා හටගන්නා වර්ෂය තුලදී වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගනු ලබයි.

**(ආ) නිශ්චිත දායක සැලසුම්**

සමාගම නිශ්චිත දායක සැලසුමක් ද ක්‍රියාත්මක කරයි. නිශ්චිත දායක සැලසුම සඳහා ගෙවිය යුතු දායකය, සේවකයන් විසින් සමාගමට සැපයූ සේවයට සමානුපාතික වන අතර,'කාර්යමණ්ඩල වියදම්' යටතේ වාර්තා කරයි. නොගෙවූ දායක මුදල් වගකීමක් ලෙස වාර්තා කරයි.

සමාගම පහත සඳහන් යෝජනාක්‍රම සඳහා දායක වේ.

**සේවක අර්ථසාධක අරමුදල**

සමාගම හා සේවකයා විසින් පිළිවෙලින් සේවකයාගේ මාසික දළ වැටුපෙන් (අතිකාල රහිතව) 15% සහ 10% බැගින් සේවක අර්ථසාධක අරමුදලට දායක වේ.

**සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල**

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් පවත්වාගෙන යන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සේවකයාගේ මාසික දළ වැටුපෙන් අතිකාල රහිතව 3% ක් සමාගම දායක වේ.

**(ඇ) වෛද්‍ය ප්‍රතිලාභ යෝජනාක්‍රමය**

CPSTL සේවකයින් සඳහා වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ජනශක්ති පොදු රක්ෂණ සමාගම විසින් පාලනය කෙරේ. සමාගම විසින් රක්ෂණ සමාගමට ගෙවූ රක්ෂණ වාරිකය වසර තුළ වියදමක් ලෙස හඳුනා ගනී.

**2.7 නිකුත් කරන ලද නමුත් මෙතක් බලාත්මක නොවන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවල බලපෑම**

නව ගිණුම් ප්‍රමිත සමහරක් සහ පවතින ප්‍රමිත වලට සංශෝධන/වැඩි දියුණු කිරීම් ප්‍රකාශයට පත්කොට ඇති වුවත් 2017 මාර්තු 31 ගිණුම් කාලපරිච්ඡේදය සඳහා අනිවාර්ය නොවේ. ඒවායින් කිසිවක් සමාගම විසින් පෙර භාවිතා කර නොමැත.

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**2019 දෙසැම්බර් 31 දිනට**

**ශ්‍රීලමුවාප්‍ර 9 මූල්‍ය සාධන පත්‍ර**
2014 දෙසැම්බර් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින්, මූල්‍ය සාධන පත්‍ර ව්‍යාපෘතිවල සියලුම අවධීන් ප්‍රතිබිම්බනය කරන ශ්‍රීලමුවාප්‍ර 9 මූල්‍ය සාධන පත්‍ර වල අවසාන පිටපත නිකුත් කර ඇති අතර, එය මූල්‍ය සාධන පත්‍ර හදුනාගැනීම සහ මැණීම සදහා වන ශ්‍රීලගිප්‍ර 39 වෙනුවට ඉදිරිපත් කර ඇත. හානිකරණය වර්ගීකරණය සහ මැණීමේ සහ මතු සුරක්ෂණ ගිණුම්කරණය පිළිබඳ නව අවශ්‍යතාවයන් ප්‍රමිතිය මගින් හදුන්වා දී ඇත. පෙර භාවිතයට අවසර ලබාදෙමින්, 2018 ජනවාරි 01 දායින් පසුව ඇරඹෙන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා ශ්‍රීලගිප්‍ර 39 බලාත්මක වේ. අතීතයට බලපාන ලෙස භාවිත කිරීම අවශ්‍ය වේ. නමුත් සංසන්දනාත්මක තොරතුරු අනිවාර්ය නොවේ. සංශෝධන යොදා ගැනීමෙන් සමාගමේ මූල්‍ය ප්‍රකාශ වලට බලපෑමක් ඇතිවනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

ශ්‍රීලමුවාප්‍ර 15 ගනුදෙනුකරුවන් සමග ඇති ගිවිසුම් වලින් අයභාරය

ගණුදෙනුකරුවකු සමග ඇති ගිවිසුම් මගින් ජනනය වන ආකාරයේ සහ මුදල් ප්‍රවාහයන්ගේ ස්වභාවය, ප්‍රමාණය, කාලය සහ අවිනිශ්චිතතාවය පිළිබඳව මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට ප්‍රයෝජනවත් තොරතුරු වාර්තා කිරීම සඳහා ආයතනයක් විසින් අනුගමනය කලයුතු මූලධර්ම සකස්කිරීම මෙම ප්‍රමිතියේ අරමුණ වේ.

ශ්‍රීලමුවාප්‍ර 15  2018 ජනවාර් 01 දින බලාත්මක වන අතර සමාගම බණිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදාහැරීම සිදුකරන බැවින් සංශෝධන යොදාගැනීම සමාගමේ විෂයපථය යටතට අයත් නොවන බව සමාගම අපේක්ෂා කරයි.

**ශ්‍රීලමුවාප්‍ර 16 කල්බදු**
2016 ජනවාරියේ දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් කල්බදු ගිණුම්කරණය සඳහා ශ්‍රීලමුවාප්‍ර 16 කල්බදු බව ප්‍රමිතිය නිකුත්කර ඇත. නව ප්‍රමිතය මගින් කල්බදු දීමනාකරුවන් සඳහා කල්බදු ගිණුම්කරණය සැලකියයුතු ලෙස වෙනස් කර නැත. කෙසේ නමුත් කල්බදු ගිණුම් කරුවන්ට ඔවුන්ගේ ශේෂපත්‍ර වල පාවිච්චි කිරීමට ඇති අයිතිය අනුරූපිත වත්කමක් ලෙස ගෙන,වගකීම් ලෙස හදුනාගැනීමට අවශ්‍යවේ. සියලුම හදුනාගත් කල්බදු සඳහා කල්බදු ගැණුම්කරුවන් විසින් එක් ආකෘතියක් යොදාගතයුතු නමුදු 'කෙටිකාලීන' කල්බදු සහ 'අඩු වටිනාකම්' සහිත වත්කම් හදුනා ගැනීමට, තෝරාගැනීමක් කල හැක. සාමාන්‍යයෙන් හදුනාගත් කල්බදු සඳහා ලාභ හෝ අලාභ හඳුනාගැනීමේ රටාව, වර්තමානයේ මූල්‍ය කල්බදු ගිණුම්කරණයට සමානවනු ඇති අතර, පොලී සහ ක්ෂය වියදම් ලාභාලාභ ප්‍රකාශයේ වෙන්වෙන්ව හදුනාගනු ලබයි.

2019 ජනවාරි 01 දින හෝ ඉන් පසුව ඇරඹෙන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා ශ්‍රීලමුවාප්‍ර 16 බලාත්මක වේ. පෙර භාවිතයට අවසර ඇති නමුදු අයිතීත්වය විසින් ජාමුවාප්‍ර 15 භාවිතයට පෙර නොවිය යුතුය. අතීතයට බලපාන ලෙස භාවිත කිරීම හෝ වැඩි දියුණු කරන ලද ක්‍රමවේදයන් යොදා ගනිමින් ප්‍රමිතය භාවිත කිරීම සඳහා කල්බදු ගැනුම්කරුට තෝරාගත හැක. ප්‍රමිතයේ සංක්‍රාන්ති ප්‍රතිපාදනයන් යම් සහනයක් සලසයි.

වර්තමානයේ CPSTL කල්බදුකරුවන් නොමැති බැවින් ශ්‍රීලමුවාප්‍ර 16 මගින් කල්බදු මත කිසිදු බලපෑමක් නොමැත.

**ශ්‍රීලගිප්‍ර 07 මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සංශෝධන**
2016 සැප්තැම්බර්, මූල්‍ය ක්‍රියාකාරකම්වල හෙලිදරව් කිරීම් වැඩිදියුණු කිරීමේ සහ වාර්තාකරන අස්ථිත්වයේ ද්‍රවශීලතා තත්ත්වය පිළිබඳව භාවිතාකරන්නන්ට හොඳින් වටහා ගැනීමට උදව් කිරීමට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ශ්‍රීලගිප්‍ර 07 මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සංශෝධනයක් නිකුත් කර ඇත. නව අවශ්‍යතාවයන් යටතේ, මුදල් ප්‍රවාහයන් සහ මුදල් නොවන අයිතමයන්ගේ වෙනස්කම් වැනි මූල්‍ය ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් අස්ථිත්වයන්ගේ මූල්‍ය වගකීම්වල සිදුවන වෙනස්කම් අස්ථිත්වයන් විසින් හෙළිදරව් කල යුතුය. (උදා: විදේශ විනිමය චලනයන් හේතුවෙන් ඇතිවන ලාභ සහ අලාභ) සංශෝධනයන් 2017 ජනවාරි 01 දින බලාත්මක වේ.

**අගිප්‍ර 12 ආදායම් බදු සංශෝධන**
2016 සැප්තැම්බර් මස දී අගිප්‍ර 12 සංශෝධනයන් ඉදිරිපත් කිරීම තුලින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ගිණුම්කරණය සඳහා සාධාරණ අගයටත්, බදු කටයුතු සඳහා පිරිවැයටත් මනින ලද ණය සාධන පත්‍රවල විලම්බිත බදු වත්කම් සඳහා වන ගිණුම්කරණ ක්‍රමය පැහැදිලි කරයි. සංශෝධනයන් 2017 ජනවාරි 01 දින බලාත්මක වේ. සංශෝධන යොදා ගැනීමෙන් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට බලපෑමක් ඇතිවනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

### 2.7.1. පොදු භාවිත පහසුකම් කොටස් හිමියන්ගේ ගිවිසුම හා කොටස් විකුණුම් මිලට ගැනීමේ ගිවිසුම කල් ඉකුත් වීම

ලංකා ඛනිජතෙල් සංස්ථාව, ලංකා ඉන්දියන් තෙල් සමාගම පීඑල්සී, සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් කොටස් හිමියන්ගේ ගිවිසුම සහ කොටස් විකුණුම් මිලට ගැනීමේ පොදු භාවිත පහසුකම් ගිවිසුම 2008 දෙසැම්බර් 31 දා කල් ඉකුත් විය. එම ගිවිසුම අලුත් කිරීම හෝ දීර්ඝ කිරීම තවම අවසන්කොට නොමැති අතර එය ගිවිසුමේ කොන්දේසි සහ සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කරන ලද යම් පසුකාලීන වෙනස්කම් සැලකිල්ලට ගැනීමෙන් පසු මෙම ගිවිසුමට අදාළ ආදායම් වියදම් මෙම මූල්‍ය ප්‍රකාශවල ගිණුම්ගත කර ඇත.

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**2019 දෙසැම්බර් 31 දිනට**

| | | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| 3. | ආදායම | | |
| 3.1 | ප්‍රධාන ආදායම | | |
| | පර්යන්ත මෙහෙයුම් | **9,084,844,481** | 7,219,578,282 |
| | ආන්තිකය | **3,400,967,743** | 3,233,860,313 |
| | ප්‍රතිපූර්ණය කළහැකි ණය පොළිය | **-** | - |
| | | **12,485,812,224** | 10,453,438,595 |
| | සේවා සැපයීම | | |
| | ප්‍රවාහන ආදායම | **2,854,063,742** | 2,676,786,208 |
| | තෙල් නැව් මෙහෙයුම් | **-** | - |
| | | **2,854,063,742** | 2,676,786,208 |
| | මුළු ආදායම | **15,339,875,966** | 13,130,224,803 |
| 4 | වෙනත් මෙහෙයුම් ආදායම | | |
| | කාර්ය මණ්ඩල ණය සහ වෙනත් දෑ සඳහා පොලිය | **646,713,133** | 579,450,678 |
| | දේපල, පිරියත හා උපකරණ විකිණීම මත ලාභය | **29,445,300** | 26,421,610 |
| | කුලී ආදායම | **10,292,479** | 9,885,375 |
| | මුද්‍රාහැරීමේ ගාස්තු | **2,100,000** | 1,350,000 |
| | විද්‍යාගාර පරීක්ෂණ ගාස්තු | **49,055,922** | 53,680,584 |
| | පුද්ගලික බව්සර් රියදුරන්ට/පොටර්වරුන්ට පුහුණුව | **4,534,910** | 4,818,444 |
| | සුන්බුන් අලෙවිය | **5,226,593** | 8,391,795 |
| | ගිනි නිවීමේ උපකරණ සේවා | **1,883,303** | 1,948,343 |
| | ක්‍රමාංකන ගාස්තු | **7,359,265** | 8,105,578 |
| | විවිධ ආදායම | **15,187,628** | 4,122,299 |
| | සංචාරක බංගලා ආදායම | **885,105** | 820,184 |
| | ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු | **3,316,464** | 5,338,223 |
| | දිගුකාලීන හිඟ ණයහිමි ශේෂ ආපසු ගෙවීම | **76,348,694** | - |
| | | **852,348,796** | 704,333,113 |
| 4.1 | වෙනස්කළ නොහැකි ණය කපාහැරීම | **70,222,231** | - |
| | දිගුකාලීන හිඟ ණය ශේෂ ආපසු ගෙවීම | | |
| | | **70,222,231** | - |
| 5. | මූල්‍ය ආදායම | | |
| | මූල්‍ය ආදායම | | |
| | ප්‍රති ආයොජන (REPO) මත පොළීය | **55,437,509** | 40,576,962 |
| | තැන්පතු මත පොළිය | **267,592,341** | 77,300,237 |
| | | **323,029,850** | 117,877,199 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**2019 දෙසැම්බර් 31 දිනට**

| | | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| 6. | **බදු පෙර ලාභය** **පහත දෑ අයකිරීමෙන්/බැරකිරීමෙන් පසු** | | |
| | **සෘජු වියදම්වල ඇතුළත් දෑ** | | |
| | පුද්ගලික පිරිවැය | **2,934,549,917** | 2,954,073,137 |
| | වසර සඳහා ක්ෂයවීම් ගාස්තු | **847,972,657** | 820,253,095 |
| | **පරිපාලන වියදම්වල ඇතුළත් දෑ** | | |
| | අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික | **4,514,718** | 8,539,121 |
| | අධ්‍යක්ෂවරු සඳහා ගාස්තු | **1,448,347** | 2,893,207 |
| | පුද්ගලික පිරිවැය | **3,337,383,921** | 3,491,632,362 |
| | නිශ්චිත ප්‍රතිලාභ බැඳීම : වසර සඳහා ගාස්තුව | **265,146,147** | 226,725,802 |
| | විගණන ගාස්තුව - පවත්නා වසර | **1,980,000** | 1,943,223 |
| | වසර සඳහා ක්ෂයවීම් ගාස්තු | **155,199,006** | 131,147,766 |
| | වසර සඳහා ක්‍රමක්ෂය ගාස්තු | **25,908,400** | 4,486,998 |
| | වෙළෙඳ හා අනෙකුත් ලැබීම් හි හානිකරණය සඳහා අත්තිකාරම් | **-** | (174,665,455) |
| | සේවක ණය සඳහා හානිකරණය සඳහා අත්තිකාරම්/(ආපසු හැරවීම) | **-** | - |
| | තොග සඳහා වෙන්කිරීම | **11,978,285** | (127,236,542) |

7. **බදු වියදම්**

2019 දෙසැම්බර් 31 සහ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂ සඳහා ආදායම් බදු වියදම්වල ප්‍රධාන සංරචක පහතින් දැක්වේ

7.1 **ආදායම් ප්‍රකාශය**

| | 2019 රු. | 2018 රු. |
|---|---|---|
| **වර්තන ආදායම් බද්ද:** | | |
| වර්තන බදු වියදම් | **1,045,291,808** | 333,928,430 |
| පෙර වර්ෂය වෙනුවෙන් වර්තන බදු ඌණ / අධි වෙන්කිරීම | **(9,075,934)** | 28,844,501 |
| **විලම්භිත බදු;** | | |
| විලම්භිත බදු අයකිරීම /(බැර) (සටහන 8) | **126,313,172** | 962,139,274 |
| **ආදායම් ප්‍රකාශනයේ වාර්තාකරන ආදායම් බදු වියදම /(බැර)** | **1,162,529,046** | 1,324,912,205 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**2019 දෙසැම්බර් 31 දිනට**

7.2 2019 දෙසැම්බර් 31 සහ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා බදු වියදම හා ගිණුම්කරණ ලාභය ව්‍යවස්ථාපිත බදු අනුපාතයෙන් ගුණ කිරීමෙන් ලද ලාභය අතර සැසැඳුම පහත දැක්වේ:

| | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|
| බදු පෙර ගිණුම්කරණ ලාභය | **2,927,856,033** | 1,522,230,109 |
| ඉඩ නොදෙන ලද සමස්ථ අයිතමයන් | **1,502,301,316** | 1,457,934,083 |
| ඉඩ දෙන ලද සමස්ථ අයිතමයන් | **(1,138,864,596)** | (1,979,521,282) |
| | **3,291,292,753** | 1,000,642,910 |
| පොළී ආදායම | **441,892,274** | 305,279,692 |
| මුළු ව්‍යවස්ථාපිත ආදායම | **3,733,185,027** | 1,305,922,601 |
| අඩුකළා : ඉදිරියට ගෙනා භාවිතාකළ බදු අලාභ | **-** | - |
| බදුකළහැකි ලාභය | **3,733,185,027** | 1,305,922,601 |
| බදුකළහැකි ලාභය සඳහා ආදායම් බදු | **1,045,291,808** | 333,928,430 |
| **වර්ථන ආදායම් බදු වියදම්** | **1,045,291,808** | 333,928,430 |

## 8. විලම්භිත බදු වගකීම්

### 8.1 විලම්භිත බදු

විලම්භිත බදු වත්කම්, වගකීම් සහ ආදායම් බදු පහත පරිදි අදාළ වේ ;

| | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | | විස්තීරණ ආදායම් ප්‍රකාශය | | අනෙකුත් විස්තීර්ණ ආදායම | |
|---|---|---|---|---|---|---|
| | 2019<br>රු. | 2018<br>රු. | 2019<br>රු. | 2018<br>රු. | 2019<br>රු. | 2018<br>රු. |
| **විලම්භිත බදු වත්කම්** | | | | | | |
| බදු අරමුණ සඳහා ප්‍රාග්ධන දීමනා | **2,561,923,931** | 2,355,880,566 | **206,043,365** | 1,096,959,160 | **-** | - |
| අස්පෘශ්‍ය වත්කම් | **8,418,715** | 1,997,748 | **6,420,967** | 1,960,412 | **-** | - |
| | **2,570,342,646** | 2,357,878,314 | | | | |
| **විලම්භිත බදු වත්කම්** | | | | | | |
| තොග | **4,597,959** | 3,829,479 | **(768,480)** | 15,378,737 | **-** | - |
| වෙන්කිරීම් | **2,122,648** | 1,851,253 | **(271,395)** | 22,642,655 | **-** | - |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් | **477,707,513** | 354,571,409 | **(85,111,285)** | (174,801,690) | **(38,024,819)** | 18,334,523 |
| බදු අලාභයෙන් බලපෑම | **-** | - | **-** | - | **-** | - |
| | **484,428,119** | 360,252,141 | | | | |
| විලම්භිත ආදායම් බදු -ආදායම | | | | | | |
| **ශුද්ධ විලම්භිත බදු වගකීම/(වත්කම්)** | **2,085,914,526** | 1,997,626,173 | **126,313,172** | 962,139,274 | **(38,024,819)** | 18,334,523 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**2019 දෙසැම්බර් 31 දිනට**

8.2 24.42%ක ඵලදායි බදු අනුපාතයක් භාවිතා කරමින් විලම්භිත බදු ගණනය කර ඇත. බදු අයකළහැකි ආදායමේ විවිධ මට්ටම්වලට භාවිතා කළ තනි බදු අනුපාත හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට විලම්භිත බදුවල රු. 88,288,353/- ක වැඩිවීමක් ඇතිකරමින්, බදු අනුපාතය 24.42% සිට 28.0% දක්වා වැඩි වී ඇත.

## 9. කොටසක ඉපයීම්

9.1 කොටසක ඉපයීම ගණනය කරනු ලබන්නේ සාමාන්‍ය ස්කන්ධ ප්‍රාග්ධන හිමිකරුවන්ට ආරෝපිත කාල පරිච්ඡේදය සඳහා වන ශුද්ධ ලාභය වර්ෂය තුළ බර තැබූ සාමාන්‍ය කොටස් ගණනින් බෙදීමෙනි. මෙම පරිච්ඡේදය සහ පෙර කාල පරිච්ඡේදය තුළ නිකුත් ව පවත්නා සාමාන්‍ය කොටස්වල සාමාන්‍ය බරතබන ලද සංඛ්‍යාව ප්‍රසාද දීමනාව වැනි මූලාශ්‍රයන්හි අනුරූප වෙනසක් නොමැතිව නිකුත් ව පවත්නා සාමාන්‍ය කොටස් සංඛ්‍යාව වෙනස් වී ඇති සිදුවීම් සඳහා ගලපනු ලැබේ.

9.2 කොටසක ඉපයීම ගණනය කිරීම සඳහා භාවිතා කළ ආදායම් සහ කොටස් දත්ත පහතින් දැක්වේ.

| | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|
| **ලවය වශයෙන් යොදාගත් සංඛ්‍යාවන්** | | |
| කොටසක මූලික ඉපයීම් සඳහා සාමාන්‍ය කොටස් හිමියන්ට හිමිවන ශුද්ධ ලාභය | **1,765,326,987** | 197,317,904 |
| **හරය වශයෙන් යොදාගත් සාමාන්‍ය කොටස් සංඛ්‍යාව** | | |
| මූලික කොටසක ඉපයුමට අදාළ වන නිකුත්ව ඇති බරතැබූ සාමාන්‍ය කොටස් ගණන | **750,000,000** | 750,000,000 |
| කොටසක මූලික ඉපයුම | **2.35** | 0.26 |

## 10. දේපල, පිරියත හා උපකරණ

### 10.1 දළ ධාරණ අගය

| පිරිවැයට | 01.01.2019 දිනට ශේෂය රු. | එකතුකිරීම් රු. | මාරුකිරීම් රු. | බැහැරකිරීම් රු. | 31.12.2019 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | **4,497,001,663** | 308,516,741 | | | **4,805,518,404** |
| සින්නක්කර ගොඩනැගිල්ල | **1,684,811,781** | 50,333,405 | | | **1,735,145,186** |
| ගබඩා ටැංකිය | **6,542,365,958** | 374,267,372 | | | **6,916,633,330** |
| මෝටර් රථ | **1,837,636,417** | 72,928,243 | | (40,205,504) | **1,870,359,156** |
| නළ මාර්ග | **7,447,106,547** | 361,657,005 | | (12,125,000) | **7,796,638,552** |
| ලිබඩු, සවිකිරීම් හා උපකරණ | **2,260,453,057** | 88,302,134 | (164,894,400) | (2,641,315) | **2,181,219,476** |
| පරිගණක | **295,590,104** | 31,720,060 | | (29,800) | **327,280,364** |
| තනි/ ද්විත්ව ශීර්ෂ බෝයාව | **2,800,409,453** | 140,427,145 | 164,894,400 | | **3,105,730,997** |
| පොම්ප සහ ග්‍රැන්ට් | **1,454,685,884** | 135,200 | | | **1,454,821,084** |
| **ක්ෂයකළ හැකි වත්කම්වල මුළු පිරිවැය** | **28,820,060,864** | 1,428,287,305 | - | (55,001,619) | **30,193,346,549** |
| නොනිමි ප්‍රාග්ධනය | **635,514,312** | 353,765,596 | (801,206,338) | | **188,073,569** |
| | **29,455,575,176** | 1,782,052,901 | (801,206,338) | (55,001,619) | **30,381,420,118** |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**2019 දෙසැම්බර් 31 දිනට**

## 10.2 ක්ෂයවීම්

| පිරිවැයට | 01.01.2019 දිනට ශේෂය රු. | වසර සඳහා අයකිරීම රු. | මාරුකිරීම් රු. | බැහැරකිරීම් රු. | 31.12.201 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | **631,480,795** | 48,906,831 | | | **680,387,626** |
| ගබඩා ටැංකිය | **2,587,514,829** | 160,928,774 | | | **2,748,443,603** |
| මෝටර් රථ | **1,288,889,610** | 163,450,502 | | (31,850,351) | **1,420,489,761** |
| නළ මාර්ග | **3,206,008,179** | 280,178,720 | | (12,125,000) | **3,474,061,899** |
| ලිබඩු, සවිකිරීම් හා උපකරණ | **1,933,240,503** | 71,112,165 | (164,894,400) | (1,226,378) | **1,838,231,890** |
| පරිගණක | **164,058,266** | 35,180,010 | | (29,800) | **199,208,476** |
| තනි/ ද්විත්ව ශීර්ෂ බෝයාව | **2,476,564,859** | 190,537,983 | 164,894,400 | | **2,831,997,242** |
| පොම්ප සහ ග්‍රැන්ට් | **1,120,963,392** | 52,876,678 | | | **1,173,840,070** |
| | **13,408,720,433** | 1,003,171,663 | - | (45,231,529) | **14,366,660,567** |

| | 2019 රු. | 2018 රු. |
|---|---|---|
| **10.3 ශුද්ධ පොත් වටිනාකම** | | |
| සින්නක්කර ඉඩම් | **4,805,518,404** | 4,497,001,663 |
| සින්නක්කර ගොඩනැගිලි | **1,054,757,560** | 1,053,330,986 |
| ගබඩා ටැංකිය | **4,168,189,727** | 3,954,851,130 |
| මෝටර් රථ | **449,869,395** | 548,746,807 |
| නළ මාර්ග | **4,322,576,653** | 4,241,098,368 |
| ලිබඩු, සවිකිරීම් හා උපකරණ | **342,987,586** | 327,212,554 |
| පරිගණක | **128,071,889** | 131,531,838 |
| තනි/ ද්විත්ව ශීර්ෂ බෝයාව | **273,733,754** | 323,844,594 |
| පොම්ප සහ ග්‍රැන්ට් | **280,981,014** | 333,722,492 |
| නොනිමි ප්‍රාග්ධනය | **188,073,569** | 635,514,312 |
| **දේපල, පිරියත හා උපකරණවල මුළු ධාරණ අගය** | **16,014,759,551** | 16,046,854,744 |

**10.4** මූල්‍ය වර්ෂය තුළ, සමස්ථ වටිනාකම රු. 1,782,052,901/- (2018 - රු.573,028,893/-) ක් වූ දේපල, පිරියත හා උපකරණ සමාගම අත්පත් කරගෙන ඇත. දේපල, පිරියත හා උපකරණ මිලට ගැනීම සඳහා වර්ෂය තුළදී රු. 980,846,563/- (2018 - රු.375,230,766/-) ක් වන මුදල් ගෙවීම් සිදුකර ඇත. මෙම වෙනස ප්‍රධාන වශයෙන් ප්‍රධාන වත්කම්වලට නොනිමි ප්‍රාග්ධනය ප්‍රාග්ධනකරණය කිරීම හේතු වී ඇත.

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**2019 දෙසැම්බර් 31 දිනට**

| | | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| 10.5 | වත්කම්වල ඵලදායී ජීවකාලයන් පහත පරිදි ඇස්තමේන්තු කර ඇත: | | |
| | සින්නක්කර ගොඩනැගිලි | **වසර 35** | වසර 35 |
| | ගබඩා ටැංකි | **වසර 40** | වසර 40 |
| | තොග ටැංකි | **වසර 30** | වසර 30 |
| | නළ මාර්ග | **වසර 30** | වසර 30 |
| | පොම්ප | **වසර 20** | වසර 20 |
| | මෝටර් රථ | | |
| | - නව අත්කරගැනීම් | **වසර 5** | වසර 5 |
| | - පැවරුණු අයිතමයන් | තවදුරටත් පවත්නා | එළදායී ජීව කාලය |
| | ග්‍රැන්ට් | **වසර 15** | වසර 15 |
| | උපකරණ | | |
| | - ඉලෙක්ට්‍රොනික් | **වසර 5** | වසර 5 |
| | - වෙනත් | **වසර 10** | වසර 10 |
| | ලිබඩු, සවිකිරීම් | | |
| | - දැඩි | **වසර 5** | වසර 5 |
| | - වෙනත් | | |
| | මුහුදුබඩ වෙනත් වත්කම් | | |
| | - ද්විත්ව ශීර්ෂ බෝයාව | **වසර 10** | වසර 10 |
| | - PLEM | **වසර 10** | වසර 10 |
| | - නළ මාර්ග | **වසර 20** | වසර 20 |
| | පරිගණක | **වසර 4** | වසර 4 |

| | පිරිවැයට | ERP ක්‍රමය රු. | SAP ERP බලපත්‍රය රු. | අක්වෙරළ නළමාර්ග ස්වයංක්‍රියකරණ පද්ධතිය රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|
| 11. | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 11.1 | දළ ධාරණ ගණන | | | | |
| | **2019.01.01 දිනට** | 542,038,595 | 9,380,250 | 37,793,560 | **589,212,405** |
| | එකතු කිරීම් | - | - | - | **-** |
| | බැහැර කිරීම් | - | - | - | **-** |
| | **2019.12.31 දිනට** | 542,038,595 | 9,380,250 | 37,793,560 | **589,212,405** |
| 11.2 | ක්‍රමක්ෂය | | | | |
| | **2019.01.01 දිනට** | 414,697,035 | 9,380,250 | 37,793,560 | **461,870,845** |
| | වසර සඳහා අයකිරීම | 25,908,400 | - | - | **25,908,400** |
| | **2019.12.31 දිනට** | 440,605,435 | 9,380,250 | 37,793,560 | **487,779,245** |
| 11.3 | **2018.12.31 දිනට ශුද්ධ පොත් වටිනාකම** | 127,341,561 | - | - | **127,341,561** |
| 11.4 | **2019.12.31 දිනට ශුද්ධ පොත් වටිනාකම** | 101,433,160 | - | - | **101,433,160** |

11.5 අස්පෘශ්‍ය වත්කම්වලට රු. 459,670,406/-(2018- රු. 459,670,406/-) ක දළ ධාරණ මුදලක් සහිත සම්පූර්ණයෙන් ක්ෂයකළ වත්කම් ඇතුළත්ය.

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**2019 දෙසැම්බර් 31 දිනට**

| | | | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|---|
| 12. | තොග | | | |
| | අලුත්වැඩියා සඳහා වන සාමාන්‍ය ද්‍රව්‍ය | | **339,784,780** | 301,864,715 |
| | මෝටර් රථ අමතර කොටස් | | **284,544,373** | 282,030,574 |
| | පාරිභෝගික ද්‍රව්‍ය | | **59,999,685** | 80,505,712 |
| | නිමි භාණ්ඩ | | | |
| | ලංකා පෙට්රල් LP-95 | | **788,088** | 788,088 |
| | ලංකා පෙට්රල් LP-92 | | **567,567** | 1,442,844 |
| | ලංකා ඔටෝ ඩීසල්-LAD | | **6,578,343** | 6,670,165 |
| | | | **692,262,836** | 673,302,098 |
| | භාවිතය අඩු තොග සඳහා වෙන්කිරීම | | **(16,421,281)** | (15,681,734) |
| | | | **675,841,555** | 657,620,365 |
| 13. | වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | | | |
| | වෙළෙඳ ලැබියයුතු දෑ- සම්බන්ධිත පාර්ශව (සටහන 13.1) | | **6,693,857,641** | 6,088,960,136 |
| | වෙනත් ලැබියයුතු දෑ | | **328,637,986** | 240,174,077 |
| | | | **328,637,986** | 240,174,077 |
| | තැන්පතු, අත්තිකාරම් සහ පෙර ගෙවීම් (සටහන 13.3) | | **1,225,148,039** | 1,350,100,920 |
| | | | **8,247,643,666** | 7,679,235,133 |
| 13.1 | වෙළඳ ලැබිය යුතු දෑ - සම්බන්ධිත පාර්ශව | | | |
| | | **සම්බන්ධතාව** | | |
| | ලංකා ඛණිජ තෙල් සංස්ථාව | මව් අස්ථිත්වය | **6,317,852,698** | 5,682,366,384 |
| | ලංකා ඛණිජ තෙල් සංස්ථාව හානිකරණයෙන් පසු (සටහන 13.2) | | **6,317,852,698** | 5,682,366,384 |
| | ලංකා ඉන්දියන් තෙල් සමාගම | අනෙකුත් ප්‍රධාන කොටස් හිමියා | **376,004,943** | 406,593,752 |
| | ලංකා ඉන්දියන් තෙල් සමාගම හානිකරණයෙන් පසු (සටහන 13.2) | | **376,004,943** | 406,593,752 |
| | | | **6,693,857,641** | 6,088,960,136 |

13.2 2019 දෙසැම්බර් 31 දිනට, වෙළෙඳ ලැබිය යතු දෑ හී වයස විශ්ලේෂණය පහත පරිදි වේ.

| | එකතුව | දින 0-30 | දින 31-90 | දින 91-180 | දින 181-365 | දින 365 ට වැඩි |
|---|---|---|---|---|---|---|
| ලංකා ඛණිජ තෙල් සංස්ථාව | 6,317,852,698 | 1,208,434,158 | 2,888,971,060 | 429,838,274 | 284,986,078 | 1,505,623,128 |
| | 6,317,852,698 | 1,208,434,158 | 2,888,971,060 | 429,838,274 | 284,986,078 | 1,505,623,128 |
| ලංකා ඉන්දියන් තෙල් සමාගම | 376,004,943 | 68,250,139 | 64,597,537 | 33,481 | - | 243,123,787 |
| | 376,004,943 | 68,250,139 | 64,597,537 | 33,481 | - | 243,123,787 |

| | | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| 13.3 | තැන්පතු, අත්තිකාරම් සහ පෙර ගෙවීම් | | |
| | තැන්පතු, පෙර ගෙවීම් සහ අත්තිකාරම් | **240,899,871** | 486,080,333 |
| | පෙර ගෙවූ සේවක ප්‍රතිලාභ | **984,248,168** | 864,020,587 |
| | | **1,225,148,039** | 1,350,100,920 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**2019 දෙසැම්බර් 31 දිනට**

| | | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|---|
| **14.** | **වෙනත් මූල්‍ය වත්කම්** | | |
| | සමාගමේ නිලධාරීන්ට ණය | | |
| | මෝටර් රථ ණය | **262,224,119** | 252,826,764 |
| | නිවාස ණය | **1,618,376,699** | 1,040,078,373 |
| | ආපදා ණය | **1,142,383,586** | 1,169,490,290 |
| | වෙනත් ණය | **150,560,878** | 207,454,563 |
| | | **3,173,545,282** | 2,669,849,989 |
| | (-) හානිකරණය සඳහා අත්තිකාරම් | **(7,580,887)** | (7,580,887) |
| | | **3,165,964,395** | 2,662,269,102 |
| **14.1** | **ජංගම නොවන මූල්‍ය වත්කම්** | | |
| | මෝටර් රථ ණය | **209,779,296** | 202,261,412 |
| | නිවාස ණය | **1,437,965,043** | 944,150,179 |
